# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2016** පෙබරවාරි **23** වන අඟහරුවාදා
2016 மாசி 23 செவ்வாய்க் கிழமை
Tuesday 23rd February 2016

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை .ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.50 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.50 க்கு சபை கூடியது
*The Provincial Council met at 09.50 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# නිවේදන
## ANNOUNCEMENTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්.ඒ. සුමන්තිරන් මන්ත්‍රීතුමා විසින් 2016 පෙබරවාරි මස 10 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ධීවර හා ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 උ 5 (අ) වන ව්‍යවස්ථාව යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවේ අදහස් ප්‍රකාශ කිරීම සඳහා පාර්ලිමේන්තුවේ මහලේකම් විසින් අංක Bills/66 දරන හා 2016.02.16 දිනැති ලිපිය මගින්, බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් වෙත යොමු කරනු ලැබ, ප්‍රධාන ලේකම් විසින් සභා ලේකම් වෙත 2016.02.17 දින අංක CSO/ADM/125/14/06/01 දරන ලිපිය මගින් එම පනත් කෙටුම්පත අවශ්‍ය කටයුතු සඳහා සභා ලේකම් වෙත යොමු කර තිබෙනවා.*

*2016 මාර්තු මස 17 වන දින හෝ ඊට පෙර පාර්ලිමේන්තුවට මෙම පළාත් සභාවේ අදහස් දන්වා එවන මෙන් ද දැනුම් දී තිබෙනවා. ඊට අවකාශ සැලසෙන පරිදි ඉදිරි කටයුතු කිරීමට මා බලාපොරොත්තු වෙනවා.*

*ii*

*"මෙම පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ලෙස එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ගම්පහ දිස්ත්‍රික් පළාත් සභා මන්ත්‍රී ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමාගේ පත්වීම 2016.02.12 දින සිට ක්‍රියාත්මක වන පරිදි මා විසින් පිළිගනු ලැබූ බව කාරුණිකව දැනුම් දෙනවා.*

*මම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම සන්තෝෂ වෙනවා. ගම්පහ දිස්ත්‍රික්කයට කාලයක් තිස්සේ තිබුණු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ධූරය නැවත සැරයක් ගම්පහ දිස්ත්‍රික්කයටම ලැබීම පිළිබඳව. ඒ වාගේම අභිනව සංවිධායකතුමාට මම සුභ පතනවා. විශේෂයෙන් ඉදිරි කාලය තුළ පළාත් සභාවේ කටයුතුවලදී මමත් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට අවස්ථාව උදාවේවා කියලා එතුමාට සුභ පතනවා.*

# ලිපි ලේඛන පිළිගැන්වීම
## PAPERS PRESENTED

**ගරු ලලිත් වනිගරත්න**(ධීවර, මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Fisheries, Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

ගරු සභාපතිතුමනි, *"පාර්ලිමේන්තුවේ මහලේකම් විසින් බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් වෙත එවනු ලදුව, සභා ලේකම්වරයා වෙත යොමු කරනු ලැබ ඇති, ධීවර හා ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත"* මෙම සභාවට පිළිගන්වනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එම පනත් කෙටුම්පතේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ සභා මේස මත තිබෙනවා. ඒ පිළිබඳව අදහස් 2016.03.17 දිනට ප්‍රථම පාර්ලිමේන්තුවට දන්වා යැවිය යුතු හෙයින්, ඒ නිසා එම පනත් කෙටුම්පත ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කර නිර්දේශ ලබා ගැනීමටත්, ඉදිරි සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී සාකච්ඡා කර මීළඟ සභා රැස්වීම් න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට ඇති හැකියාව සොයා බලා ඒ අනුව කටයුතු කිරීමට බලාපොරොත්තු වන බවත් මම මෙම අවස්ථාවේදී ඔබතුමන්ලාට කාරුණිකව දැනුම් දෙනවා.

# විගණකාධිපති වාර්තාව : 2013
AUDITOR GENERAL'S REPORT : 2013

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩුකාර ලේකම් විසින් අංක 2/1/2/9 හා 2015.09.17 දිනැති ලිපිය මගින් දන්වා ඇති පරිදි විගණකාධිපතිතුමා විසින් 2015.08.31 දිනැතිව ඉදිරිපත් කරනු ලැබූ විස්තරාත්මක වාර්තා සඳහා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය පරිදි මෙම පළාත් සභාවට ඉදිරිපත් කිරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති බව දන්වා තිබෙනවා.

එම වාර්තා අතරින් ශීර්ෂ අංක 107 යටතේ එයට අදාළ වූ 2013 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විස්තරාත්මක වාර්තා මම මෙම සභාවට ඉදිරිපත් කරනවා.

මෙම විගණකාධිපති වාර්තාව කාර්ය පටිපාටි රීති අංක 96(1) හි විධිවිධානවලට අනුව පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කරනවා.

# කාරක සභා වාර්තා
COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2016.02.10 දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම ගරු ඔබතුමන්ලා වෙත පිළිගන්නවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*The Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ. අප නියෝජනය කරන ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය එක්සත් ජාතික පක්ෂය සමඟ ඇති කර ගත් ගිවිසුම අනුව අද, මේ මොහොතේ සිට ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයෙන් පත් වුණු මන්ත්‍රීවරු 09 දෙනාම එක්සත් ජාතික පක්ෂය සමඟ කටයුතු කරනවා. ඒ 09 දෙනාම ඒ මත එක්සත් ජාතික පක්ෂය සමඟ කටයුතු කළ යුතුයි. ඒ අනුව සහයෝගයෙන් කටයුතු කරන බව මම මේ අවස්ථාවේදී ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ කණ්ඩායම් නායකයා වශයෙන් ප්‍රකාශ කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එය ඔබතුමන්ලා 09 දෙනාගේම මතයද? කණ්ඩායමේ මතයද?

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

ඔව්. පත් වුණු 09 දෙනාම. පක්ෂයක් හැටියට අපි එක්සත් ජාතික පක්ෂය එක්ක කටයුතු කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා මෙතැන නැහැ නේද? මට ගැටලුවක් නැහැ. නමුත් උදේ වෙන මතයක් ප්‍රකාශ වුණා.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

ගරු සභාපතිතුමනි, පක්ෂයේ මතය. කණ්ඩායම් නායකයා හැටියට පක්ෂයේ මතය ප්‍රකාශ කරනවා. කවුරු හරි විරුද්ධ කෙනෙක් ඉන්නවා නම්, දැන් කියන්න. නමුත් 09 දෙනාම ඒ අනුවයි කටයුතු කරන්නේ.

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

ගරු සභාපතිතුමනි, මම මේ නිවැරදි කිරීමක් කරන්න හදන්නේ. (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, සභාවේ මේ වගකීම විමසන්න වෙනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Governmentand Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

ගරු සභාපතිතුමනි, දැනටමත් අපට අශෝක ගරු මන්ත්‍රීතුමයි - (බාධා කිරීම්) ඔයගොල්ලෝ කියන්න කෝ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඒ ප්‍රශ්නය හරි.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

ගරු සභාපතිතුමනි, එය හැන්සාඩ් ගත කරන හැටියට ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. එය හැන්සාඩ්ගත කරනවා.

**ගරු කේ.ටී. කුරුසාමි**
Hon. K.T. Kurusamy

ගරු සභාපතිතුමනි, මනෝ ගනේෂන් ගරු ඇමතිතුමාගේ නායකත්වයෙන් තිබෙන අපේ ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුණේත් මෙම උත්තරීතර සභාව නියෝජනය කරන අපිත් එදා පටන් - අද නොවේ. එදා පටන් අපි එක්සත් ජාතික පක්ෂය සමඟ එකමුතුව කටයුතු කරන බවත් මේ අවස්ථාවේදී මම දැනුවත් කරනවා.

# පෙත්සම්
## PETITIONS

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

ගරු සභාපතිතුමනි, හුණුමුල්ල, කැලෑපිටිමුල්ල, වැව්සිරි උයන, අංක 48 හි පදිංචි අනුර පී. මුතුපටින්ගේ යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, අළුබෝමුල්ල, අරුක්ගොඩ, වෙලගහවත්ත, අංක 333 හි පදිංචි එම්. පියසේන පීරිස් යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, අලුබෝමුල්ල, පමුණුගම, තිස්ස මාවත, අංක 72/ ඒ හි පදිංචි බී. ක්‍රිෂ්ණජිත් පෙරේරා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, කඩුවෙල, පහල බෝමිරිය, අංක 227/1 හි පදිංචි ආර්.ඒ. ජිනදාස යන අයගේ පෙත්සම ඉදිරිපත් කරනවා.

**ගරු සුමිත් ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumith Lal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

ගරු සභාපතිතුමනි, කළුතර උතුර, 1 වන පටුමග, පොන්සේකා පාර, අංක 24/27 හි පදිංචි පී. ධම්මික ප්‍රනාන්දු යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, කිරිදිවැල, මිල්ලතේ, කිරිවැලේ වත්ත හි පදිංචි බී.ජී.ඩබ්ලිව්. ජයසිංහ යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petitions Presented, ordered to refer to the Petitions committee.*

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala- Leader of the Opposition

ගරු සභාපතිතුමනි, 2013 වර්ෂයේ විගණකාධිපති වාර්තාව අද අපි අතට පත් වෙලා තිබෙනවා. මම මේ මොහොතේ මේ විගණකාධිපති වාර්තාව ටිකක් කියවද්දි එහි බොහෝ

විෂමතා දකින්නට තිබෙනවා. මේක තුළත් දූෂණයන් සිද්ධ වෙමින් රැවටිලා තිබෙනවා. ඒ නිසා මේ විගණකාධිපති වාර්තාව අපේ පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සාකච්ඡා වෙනවා වාගේම මම හිතන්නේ, මේ පළාත් සභාව තුළත් යම්කිසි වේලාවක් අපි අරගෙන මේ විගණකාධිපති වාර්තාවෙන් පෙන්වලා දීපු කරුණුවල ස්වභාවය, සත්‍යය පිළිබඳව කථා කරන්න අවශ්‍ය අවකාශය ලබා දුන්නොත් මේ පිළිබඳව රාජ්‍ය නිලධාරීන්, මේ සියලු දෙනාම -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එතුමා විවාදයක් ඉල්ලන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala- Leader of the Opposition

ඒක තමයි මේ කියන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒක තිබෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala- Leader of the Opposition

ඒක තමයි මේ දැනුම් දෙන්නේ. ඒක නොකිව්වොත් එහෙම හම්බ වෙන්නේ නැහැ නේ? ඒක තමයි මේ ඉල්ලන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

වෙලාව?

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala- Leader of the Opposition

මේ ඉල්ලන්නේ ඒකයි. පොඩ්ඩක් ඉන්න. තමුන්නාන්සේ අර අධ්‍යක්ෂවරුන්ට දාන පාට් මේකේ මන්ත්‍රීවරුන්ට දාන්න එපා. හරිද? ඒවා දාන්න එපා. ඒවා නිලධාරීන්ට දාන්න. නිලධාරීන් ගොන්නු වාගේ හිටියාට කරන්න දෙයක් නැහැ. රාජ්‍ය නිලධාරීන්ට තර්ජනය කරනවා. ඒවාට මෙහේ එන්න එපා. ඒ නිසා මම කිව්වේ මේ කාරණා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හිතේ අමාරුවෙන් ඉන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala- Leader of the Opposition

ඔව්. මට කරන්න දෙයක් නැහැ. තමුන්නාන්සේගේ හිතේ අමාරුවේ වැඩිකමට. ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමාට ආණ්ඩු පක්ෂයේ සංවිධායකකම දුන්නයි කියලා, මම මොනවා කරන්නද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නියම සුදුස්සෙකුට දීලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපට ඉදිරියේදී අවකාශය ලබා දෙන්නය කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා ඉදිරිපත් කරන ලද එම අදහස් පිළිබඳව අපි සභා කටයුතු කාරක සභාවට එම ප්‍රශ්නය යොමු කරලා මන්ත්‍රීවරු සූදානම් නම්, අපට ඒ පිළිබඳව විවාදයක් කරන්න පුළුවන්. අදහස් ප්‍රකාශ කරන්න අපට කාලයක් දෙන්න පුළුවන්. ප්‍රශ්න ඉදිරිපත් කිරීමේ අවස්ථාව.

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එස්.ඒ.ඩී. ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

සති දෙකකට කල් ගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙවැනි ප්‍රශ්නයත් ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කිරීමට.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ඒකටත් සති දෙකක කාලයක් කල් ඉල්ලනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තුන්වැනි ප්‍රශ්නය, සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා විසින් ධීවර, මාර්ග ගරු අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් වනිගරත්න -** අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, සති දෙකක් කල් ගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හතරවැනි ප්‍රශ්නයත් සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාගෙන් ධීවර ගරු අමාත්‍යතුමාට.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් වනිගරත්න -** අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

සති දෙකක් කල් ගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා විසින් අධ්‍යාපන ගරු ඇමතිතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, කනගාටුවෙන් වුණත් සති දෙකක් කල් ඉල්ලනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හයවැනි ප්‍රශ්නය. එම්.එස්.එම්. ෆයිරෝස් ගරු මන්ත්‍රීතුමා විසින් ඒ ප්‍රශ්නයත් අධ්‍යාපන ගරු ඇමතිතුමාට.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඊළඟ පරිප්පු ලෝඩ් එක ගෙනාවයින් පස්සේ උත්තර දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාත් කල් ඉල්ලනවා. හත්වැනි ප්‍රශ්නය, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන ඇමතිතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

සති දෙකක් කල් ඉල්ලනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

සති දෙකක් කල් දෙනවා.

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඉවසන්න. මට සති දෙකක් දෙනවා නේද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දීලා තිබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඊළඟ එක. අටවැනි ප්‍රශ්නය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ප්‍රශ්නයටත් ඔබතුමා කල් ගත්තාද ගරු ඇමතිතුමා?

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔව්. ඔව්. කල් ගත්තා. ඊළඟ ප්‍රශ්නයටත් සති දෙකක් කල් ඉල්ලනවා. අට වැනි ප්‍රශ්නයට.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒකටත් දෙන්නද?

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

දෙන්න. දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කල් දුන්නා. නව වැනි ප්‍රශ්නයත් ඔබතුමාගේ.

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඊළඟ ප්‍රශ්නයට මේ සති දෙක විතරක්ම කල් දෙන්න. ඊට පස්සේ දික් කරන්නේ නැහැ. උත්තර දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මාව අසනීප කරවන්න හදපු මන්ත්‍රීතුමා තමයි අර ඉන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒ කියන්නේ බස්නාහිර පළාතේ ගුරුවරු විදුහල්පතිවරු, ඔබතුමා පීඩාවට පත් කරනවා. මේ ප්‍රශ්නවල තිබෙන්නේ ඒක. පළමුවැනි ප්‍රශ්නය -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

දැනුයි ප්‍රශ්නය බලන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පළමුවැනි ප්‍රශ්නය තිබෙන්නේ විනය පරීක්ෂණ කියලා කල් ඇද ඇද යනවා. ඒවායෙන් ගුරුවරු පීඩාවට පත් වෙලා තිබෙනවා. ස්ථානමාරු හරහා ගුරුවරු පීඩාවට පත් වෙලා තිබෙනවා.

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මට මේ ප්‍රශ්නයට එතුමාට උත්තර දෙන්න පුළුවන්. අපේ න්‍යාය පත්‍රය තුළ එතුමාට කඩිනම් උත්තරයක් අවශ්‍ය නම්, ඒකට හෙට උදේ හයට මගේ අමාත්‍යාංශය එන්න. මම සූදානමින් ඉන්නවා, ඔබතුමා මුණ ගැහෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම හෙට උදේ හයට එන්න ඕනෑ ඔබතුමා මුණ ගැහෙන්න?

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, රීති සංග්‍රහය අනුව නේ අපි උත්තර දෙන්නේ. මේ රීතියෙන් බැහැරව එතුමාට කැමැති නම් හෙට උදේ හයට මගේ අමාත්‍යාංශයේ ඉන්නවා. එතුමාට සහ එතුමා වෙනුවෙන් තව මන්ත්‍රීවරු එනවා නම් මම ඒ ගැන සාකච්ඡා කරන්න සූදානමින් ඉන්නවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එහෙමනම් මම පෞද්ගලිකව ඔබතුමාගේ දුරකථනයෙන් අහනවා නේ? සභාවේ ප්‍රශ්න කරන්න ඕනෑ නැහැ නේ?

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒකට තමයි මම නිවැරැදි උත්තරයක් දුන්නේ. සති දෙකක් කල් ඉල්ලුවේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි, බොහොම ස්තූතියි.

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

න්‍යායපත්‍රානුකූලව මම සති දෙකක් කල් ඉල්ලුවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. එතුමා දැන් කල් ඉල්ලුවා නේ?

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාගෙන් සපෝර්ට් එකක් ගන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු ඇමතිතුමා, කල් ගන්න ගන්න, මේ පළාතේ ගුරුවරු හා විදුහල්පතිවරු පීඩාවට පත් වෙන්නේ. ඒකයි මම කිව්වේ.

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු මන්ත්‍රීතුමා, මේ ඔබතුමාව අපහසුතාවයට පත් කරන්න නොවෙයි. මේ කාරණාවේ පිළිතුරු සැපයීම පිළිබඳව අපට ප්‍රශ්නයක් ආවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, අපි දිගින් දිගටම යන්න ඕනෑ නැහැ. ප්‍රශ්න පිළිබඳව පුංචි ගැටලුවකුත් තිබෙනවා. ඒ නිසා මම බලාපොරොත්තු වෙනවා ඉදිරියේදී (බාධා කිරීම්) මේ ප්‍රශ්න සභා කටයුතු කාරක සභාවේ සාකච්ඡාවට ගත්තායින් පස්සේ ඒ ප්‍රශ්න හැකි ඉක්මණටම දින කිහිපයක් ඇතුළත අපේ අදාළ ගරු අමාත්‍යතුමාට යොමු කරන්න. එතකොට මම හිතන්නේ, ගරු අමාත්‍යවරුන්ට පහසුවක් වෙනවා, එම ප්‍රශ්නවලට උත්තර සපයා ගන්න. නැත්නම් දැන් මේ ප්‍රශ්නවලට කාලයක් යනවා. සභා කටයුතු කාරක සභාවට ප්‍රශ්නය ආවායින් පස්සේ එහි සාකච්ඡා කරලා, ඒක අරගෙන ඉවර වෙලා න්‍යාය පත්‍රයට දාලා කටයුතු කිරීමේදී කාලයක් යනවා. අපි ගරු ඇමතිතුමාගේ ඉල්ලීම අනුව තීරණය කළා, අපි හැකි ඉක්මණට - සභා කටයුතු කාරක සභාව බදාදා තිබෙන්නේ. අඩු වශයෙන් අපි ඒ සතිය ඇතුළත ප්‍රශ්න අදාළ ගරු ඇමතිතුමාට යොමු කරනවා, ඉක්මණට උත්තර සපයන්න කියලා. ඒ නිසා ඉදිරියේදී ගරු ඇමතිවරුන්ට ප්‍රශ්නවලට කල් ගන්න සිදු වෙන්නේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දහවැනි ප්‍රශ්නය. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින්, ඒ ප්‍රශ්නයත් අධ්‍යාපන ගරු ඇමතිතුමාටමයි.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම උත්තර දෙනවා. සති දෙකක් කල් ඉල්ලනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එකළොස්වැනි ප්‍රශ්නය, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය අහනවා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දොළොස් වැනි ප්‍රශ්නයත් ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඇසීමට ඉදිරිපත් කර ඇති ප්‍රශ්නය.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දහතුන්වන ප්‍රශ්නය, නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන ඇමතිතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම ඒ සඳහාත් බොහොම කාරුණිකව සති දෙකක කාලයක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

ගරු සභාපතිතුමනි, මට හිතෙනවා මේකේ නරක ආදර්ශය ඔබතුමාද දෙන්නේ කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, නැහැ. ඇයි?

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

ඔබතුමාගෙන් ආදර්ශය තිබෙනවා. දැන් අද වුණත් උදේ 9.30 ට ආරම්භ කරන්න තිබුණු සභාව පටන් ගන්න කොට පෙරවරු දහයට දහයයි. ඇත්තටම ඒක ඔබතුමා දෙන්න ඕනෑ ආදර්ශයක්. ඇත්තටම ගරු ඇමතිතුමන්ලාට මොකුත් කියන්නත් බැහැ. ඉතින් මොකක් හරි අපි නොදන්න ප්‍රශ්නයක් තිබෙනවාද දන්නේ නැහැ මේ සභාවේ. මේ හැම දෙයක්ම පස්සට යන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇත්තටම ගරු මන්ත්‍රීතුමා මේකයි වුණේ. ඇත්තටම සමාව ඉල්ලා සිටිනවා. මට ඒ සම්බන්ධයෙන් සමාවෙන්න. හදිසියේ ආණ්ඩු පක්ෂයේ කණ්ඩායම් රැස්වීමක් මගේ නිල කාමරය තුළ පැවැත් වුණා. ගරු ප්‍රධාන ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන්. ඒක නිසා ඇත්තටම මට සභා ගර්භයට එන්න අවස්ථාව ලැබුණේ ඉන් අනතුරුවයි. ඒ සාකච්ඡාව ඒකට හේතුවක් වුණා. අනික් එක ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරු සියලු දෙනාම මගේ නිල කාමරයේ රැස්වීමට සම්බන්ධ වුණා. ඒ සිදු වුණු අතපසුවීම සහ ප්‍රමාදය සම්බන්ධයෙන් මම ඇත්තටම සමාව ඉල්ලා සිටිනවා. ඉස්සරහාට මම ඒක වෙන්න දෙන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

ඔබතුමා එහෙම කියන එක හොඳයි. මොකද, පක්ෂයක් හැටියට ගරු සභාපතිතුමනි, අපට ප්‍රමාද වෙලා එන්න බැහැ. අපි 09.30 ට ඉන්න ඕනෑ. අපේ ප්‍රශ්න තිබෙනවා. අපට එහෙම තීන්දු ගන්න බැහැ. ඔබතුමන්ලාට හැකියාව ලැබිලා තිබෙනවා, ඒ ප්‍රශ්න විසඳගෙන ඉවර වෙලා තමන් කැමති වෙලාවක මේ සභාවට එන්න. ඒක හරි ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ. ඇත්තටම ඒක රීති අනුව, රීති විරෝධීයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා දන්නවා. සාමාන්‍යයෙන් මම පරක්කු වෙලා එන සභාපතිවරයෙක් නොවෙයි. මම පෙ.ව. 08.30 ට මේ සභාවට ආවා. නමුත් මට මේ ප්‍රශ්නය නිසා ඇතුළට එන්න බැරි වුණා. ඉස්සරහාට මම ඒ වැරැද්ද හදා ගන්නවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මම මේ වේලාවේදී වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තව පොඩි කරුණා දෙක තුනක් තිබෙනවා. අපි ඒවාට ගිහිල්ලා එමුද? හදිස්සි නැහැ නේද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හොඳයි. හදිස්සි නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීම. අමාත්‍යාංශ නිවේදන සහ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ අවස්ථාව.

සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට මම දැන් අවස්ථාව දෙන්නම්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම මම මේ මතු කරන්න යන ප්‍රශ්නය මගේ ප්‍රශ්නයක් විතරක් නොවෙයි. මේ මුළු පළාත් සභාවම නියෝජනය කරන ගරු මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්නයක්. අපි දන්නවා, 2016 වසරේ උපමාන පාදක මන්ත්‍රී වැඩ සටහන යටතේ මේ වනකොටත් මුදල් කොමිෂම මගින් අවශ්‍ය උපමාන නිකුත් කරලා තිබෙනවා. ඒ වාගේම මේ කාරණය සම්බන්ධයෙන් මම මීට පෙර, මීට සභා දෙකකට කලින් පැවැති සභාවකදී කරුණු මතු කළා. ඊට පස්සේ ගරු විපක්ෂ නායකතුමාත් මේ කරුණ සම්බන්ධයෙන් පසුගිය සභා වාරයේදී කරුණු මතු කළා. මේකේදී අලුත් වර්ධනීය තත්ත්වයක් තිබෙනවා. මොකක්ද ඒ වර්ධනීය තත්ත්වය? මේ අපි මතු කළ කාරණා සම්බන්ධයෙන් ප්‍රධාන අමාත්‍යවරයා දැක් වූ ස්ථාවරයට පරස්පර මෙන්ම සභාවේ ජනතා නියෝජිතයන් දැරූ මතයට අභියෝග කරන ලිපියක් අපට පසුගිය දවස්වල ලැබුණා. මේකේ දැක්වෙන්නේ, පිළිපැදිය යුතු ක්‍රියාමාර්ග. මේක එවන්නේ කවුද? ජේ.එම්.සී. ජයන්ති විජේතුංග මහත්මිය. 2016.02.09 වැනි දිනැති ලිපිය තමයි එවන්නේ. මේකේ නිරීක්ෂණ මොනවාද? මම මේකේ නිරීක්ෂණ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා දීර්ඝ විස්තරයකට යන්න අවශ්‍ය නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නැහැ, දීර්ඝ විස්තරයක් කරන්නේ නැහැ. ඉතා කෙටියෙන් කියන්න. මට විනාඩි දෙකක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලිපිය සභාගත කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම කියන්න හදන්නේ මේකයි. ගරු සභාපතිතුමනි, අපි දෙන්න ඕනෑ ප්‍රතිපාදන ඔක්කෝම බෙදා දෙන ක්‍රමය සම්පූර්ණයෙන් විකෘති කරලා තිබෙනවා. මේ ඍජු ප්‍රදාන යටතේ සමිතිවලට දෙන්න පුළුවන් ඒවා අවුරුදු පහක් දක්වා ආයේ දෙන්න බැහැයි කියලා තියෙනවා. ඒ වාගේම ප්‍රතිලාභීන් දරන්න ඕනෑ 50% ක්. සමහර ප්‍රතිපාදනවලින්. අපි දෙන කොටසෙන්. දැන් මේකට සංශෝධන අවශ්‍යයි කියලා අපි මේ සභාවේදී මතු කළා. සභාවේදී මතු කරපු වේලාවේදී මට මතකයි, අපේ සුමිත් ලාල් මැන්දිස් ගරු ඇමතිතුමා කිව්වා, මේ පිළිබඳව අපි ගරු ප්‍රධාන අමාත්‍යතුමා සමඟ ආණ්ඩු පක්ෂයේ රැස්වීමේදී කථා කළා. කථා කරලා තීරණයකට එළැඹුණා. ප්‍රධාන ඇමතිතුමා මේකට මැදිහත් වෙලා පක්ෂ දෙකෙන්ම කමිටුවක් පත් කරලා, අපි මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් නැවත තීන්දුවක් ගන්නවා කියලා කිව්වා. මෙහෙම තත්ත්වයක් තිබියදී ඒක නොසළකා හැරලා අපට ප්‍රධාන ලේකම්තුමිය ලිපියක් එවනවා. ගරු සභාපතිතුමනි, මුදල් කොමිසමේ තිබෙන චක්‍රලේඛයේම එක තැනක තිබෙනවා, "සංවර්ධන අවශ්‍යතා මත ප්‍රතිශත සීමා වෙනස් කළ හැකිය. දැන් මේක ප්‍රධාන ලේකම්තුමිය වෙනස් කරන්නේ කොහොමද? අපි දන්නවා, ගමෙන් ගමට, නගරයෙන් නගරයට, පළාතෙන් පළාතට, දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට මේ අවශ්‍යතා වෙනස් වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා කෙටියෙන් අදහස් ප්‍රකාශ කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේවා වෙනස් කරන්න පුළුවන්. ඒ නිසා අපට කරුණාකර කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපි හැමෝගෙම ප්‍රශ්නයක්. අවස්ථාව දෙන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේක වෙනස් කරන්න ඉඩ නොදී මොකක්ද මේ කරන්න හදන්නේ? මේ කාගේ ඕනෑකමටද කරන්න හදන්නේ? ගරු ප්‍රධාන අමාත්‍යතුමා කිව්වා, කමිටුවක් පත් කරනවා කියලා. දැන් මේ එවන ලිපිය මොකක්ද? එතුමියට තිබෙන අයිතිය මොකක්ද මෙහෙම ලිපියක් එවන්න. ජනතා නියෝජිතයන්ට එතුමියට මෙහෙම ලිපියක් එවන්න පුළුවන්ද? එතුමිය එක තැනක මෙන්න මෙහෙම කියනවා. එතුමිය එක තැනක කියනවා, "මේක වෙනස් කරන්න කිසිදු නිලධාරියෙකුට කිසිදු හැකියාවක් නැහැයි කියලා" එහෙම කියන්නේ කොහාමද? අඩුම ගණනේ එහෙම ලිපියක් එවන්න එතුමියට තිබෙන අයිතිය මොකක්ද? අනික් එක අපේ නිර්දේශ මුදල් කොමිෂමට ඉදිරිපත් කළාද? මුදල් කොමිෂමම කියනවා, අවශ්‍යතා මත මේ ප්‍රතිශතම වෙනස් කළ හැකියි කියලා. ඒ නිසා කරුණාකරලා මේක මතක තියා ගන්න. ගරු සභාපතිතුමනි, මම මේ වේලාවේදී ඉල්ලනවා. මේක අපේ වරප්‍රසාද කඩ කිරීමක්. ඒ වාගේම මේක අපේ පළාතේ ජනතාවගේ අයිතිවාසිකම් කඩ කිරීමක්. මේකට ඉඩ දෙන්න බැහැ. ඒ නිසා මම කියනවා. කරුණාකරලා අපේ අයිතිවාසිකම් හැල්ලුවට ලක් කරපු, මේ පළාතේ ජනතාවට නිග්‍රහ කරපු මේ ප්‍රධාන ලේකම්තුමියගේ අත්තනෝමතික ඒකාධිපති ලියවිල්ල කරුණාකරලා ඉල්ලලා අස් කරන්න. ඉල්ලලා අස් කර ගත්තේ නැත්නම් මම දන්නවා, සියලුම ගරු මන්ත්‍රීවරු මේකට අපට උදව් කරනවා කියලා. ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද වරප්‍රසාද ප්‍රශ්නය අපි ඊළඟ සභා කටයුතු කාරක සභාවට යොමු කරලා අපි සාකච්ඡා කරමු.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, මමත් මේ සම්බන්ධයෙන් වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරන්න මගේ දෙපැත්තේ ඉන්න මන්ත්‍රීවරුන් දෙදෙනාගෙනුත් සහයෝගය ඉල්ලුවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ප්‍රශ්නයමද?

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඒ ප්‍රශ්නයම. හැබැයි මම දන්නවා, ජයන්ති විජේතුංග මහත්මිය කාලයක් තිස්සේ මේ පළාත් සභාවේ ඒ අදාළ තනතුරේ සිටියා. නමුත් අපට එහෙම ලියුම් ආවේ නැහැ. ඒ නිසා මම විශ්වාස කරනවා ගරු සභාපතිතුමනි, මේක අදාළ දේශපාලන පාර්ශවයන් ගත යුතු තීන්දුවක්. ජයන්ති විජේතුංග මහත්මියට එවැනි තීන්දු ගන්න බැහැ. ඒ නිසා ඒ දේශපාලන අධිකාරිය විසින් අදාළ නියෝගය ඒ ලේකම්තුමියට නිකුත් කළා නම්, මේකේ කිසි ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, රුපියල් තිස් දාහකින් හට් එකක් අපි දෙන්නේ කොහොමද? කරන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙන්න බැහැ.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

එහෙම දෙන්න බැහැ. ඒ නිසා මේ සම්බන්ධව - ගරු මහ ඇමතිතුමාගේ ස්ථාවරය මොකක්ද කියලා මම දැනගන්න කැමැතියි. අපට ඒක කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමතිතුමා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එතුමා පොරොන්දු වුණා කමිටුවක් පත් කරනවා කියලා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මේක ජයන්ති විජේතුංග මහත්මියගේ ප්‍රශ්නයක් නොවෙයි. මේක මධ්‍යම රජයේ තීන්දුවක්. මම මේක ගිය සභාවේදීත් කිව්වා අපේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ට, අගමැතිතුමාත් එකක් මේක කථා කරන්න කියලා. මේක මහ ඇමතිවරු විතරක් නොවෙයි, ගරු සභාපතිතුමනි. මට මතකයි මේක සම්මේලනයේත් කථා කළා. පාර්ලිමේන්තුවේ ඇමතිවරුන්ටත් ඒ ප්‍රශ්නය තිබෙනවා. මේක මේ උඩ පැනලා කෑ ගහන්න, පළාත් සභාවේ ප්‍රශ්නයක් නොවෙයි. අනික් එක මතක තියාගන්න. ඔබතුමන්ලාට දීලා තිබෙන ලක්ෂ 50 න් රජයෙන් දීලා තිබෙන්නේ, ලක්ෂ 25 යි. ඒකට ඔය කොන්දේසි අදාළයි. පළාත් සභාවෙන් මම දෙන ලක්ෂ 25 ට ඒ කොන්දේසි අදාළ නැහැ. නමුත් අයවැයෙන් එන ලක්ෂ 25 ට ඕක අදාළයි. පැහැදිලි කරගන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එහෙමනම් මේ ලියුමේ පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ. තමන්ට ඕනෑ විධියට ලියුම් එවන්න බැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සේනක මහත්මයා කියනවා, මේක ලක්ෂ 50 ටම අදාළයි කියලා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

මම ලේකම්තුමිය ළඟට ගියා. ඔබතුමාගේ ලක්ෂ 25 න් එහෙම කියලා නැහැ. කෙලින්ම පාරවල්වලට දාන්න කියලා තිබෙන්නේ. ඔබතුමා දැන් කොහොමද කියන්නේ. කෙලින්ම නැහැ. ඔබතුමා දැන් කියන විධිය එතැන නැහැ. ක්‍රියාත්මක නැහැ. එහෙම ලක්ෂ 25 යේ කථාවක් නැහැ. තනිකර චක්‍රලේඛ කථාවක් තිබෙන්නේ. ඔබතුමා තීන්දුවක් දෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අයවැයෙන් එන ලක්ෂ 25 ට ඒ කොන්දේසි අදාළයි. ඒක අපේ දෙයක් නොවෙයි. ඒක මධ්‍යම රජයේ දෙයක්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

මේක සභා සම්මත කරගන්න.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අවුරුද්දේ දෙවැනි මාසය මේ යන්නේ. එතකොට තවම යෝජනා ටික දී ගන්න විධියක් නැතිව අපි ඉන්නවා. අවුරුද්දේ දෙවැනි මාසයත් ඉවර වෙන්න යනවා. යෝජනා ටික දීගන්න බැරිව ඉන්නවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මෙතුමන්ලා බබාලද? යෝජනා දෙන්න මේ අය දන්නේ නැද්ද?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

යෝජනා දෙන්න දන්නවා තමයි. මේ තිබෙන නිර්ණායකයන්වලට දෙන්න බැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මෙතුමා ප්‍රාදේශීය සභාවක හිටපු සභාපති කෙනෙක්. ඒක දන්නේ නැද්ද සභාපතිතුමා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒක වෙනම කතන්දරයක්. මේ තිබෙන නිර්ණායකයන්වලට දෙන්න බැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

මෙතුමන්ලා ගිහිල්ලා කෑ ගහන්න ඕනෑ මෙතුමන්ලාගේ නායකයන්ට.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, -

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

අපටත් ජනාධිපතිතුමා කියන්නේ අගමැතිතුමාත් එක්ක කථා කරගන්න කියලා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

අගමැතිතුමාට ඉහළින් නේ ජනාධිපතිතුමා ඉන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මේ මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම පිළිබඳව වරප්‍රසාද ප්‍රශ්නයක්, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. ගරු මන්ත්‍රීතුමා කථා කරනවා. මෙතුමාට අවස්ථාව දෙන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, මේ මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම පිළිබඳව එවලා තිබෙන චක්‍රලේඛයට විසඳුමක් ගන්න ක්‍රමයක් තිබෙනවා. ඒ ක්‍රමය තමයි ඔබතුමා මේ ගෙනාපු යෝජනාවට සභාවේ එකඟතාවය ගන්න. සභාවේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ. එකඟතාවය අරගෙන කැබිනට් එකට දාලා ඒ අනුමැතිය ගන්න. එතකොට මේක විසඳගන්න පුළුවන්. නැත්නම් මේක අපි කථා කර කර, කථා කර කර ඉන්න එකේ තේරුමක් නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

මධ්‍යම රජයේ ප්‍රතිපාදනවලට අපේ කැබිනට් එකට තීන්දු ගන්න බැහැ. අපේ යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කියනවා වාගේ අපේ ලක්ෂ 25 ට තීන්දුවක් ගන්න පුළුවන්. අපේ ලක්ෂ 25 ට-

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔබතුමා තීන්දුවක් අරගෙන -

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

අරකට ගන්න බැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

සභාවේ කැමැත්ත අරගෙන ඒක කැබිනට් එකට දාලා අනුමත කරගන්න.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

උපදේශකතුමා ඉන්න කෝ. ඔබතුමා කියන්නේ අපේ ලක්ෂ 25 ටත් පහර වැදිලා කියලා නේ? ඒකට අපේ කැබිනට් තීන්දුවක් ගන්න පුළුවන්. අරකට අපට කරන්න බැහැ. ඒක ඔබතුමා අගමැතිතුමාත් එක්ක කථා කරන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

සභාවේ සම්මතයක් අරගෙන ඔබතුමන්ලා කැබිනට් එකට දාලා අනුමත කර ගන්න.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ඒක පුළුවන්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පළාත් සභාවේ අනුමැතියක් දා ගන්න. අපේ මුදල් බලය තිබෙනවා නේ?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අපේ ගරු මහ ඇමතිතුමා කිව්වා වාගේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙමනම් අපේ ගරු සභා කටයුතු ඇමතිතුමා ඉන්නවා.

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

විනාඩියක් දෙන්න. අත්දැකීමෙන් අපි මේ කියන්නේ. සමහර නිර්ණායකයන් තිබෙනවා. අවුරුදු 04 කින් දෙන්න. පහකින් දෙන්න බැහැ. මේ වාගේ තහංචි පනවන්නේ නැතිව මේ මන්ත්‍රීවරුන්ට ඉඩ දෙන්න ඕනෑ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

ඒක තමයි මම කිව්වේ, සභාවේ කැමැත්ත අරන් -

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

සභාවේ කැමැත්ත අහන්න ඔබතුමාට වෙලාවක් ගත වෙනවා. ඒකට සාකච්ඡාවක් කැඳවන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

යෝජනාවක් ඉදිරිපත් කරලා, සම්මත කරගන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මම සැලසුම් අධ්‍යක්ෂතුමිය හම්බ වුණා. එතකොට මහ ඇමතිතුමාගේ ඒ ක්‍රියාදාමයේ වචනයක්වත් කියැවෙන්නේ නැහැ. එහෙම නීතියක් නැහැයි කිව්වා. අද මේ තීන්දුව අරගන්න. අද ඔබතුමා තීන්දුවක් අරගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

යෝජනාවක් දාලා සම්මත කරගන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒක අපි කරපු හැටි කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ කරුණාකර වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මේක අපි ඔක්කොටම බලපානවා. අපිත් කැබිනට් එකේ හිටියා නේ? එතකොට මේ ප්‍රශ්නය අපටත් ආව නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. දැන් කට්ටිය කිව්වා නේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා ඒ අදහස ප්‍රකාශ කළා. අනික් මන්ත්‍රීවරු කිව්වා වාගේ, මේක ගරු සභාපතිතුමා ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් මුදල් කොමිෂම කැඳවන්න. විපක්ෂයේයි, අපේ කණ්ඩායමයි, අනික් පක්ෂවල නායකයන්ව කැඳවන්න. කලින් මේ නීතිය ආවාම මුදල් කොමිෂම කැඳවලා කැබිනට් එකේ ඇමතිවරුත් එක්ක වාඩි වෙලා ඒ පක්ෂ නායකයන් එක්ක කථා කරලා අපට සංශෝධන කරන්න ඉඩ දුන්නා. මේක මහජන අයිතියක්. ඡන්දයෙන් පත් වෙලා එන මහජන නියෝජිතයන්ට දෙන ලක්ෂ 25 හරි, 30 හරි, 50 හරි දෙන්න පුළුවන්. මේක මහජනයා Tax ගෙවන සල්ලි. රටේ බදු සල්ලි. මේක මුදල් කොමිෂමේවත්, ගරු මහ ඇමතිතුමාගේවත්, මේ ඇමති මණ්ඩලයේවත්, අපි කාගේවත් සල්ලි නොවෙයි. ඒක නිසා මුදල් කොමිෂමෙන් ඔය විධියටම කලිනුත් මේ චක්‍රලේඛ සියල්ලක්ම ආවා. මේ චක්‍රලේඛ අභිබවා එදා හිටපු මහ ඇමතිවරු, ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමා, රෙජිනෝල්ඩ් කුරේ මහ ඇමතිතුමා, සුසිල් ප්‍රේමජයන්ත මහ ඇමතිතුමා ඒ සියලු දෙනාම කථා කරලා මේ ප්‍රශ්නය -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

චන්ද්‍රිකා මැතිනිය -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ප්‍රතිපාදන මහජනයාට වියදම් කරන ආකාරය.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඉසුරු ගරු මහ ඇමතිතුමාත් කරයි. හය වෙන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය යනවා. 10.30 යි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දෙන්න පුළුවන්ද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමා, ඕක මුදල් කමිටුවට යොමු කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තමුන්නාන්සේලා රුපියල් 20000 ක් දුන්නාම කළු ලැල්ලකුයි බංකු 05 කුයි ගත්තාම රුපියල් 20000 ඉවරයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි, ගරු මන්ත්‍රීතුමා. පැහැදිලියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැහැදිලියි. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ සභාව ගෙනි යන්නෙත් මහජනයාගේ සල්ලි වලින්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැහැදිලියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමාගේ ප්‍රධානවත්වයෙන් අපවත් කැඳවන්න, ඒ දීපු තීරණ වෙනස් කරන්න අපි ඒක ගේන්නම්.

**ගරු සුමිත් ලාල් මැන්දිස්-**අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis- Minister

ගරු සභාපතිතුමනි, දැන් මේ උපමාන පාදක -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු විපක්ෂ නායකතුමයි, අපි එකඟ වෙනවා, මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා තීන්දුවක් ගන්න. අපි ඒක ගන්නම් කෝ. අපේ කණ්ඩායම් නායකයෝයි, ගරු විපක්ෂ නායකතුමායි ගිහිල්ලා ගන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

දැන් හරි ගරු සභාපතිතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මුදල් කොමිෂමේ චක්‍රලේඛ සම්බන්ධව ගරු මන්ත්‍රීතුමන්ලා රාශියක් අදහස් ප්‍රකාශ කළා. මමත් ඒක පිළිගන්නවා. මගේ මතය මම ප්‍රකාශ කරන්නම්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි,-

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කරුණාකර වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එක දවසක් මෙතැනදී උපවාසයක් කරමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. දැන් මන්ත්‍රීවරු රාශියක් අදහස් ප්‍රකාශ කර සිටියා. මේ යෝජනාව සම්බන්ධයෙන් අපට ක්‍රම දෙකක් තිබෙනවා. අපට පුළුවන්, ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ගරු අමාත්‍ය මණ්ඩලය, ගරු විපක්ෂ නායකතුමා එකඟ නම් සභාව මේ මොහොතේදීම විනාඩි 10 කට කල් තබලා අපි තීන්දුවක් ගනිමු. අපට යෝජනාවක් සම්මත කර ගන්න පුළුවන්. එහෙම නැත්නම් අපට පුළුවන් වෙනවා, හෙට තිබෙන සභා කටයුතු කාරක සභාවට මේ යෝජනාව ඉදිරිපත් කරලා -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, -

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

අද තීන්දුවක් ගනිමු.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

කියන්න කෝ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

අද තීන්දුවක් ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොදුවේ. මට තනියෙන් ඒක කරන්න බැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මේක කියනවාට සමාවෙන්න. ඔබතුමාගේ ප්‍රධානත්වයකින් කමිටුවක් කැඳවන්න. මේ වාගේ කාරණාවලට විනාඩි 10 න් සාකච්ඡා තියලා තීන්දු ගන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මෙහෙමයි. මම බැහැලා ගිහිල්ලා කමිටුව රැස් වුණත් ඒත් එකයි. මේකත් එකයි. අපි හෙට ගනිමු නේද?

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

සභාව විනාඩි 10 කට කල් තබලා තීරණයක් ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා විනාඩි 10 කට කල් තබලා -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

දැන් කිත්සිරි ගරු මන්ත්‍රීතුමාත් කථා කළා. මේක දන්නවා. ලක්ෂ්මන් ගරු මන්ත්‍රීතුමාත්, ඉන්දික මන්ත්‍රීතුමාත් එකඟ වුණා. මේ සම්බන්ධයෙන් මෙතැන සභාවේ තීන්දුවක් ගන්න බැහැ. අපි කණ්ඩායම් නායකයන් ටික කථා කරලා තීන්දුවක් අරගෙන අමාත්‍ය මණ්ඩලයේ එකඟතාවය අරගෙන ඒක කරමු, ගරු සභාපතිතුමා. මේක අපටත් බලපානවා නේ? මහ ඇමතිතුමාටත් ලක්ෂ 50 ක් තිබෙනවා නේ? මටත් තිබෙනවා. ඒක මම මේ නායකයොත් එක්ක කර ගන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා රීති අනුව අපි හෙට සභා කටයුතු කාරක සභාවට යොමු කරමු.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

ඔබතුමා මේකට ඉඩ දෙන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපට කොහොමත් එන්න බැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එකඟතාවය තිබෙනවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා අපට එහෙම ගෙනෙන්නත් බැහැ. හෙට සභා කටයුතු කාරක සභාවට අපි මේක යොමු කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

සභා කටයුතු එකට දාන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දාන්න ඕනෑ. මම හිතන්නේ යෝජනාවක් වශයෙන් ගෙනෙන්න ඕනෑ. මොන දේ කළත් එහෙම කරන්න බැහැ. අපි එහෙම කරමු.

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන සභා කටයුතු කාරක සභාවට යොමු කරන්න. එතැනදී සාකච්ඡා කරලා තීන්දුව දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. අපි එහෙම කරමු.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මේක මම ගිය සභාවේදීත් මතු කළා. කළුතර දිස්ත්‍රික්කයේ වෙන දෙයක් තමයි, මේ සම්බන්ධීකරණ කමිටු හරියටම පළාත් සභා රැස්වීම දවසට දානවා. දැන් අදත් පානදුරේත්, හොරණත් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් දාලා. පළාත් සභා මන්ත්‍රීවරුන්ට ඒ සම්බන්ධීකරණ කමිටුවලට සම්බන්ධ වෙන්න බැහැ. ගිය මාසයෙත් මේක වුණා. දැන් මේ මාසයේත් ඒක ඒ විධියමට කරලා තිබෙනවා, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමතිතුමා, ගරු මන්ත්‍රීතුමන්ලාට පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. පළාත් සභා රැස්වීම් පැවැත්වෙන දවසටම තමයි සමහර ආසනවල සම්බන්ධීකරණ රැස්වීම් පවත්වන්නේ. එම දිනයටමයි. එම නිසා පළාත් සභා මන්ත්‍රීවරුන්ට යන්න අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා ඔබතුමා ප්‍රධාන අමාත්‍යතුමා වශයෙන් ඉදිරියේදී මේ සම්බන්ධයෙන් දිසාපතිතුමාත් එක්ක සාකච්ඡා කරලා - කමිටුවේ සම සභාපතිවරයා වශයෙන් ඔබතුමාට බලයක් තිබෙනවා. කථා කරලා දිනය පොඩ්ඩක් වෙනස් කරලා දාගන්න.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, දිසාපතිවරු තුන් දෙනාව අපි දැනුවත් කරන්නම්.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, ඒකත් එක්කම පොඩි වරප්‍රසාද ප්‍රශ්නයක්. මම ඉල්ලා සිටිනවා. මේකත් එක්කම තිබෙන ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් සමාවෙන්න. මට ඉස්සෙල්ලා පෙණුනේ මෙතුමා. ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මොකක්ද ඔබතුමා කථා කරන්නේ? ඔබතුමා කථා කරන කාරණාව මට කියන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ගරු සභාපතිතුමනි, මේ වන විට මේ සභාවේ හැමෝමත්, බොහෝ දෙනෙකුත් දන්නවා. පසුගිය 18 වැනිදා රාත්‍රියේ සහ 19 වැනිදා අලුයම යම් මැර පිරිසක් මගේ නිවසට තාප්පයෙන් ඇතුල් වෙලා, මගේ වාහන දෙකකට අලාභහානි සිද්ධ කරලා පළා ගොස් තිබෙනවා. මේ සිද්ධිය සම්බන්ධව අද වන කොට යම්

විධියකට මාධ්‍ය තුළිනුත් ආරංචියි. ඔබතුමන්ලා දන්නවා. මේ සිද්ධියේදී මගේ වරප්‍රසාද කඩ වුණා කියන කාරණාව මතු කරන්නේ, මම බොහොම ගම් මට්ටමින්, බිම් මට්ටමින් පවුල් බලයකින් තොරව දේශපාලනයට ඇවිල්ලා මේ තැනට පැමිණි කෙනෙක්. මේ ගමන් මගේ කිසිම පෞද්ගලික හතුරෙක්, දේශපාලනිකව යූ.ඇන්.පී., ශ්‍රී ලංකා, ජේ.වී.පී. වශයෙන්වත් හිටියේ නැහැයි කියලා මම හිතන්නේ. දේශපාලනිකව ඇති වුණු යම් යම් මතවාදයන් එක්ක අපි විශ්වාස කරනවා, යම් අය අප කරන කාර්යයන් ඔවුන්ට තර්ජනයක් සේ සලකනවා කියලා. ඒ තත්ත්වය තුළ එදා නිවසට, වාහනවලට ගහන්නම එච්චාද? එහෙම නැත්නම් අපව එළියට අරගෙන ගහලා හෝ වෙනත් සිදුවීමකට ලක් කරන්න එච්චාද? එහෙම නැත්නම් මේ සිද්ධිය තුළ ඔවුන්ට අවශ්‍ය වුණේ අපව භය කරන්නද කියන කාරණාව නොවෙයි මට වැදගත් වෙන්නේ. වාහන කැඩුණාට. නිවසට හානි වුණාට. වෙන දෙයක් වුණාට මට ප්‍රශ්නයක් නැහැ අපට පුංචි හරි හුස්ම ගන්න ඉඩක් තිබෙනවා නම්, ජීවත් වෙනවා නම් ඉන් පස්සේ නැවතත් - මම යම් අරමුණක්, ප්‍රතිපත්තියක් වෙනුවෙන් පෙනී සිටියා නම් ඒ කාර්යය මම අඛණ්ඩව කරගෙන ඇවිල්ලා තිබෙනවා. ඉදිරියටත් ඒක ඒ විධියටම කරනවා. අද වන කොට මේ සභාවේ සමහර මන්ත්‍රීවරු සාක්ෂි සපයනවා. මම දන්නේ නැහැ ඇයි කියලා. එතුමන්ලාට කිව්වාද? දන්නවාද? දන්නේ නැහැ. විවිධ අයගේ නම් ගම් කියනවා. ඉතින් ඔබතුමන්ලා එහෙම දන්නවා නම් ඉදිරියේදී පොලීසියට කියන්න. මොකද මම සැබවින්ම දන්නේ නැහැ, මේ ගහපු පුද්ගලයා හරියට.

ඒ එක්කම මට තර්ජනයක් තිබෙන පාර්ශව කිහිපයක් තිබෙන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා. මේ වන විට අපි මේ ආණ්ඩුවේ අඩුපාඩු ප්‍රසිද්ධියේ ඒකාබද්ධ විපක්ෂයත් එක්ක එකතු වෙලා, රට බේරපු නායකයා මහින්ද රාජපක්ෂ මහත්මයා එක්ක එකතු වෙලා කටයුතු කරනවා. ඒ වාගේම සමෘද්ධි ව්‍යාපාරය ඇතුළේ වෘත්තීය සමිති නායකයෙක් විධියට වසර 18 කට වැඩි කාලයක් අඛණ්ඩව සෑම ආණ්ඩුවකම අඩුපාඩු පෙන්වලා දීලා, වැරැදි අඩුපාඩු වෙනුවෙන් - ඒ සිද්ධිය වුණු පාන්දරත් මම රත්නපුරේ යන්න ලැහැස්ති වෙමින් සිටියේ. රත්නපුර උද්ඝෝෂණයක් කරන්න. ඒ නිසා ඒ කාර්ය භාරය අපි අඛණ්ඩව කරනවා. මොන ආණ්ඩුවද? මොන ජනාධිපතිතුමාද? කියලා බලන්නේ නැතිව.

ඒ වාගේම අපේ ප්‍රදේශයන්වල ඇති වන වෙනත් ගැටලුවලදී එහිදීත් අපි යම් ප්‍රශ්න මතු කරලා හඬ නඟලා තිබෙනවා. ආසන්න වශයෙන් කඩුවෙල මහ නගර සභාවේ හිටපු නගරාධිපතිතුමාගේ නිවසේ, සභාවේ නිලධාරීන් වැඩ කරනවා කියලා ප්‍රශ්න තිබෙන නිසා ඒවාත් අපි ඉදිරිපත් කරලා තිබෙනවා. මම මේ කාටවත් ඇඟිල්ල දික් කරනවා නොවෙයි. බලෙන් තොප්පි දා ගන්නත් සමහරු හදනවා. හැබැයි මම පැහැදිලිව හිතන්නේ, නීතිය තුළින්, අධිකරණයක් තුළින් සැබෑ වැරැදිකරු, අපරාධකාරයා අල්ලනවා මිස අපි මේ පුංචි කෙනෙකුට, වැදගත් නැති මිනිහෙකුට ඇඟිල්ල දික් කිරීම තුළ සමහරවිට බරපතළ අපරාධයක් කරන්න ආපු මිනිහා හැංගෙන්න පුළුවන්. මොකද, සමාජයේ මතයක් තිබෙනවා. අදහසක් තිබෙනවා. ඉතිහාසය තුළ මහා විශාල ලෙස මිනී මැරුම් කරපු මිනිහත් පසු වැනිදා උදේ ඇවිල්ලා මල් වඩම් තියලා ශෝකය ප්‍රකාශ කළා. නැවත එහෙම කරන්න පුළුවන්.

ඒ වාගේම අනික් අතට අපරාධයක් කරපු කෙනා, මිනීමරුවා තමන් බන්ධනාගාර ගත වෙන්නේ නැතිව පුංචි කුඩුකාරයෙක්, පොඩි ගංජකාරයෙක්, පොඩි අපරාධකාරයෙක් දාලා බේරෙන්න පුළුවන්. ඉතින් මේ දවස්වල කඩුවෙල හිටපු නගරාධිපතිතුමා මගේ සිද්ධියත් එක්ක විවිධ චරිත රඟපාන්න හදනවා. ඒ නිසයි මම මේ නම කියලා කියන්නේ. ඒ අර අපරාධකාරයා වහගන්න වෙනත් ක්‍රමවේද ඇති කරන්න උත්සාහ කරනවාද? සැබෑ අපරාධකාරයා එතුමාද කියලා මම දන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, නමුත් මේ සිද්ධියත් එක්ක මහජන නියෝජිතයෙක් විධියට අපට කවුරුවත් පාවිච්චි කරන්න, ආයුධ දීලා නැහැ. ඒ වාගේම අපි ආයුධ ඉල්ලලාත් නැහැ. අවි ගත්තෝ අවියෙන් නැසෙනවා කියලා අපේ ධර්මයේ තිබෙන නිසා. ඒ නිසා අපේ දේශපාලන ජීවිත කාලපරිච්ඡේදය තුළ ආයුධ පාවිච්චි කරලා නැහැ. ඉදිරියටත් එහෙම ඉල්ලන්න බලාපොරොත්තුවක් නැහැ. නමුත් මහජන නියෝජිතයන් විධියට මට විතරක් නොවෙයි, හෙට මේ ජයනාත් ගරු මන්ත්‍රීතුමාට වෙන්න පුළුවන්. සුනිල් ජයමිණි ගරු සභා නායකතුමාට වෙන්න පුළුවන්. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට වෙන්න පුළුවන්. වෙන කෙනෙකුට වෙන්න පුළුවන්. තමන්ගේ මතයට හිස නමන්නේ නැත්නම්, විරුද්ධ මත දරන අය මර්දනය කරන්න ඒ අය පාවිච්චි කරන්නේ යම් විධියකට තර්ජනය සහ මර්දනකාරී වැඩ පිළිවෙළක් කියන එක තමයි මේකෙන් පැහැදිලි කරලා තිබෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි,

[ගරු ජගත් කුමාර]

මහජන නියෝජිතයන් විධියට අපේ ආරක්ෂාව පිළිබඳව යම් සැලකිල්ලකට ලක් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම මේ සිද්ධියෙන් පස්සේ කියන්න ඕනෑ. පොලිසිය සිද්ධිය වේලාවේ ආවා. බොහොම ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අපේ ගරු ප්‍රධාන ඇමතිතුමා ඇතුළු අපේ පළාත් අමාත්‍යවරු සොයා බැලුවා. මගේ නායකයා මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු - මම ඒක කියන්නේ, දැන් පක්ෂයේ නායකයෙක් ඉන්නවා නම් සොයා බලන්න ඕනෑ නේ? මට මොකද වුණේ කියලා පක්ෂයේ නායකයන් සොයා බැලුවේ නැහැ. නමුත් මම ගරු කරන රටේ නායකයා මහින්ද රාජපක්ෂ මැතිතුමා මගේ නිවසට ඇවිල්ලා මොකද වුණේ කියලා සොයා බැලුවා. අපිත් එක්ක ඉන්න අය සොයා බැලුවා. ඒ නිසා ඒ හැමෝටම මගේ ගෞරවයත් - දුකකට පත් වුණාම, ප්‍රශ්නයක් ආපුවාම, සමහරු ඒකත් විවේචනය කළා. මහින්ද රාජපක්ෂ මැතිතුමා ආවා කියලා. ඒ තමයි එතුමාගේ ජනතාවාදී බව. මිනිස්සුන්ට තිබෙන ආදරය. තමන්ගේ කෙනෙකුට සිද්ධියක් වුණොත් එන එක. ඒ පිළිබඳව එතුමන්ලාට සහ මේ සභාවේ සොයා බලපු, දුක ප්‍රකාශ කරපු, කනගාටුව ප්‍රකාශ කරපු අයට මම මගේ ගෞරවය ප්‍රණාමය ස්තුතිය පිරිනමනවා. ඒ වාගේම මේ සිද්ධියෙන් අපරාධකරයාව, යම් කෙනෙකුට ඉලක්ක කරලා විතරක් සැබෑ අපරාධකාරයා වහන් වෙන්න ඉඩ දෙන්න එපා. සමහර විට මේකට සැබෑ විධියට මැදිහත් වුණේ - එකක් මේකට යහපාලන ආණ්ඩුවේ අයට වගකීමෙන් මිදෙන්න බැහැ. දැන් අපට කිව්වේ, නිදහසේ නිදා ගන්න දෙනවා. නිදහසේ ජීවත් වෙන්න දෙනවා. නිදහසේ ඉන්න දෙනවා කියලා. හැබැයි මහජන නියෝජිතයෙක් විධියට අපට නිදහසේ ගෙදර ඉන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා නම්, එහෙමනම් ඒකකට යම්කිසි විධියකට සොයලා බලලා, අපරාධකරුවා ඇල්ලීමේ වගකීම ආණ්ඩුවට තිබෙනවා. ඒ නිසා ආණ්ඩුවට අපි ඒ වගකීමත් කියන ගමන් ගරු සභාපතිතුමනි, මෙහිදී පැහැදිලිවම පොලිසිය තවමත් - ඔබතුමා මගින් ගරු ප්‍රධාන ඇමතිතුමා මගින් මම මේ කාරණාව පොලිස්පතිතුමාටත් යොමු කරනවා, ඒ සම්බන්ධව කටයුතු කරන්නය කියලා ඉල්ලනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා අවසන් කරන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

පොලීසිය තවම ඇවිල්ලා බලලා ගියා විතරයි. තොරතුරු ගත්තා විතරයි. පොලිසිය මුලින් මැදිහත් වුණු බව අපට පෙනෙනවා. පොලිසිය මුලින් සාධාරණව හැසිරුණා. හැබැයි අද වන කොට මේකේ යටි සම්බන්ධතා ගැන දැන ගෙනද - මේකට ආණ්ඩුව සම්බන්ධද? වෙනත් පාර්ශවයක් සම්බන්ධද? ඒ නිසා පොලිසිය නිහඬ කරලාද කියලා දන්නේ නැහැ. අද වන කොට පොලිසිය කිසි උත්තරයක් දෙන්නේ නැහැ. අඩුම ගණනේ රට ඇවිල්ලා බලලා පරීක්ෂණයක් කරන තත්ත්වයක්, දැනටවත් ආරක්ෂාවක් සම්බන්ධවවත් කටයුතු කරන්නේ නැහැ. අපව මරලා දාලා යනතුරු මේ රජය, මේ පවතින නීතිය හැසිරෙනවාද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා ඒ සම්බන්ධව මේ රටේ වගකිවයුතු සියලු දෙනාගේ අවධානය යොමු කරන්නත් කියලා ඉල්ලමින් විශේෂයෙන්ම කඩුවෙල නගර සභාවේ හිටපු නගරාධිපතිතුමා කියපු ප්‍රකාශයකටත් උත්තරයක් දීලා - මොකද මේ සිද්ධිය සම්බන්ධව සැබෑ විධියටම මම පොල් ගහනවා. මම හරියටම පොල් ගහනවා.

දැන් ඊයේ පෙරෙයිදා සමහරු කියන්න උත්සාහ කළා, අපි ගහපු පොල් සම්බන්ධව වෙන වෙන සිද්ධි. පොදු කාරණා. හැබැයි, මේ සිද්ධියට බඳුන් වුණු කෙනෙක් විධියට මට ඡන්දයක් හදිසියේ නැහැ. මට හදිස්සියේ ජනප්‍රිය වෙන්න ඕනෑ නැහැ. ගරු මන්ත්‍රීතුමන්ලා දන්නවා. මේ සිද්ධිය අප විසින් කර ගන්නවත්, එහෙම නැත්නම් අපි දැනුවත්ව වුණු එකක්වත් නොවෙයි. නමුත් සමහරු අර වැටට ඉස්සෙල්ලා කෙහෙල්කැන පනිනවා වාගේ උත්සාහයනුත් දරනවා. පුහුල් හොරා කරෙන් දැනෙනවා වාගේ හිතෙනවා, ඒ වාගේ දේවල් කියන කොට. ඒ නිසා පැහැදිලිවම අපට විරුද්ධව මේ සිද්ධිය සම්බන්ධව පට්ටපල් බොරු කියමින් මාධ්‍ය සංදර්ශන තියන්න හදන එතුමාට අපි කියනවා. ඒ කටට හෙණ ගහන්න ඕනෑ. අපි එහෙම වරදක් කළා නම් මට හෙණ ගහන්න ඕනෑ. එහෙම නැත්නම් එතුමාට හෙණ ගහන්න ඕනෑය කියලා මම පැහැදිලිවම කියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා බොහොම ස්තුතියි. න්‍යාය පත්‍රානුකූලව මීළඟට තිබෙන්නේ -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. අද දින -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

ඔබතුමා ඉඳගන්න. ඔබතුමාට ගැහුවේ නැහැ නේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මට අද දින උදේ 10.00 ට FCID එකෙන් එන්න කියලා තිබෙනවා, ප්‍රකාශයක් ලබා ගන්න. අද පළාත් සභා දිනයේ තමයි FCID යට එන්න කියලා තිබෙන්නේ. FCID යට එන්න කියලා තිබෙන්නේ, 2011 ජාත්‍යන්තර සමූපකාර දිනය කුරුණෑගල පැවැත් වුණා. එදින ඒ වකවානුවේ හිටපු පළාත් ඇමතිවරයා හැටියට මම ඒකට සහභාගි වුණ නිසාය කියලා තමයි මේකට සාක්ෂියක් ගන්නයි. දැන් මේ බලන්න, අපිට වරප්‍රසාදයක් තිබෙනවා. අපි මහජන ඡන්දයෙන් පත් වුණු මන්ත්‍රීවරු. මහජන ඡන්දයෙන් පත් වෙලා පළාතකට වැඩ කරපු ඇමතිවරු හැටියට මේ සමූපකාර දිනය, ජාත්‍යන්තර සමූපකාර දිනයට එදා ඇමතිවරයා හැටියට සහභාගි වුණාය කියලා මට අද එන්න කියලා තිබෙනවා. පළාත් සභා දිනයේදී. මේකට උත්තරයක් ගන්නය කියලා. අද පළාත් සභා දිනයට සහභාගි නොවුණා නම් පළාත් සභාවේ අපේ ප්‍රශ්නයක් - එතකොට පළාත් සභා දිනයට අපව කැඳවලා අපි නොගියාම කූඩුවට දානවා. ඉතින් මේ කරුණු මීට පෙරත් සභාපතිතුමාට කියලා පොලිස්පතිවරයාව දැනුවත් කරලා, මේ පළාත් සභා දිනවලට කැඳවන්න එපා කියන එකත්, පළාත් සභා මන්ත්‍රීවරයෙක්ව ඇමතිවරයෙක්ව, මෙහෙම කැඳවනවා නම් ඔබතුමාවත් දැනුවත් කරන්නය කියලා අපි ප්‍රකාශ කරනවා. දැන් සභාවේ නායකයා ඔබතුමා. සභාවේ සභාපතිතුමා තමයි සභාවේ නායකයා හැටියට කටයුතු කරන්නේ. මේ 104 දෙනාගේම. එතකොට ඔබතුමාව දැනුවත් නොකර අපව ගෙන ගියාම - මේ කිසිම වරදක් කරපු දෙයක් නිසා නොවෙයි නේ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මෙතුමාට FCID එන්නේ මෙතුමා හොර වැඩ කරපු නිසා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි -

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ජෝර්ජ් සංවිධායකතුමා, මොකද කියලා යන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා පිස්සු බලු බෙහෙත් ගහලා ඇවිල්ලා ඉන්නේ. එතුමාට ඉන්න බැහැ. කිරි පණුගාය තිබෙනවා, පිටිපස්සේ. වෛද්‍යවරයෙකුට පෙන්නලා, මොළේ පරීක්ෂා කරලා, කිරි පණු ගායට බෙහෙත් දීලා එතුමාව වාඩි කරවන්න. මේ නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපේ හිටපු ගරු ඇමතිතුමා ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් ඉල්ලන්නේ. අපට මෙහෙම දිගටම - දැන් ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමාට පෙරේදා සිද්ධියක් වුණා. මට ආපහු වුණා. ඉතින් මේ වාගේ අනික් මන්ත්‍රීවරුන්ටත් මේකට යන්න වෙයි. හිටපු ඇමතිවරුන්ට. මේක කොඩිකාරට විතරක් නොවෙයි. මේකේ තවත් ඇමතිවරු සිටියා. අපේ ප්‍රසන්න රණතුංග ගරු ඇමතිතුමාට තිබුණා. ඔබතුමා මේ සභාවේ සභාපතිවරයා හැටියට පොලිස්පතිවරයාව දැනුවත් කරලා මෙවැනි පරීක්ෂණයක් තිබෙනවා නම්, මෙවැනි කැඳවීමක් තිබෙනවා නම් ඔබතුමාව දැනුවත් කරලා අපව ගෙන්වා ගන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, හරි. පැහැදිලියි. වාඩි වෙන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

රටේ සාමාන්‍ය නීතිය වෙනස් කරන්න බැහැ නේ ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. කාලය ගොඩක් ගියා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. මම මීට කලිනුත් මේ සභාවේ කථා කරලා තිබෙනවා. අපි සියලුම ගරු මන්ත්‍රීවරුන්ට බලපාන ප්‍රශ්නයක්. අපි කොපමණ කථා කළත් අපට තවම බැරි වුණා, පළාත් සභාවේ ආයතන ටිකේවත් නිලධාරීන්ව මේ බදදා රැස්වීම්වලට යන එක නවත්වා ගන්න. බදදා ඒ තමන්ගේ සීට්වල ඉන්න එක නවත්ත ගන්න. ඒ නිසා ගරු සභාපතිතුමා හරහා ගරු මහ ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. දිස්ත්‍රික්ක තුනේම දිස්ත්‍රික් කමිටුවේ සම සභාපති හැටියට. අඩුම ගණනේ පළාත් සභාවේ ආයතන ටිකවත් මේ ජනතාව හම්බ වෙන්න එන දවසට ඒ අදාළ කාර්යාලවල රැඳී සිටින්නය කියලා. අපි මහජන දිනයට කථා කළාම, හැමදාම ඒ අය රැස්වීම්වල. ඒ නිසා අඩුම ගණනේ පළාත් සභාවේ ආයතන ටිකවත් මේ බදාදාට තමන්ගේ ආයතනයේ නිලධාරීන්ට තමන්ගේ සීට් එකේ ඉන්න කටයුතු කරන්නය කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අපේ පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීමාත් මට මේ කාරණය ගැන කිව්වා. දැන් මේ පානදුරෙත් ඇවිල්ලා තිබෙනවා. දැන් මම ගිය හැටියේම අපේ ප්‍රධාන ලේකම්තුමිය වැදගත් සාකච්ඡාවක ඉන්නේ. ගිය හැටියේම මම ලියුම ගහලා දිසාපතිවරුන්ට යවන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බොහොම ස්තූතියි. ඒ වාගේම ගරු මන්ත්‍රීතුමන්ලා රාශියක්ම වරප්‍රසාද ප්‍රශ්න ඉදිරිපත් කළා. පෞද්ගලික බලපෑම් සහ කරදර සම්බන්ධයෙන්. මේ සම්බන්ධයෙන් හෙට තිබෙන සභා කටයුතු කාරක සභාවට ඒ ප්‍රශ්න යොමු කරලා අපි එතැනදී සාකච්ඡා කරමු.

**ගරු අශෝක දයාරත්න**
Hon.Ashoka Dayarathne

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. අත්තනගල්ල ආසනයේ සම්බන්ධීකරණ රැස්වීම දැනට සති දෙකකට පෙර තිබුණා. ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ආසනය නියෝජනය කරන පළාත් සභා මන්ත්‍රීවරු තුන් දෙනෙක් ඉන්නවා. මම හිතන්නේ ලලිත් වනිගරත්න ගරු ඇමතිතුමාත් එදා ඒ සම්බන්ධීකරණ රැස්වීමට සිටියා කියලා ආරංචි වුණා. ප්‍රනාන්දු පුල්ලේ ගරු නියෝජ්‍ය ඇමතිතුමියගේ ප්‍රධානත්වයෙන් තමයි තියන්න තිබුණේ. නමුත් චන්ද්‍රිකා බණ්ඩාරනායක හිටපු ජනාධිපතිතුමිය තමයි මූලාසනය අරගෙන තිබෙන්නේ. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයේ සංවිධායක, ඔහු පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරයෙක්. ඔහුත් මූලාසනයට ඇවිල්ලා ඉතාමත්ම අවිනීත ලෙස හැසිරිලයි කියලා වාර්තා තිබෙනවා. ප්‍රාදේශීය ලේකම්වරුන්ට, නිලධාරීන්ට නොසැහෙන්න බැණලා තිබෙනවා. ඉතින් මම ගරු මහ ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි. ගරු මහ ඇමතිතුමනි, ඒ අයට මූලාසනය හොබවන්න පුළුවන්ද? අලුත් මන්ත්‍රීවරයෙක් හැටියට මම මේ කරුණ මතු කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම දන්න විධියට නම් එහෙම කරන්න අමාරුයි.

**ගරු අශෝක දයාරත්න**
Hon.Ashoka Dayarathne

ඔව්. දැන් ඇත්ත වශයෙන්ම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීවරයෙක් නොවනා කෙනෙකුට සාමාන්‍යයෙන් - පසුගිය කාලයේ නම් එහෙම තිබුණා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් තමයි පසුගිය කාලයේ නියෝජනය කළේ. දැන් හැබැයි -

**ගරු අශෝක දයාරත්න**
Hon.Ashoka Dayarathne

අත්තනගල්ල ආසනය තුළ සම්බන්ධීකරණ රැස්වීම්වලදී සංවර්ධනය ගැන කථා කරන්නේ නැහැ. ඉන්න නිලධාරීන්ට බැණ බැණ නිහඬ කරනවා. ඒ නිසා මම ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මේ නිලධාරීන්ට, මේ හිටපු ජනාධිපතිතුමියට, ඒ වාගේම සංවිධායකට ඒ සම්බන්ධීකරණ රැස්වීමේ මුලසුන අරගෙන ක්‍රියා කරන්න පුළුවන්ද කියලා දැන ගන්න මම කැමැතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම හිතන්නේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඒ සම්බන්ධයෙන් - ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කළා. ආසන මට්ටමේ සම්බන්ධීකරණ රැස්වීම්වලට මන්ත්‍රීවරුන් නොවන අය සහභාගි වෙලා මූලාසනයේ වාඩි වෙනවා කියන කාරණය. ඒ එක්කම නිලධාරීන්ට හේතුවක් නැතිව දොස් කියනවා කියන කාරණාව. ඔබතුමාගෙන් අහනවා, එහෙම පුළුවන්ද? කියන එක.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මොකක්ද? මට තේරුණේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආසන සම්බන්ධීකරණ රැස්වීම්වලදී, දිස්ත්‍රික්කයේ රැස්වීම් තිබෙනවා නේ? එතුමා උදාහරණයක් හැටියට අත්තනගල්ල ආසනය කිව්වේ. ප්‍රාදේශීය සම්බන්ධීකරණ රැස්වීමේදී මන්ත්‍රීවරු නොවන අය මූලාසනයේ වාඩි වෙනවාලු.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා කියන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

කවුද ඒ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අහගෙන ඉන්න.

**ගරු අශෝක දයාරත්න**
Hon.Ashoka Dayarathne

දැන් අත්තනගල්ල සම්බන්ධීකරණ කමිටුවේදී ගරු මහ ඇමතිතුමනි, -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එතුමිය ජනාධිපතිතුමා විසින් පත් කරලා තිබෙන්නේ. එතුමිය මන්ත්‍රී කෙනෙක්ට ගන්න බැහැ නේ? හිටපු ජනාධිපතිතුමිය හැටියට එතුමියට විශේෂ වරප්‍රසාදයක් තිබෙනවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තව මන්ත්‍රීවරයෙක් වාඩි වෙලා තිබෙනවා.

**ගරු අශෝක දයාරත්න**
Hon.Ashoka Dayarathne

එතකොට අත්තනගල්ලේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායක සරණලාල් මැතිතුමා?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකතුමා වාඩි වෙලා තිබෙනවා.

**ගරු අශෝක දයාරත්න**
Hon.Ashoka Dayarathne

එතුමා පළාත් සභාවේ නැහැ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, මම විශේෂ ප්‍රකාශයක් -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට සභාපතිකම් කරන්න පුළුවන් වෙන්නේ අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන අය විතරයි. අනික් ඕනෑම කෙනෙකුට ඇවිල්ලා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ ඇවිල්ලා වාඩි වෙන්න බාධාවක් නැහැ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

පොඩ්ඩක් ඉන්න.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව මම විශේෂ ප්‍රකාශයක් ඉල්ලලා තිබෙනවා. මට මේ අවස්ථාවේදීම ඒ විශේෂ ප්‍රකාශය කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්නය කියලා ඉල්ලා සිටිනවා. මේ කාරණයටම අදාළවම.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විශේෂ ප්‍රකාශ කරන්න නම් මට ඔබතුමාට කාලය දෙන්න අමාරුයි. ඔබතුමාට කලින් තිබුණා, පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ අවස්ථාව දෙන්න.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

පෞද්ගලික පැහිදිලි කිරීම් යටතේ තමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඉල්ලලා තිබෙනවාද?

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඔව්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම දෙන්නම්. ප්‍රශ්නයක් නැහැ. දැන් බැහැ. පස්සේ දෙන්නම්. පිළිවෙළට දෙන්නම්. කලබල වෙන්න එපා. ගරු මහ ඇමතිතුමා ඔබතුමා කෙටියෙන් පොඩ්ඩක් පැහැදිලි කරන්න.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මෙහෙමයි. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිකම දරන්න පුළුවන් අතිගරු ජනාධිපතිතුමා පත් කරන අයට විතරයි. හැබැයි, ඕනෑම කෙනෙකුට සම්බන්ධීකරණ කමිටුවට සහභාගි වෙන්න අයිතියක් තිබෙනවා. හිටපු ජනාධිපතිතුමිය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට නොවෙයි. අඩුම ගණනේ හදිස්සියේ හරි මේ සභාවට ආවොත් එතුමියට දෙන්න පුළුවන් උපරිම පහසුකමක් දෙන්න වෙනවා. කාටවත් බැහැ, මෙතැන දෙන්න බැහැයි කියන්න. අපේ නිලධාරීන් ඉන්න එක හරි දෙන්න වෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේක ඇතුළේ බැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

සභාවක් ගැන නොවෙයි නේ මේ කථා කරන්නේ. කාටවත් බැහැ නේ කියන්න එතුමියට පල්ලෙහාට ගිහිල්ලා වාඩි වෙන්න කියලා.

**ගරු අශෝක දයාරත්න**
Hon.Ashoka Dayarathne

ඒක හරි. ගරු මහ ඇමතිතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතුමා කියන්නේ ගරු මහ ඇමතිතුමා -

**ගරු අශෝක දයාරත්න**
Hon.Ashoka Dayarathne

අත්තනගල්ල ආසනයේ එක්සත් ජාතික පක්ෂ සංවිධායකවරයා. ඔහුට එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකකම විතරයි තිබෙන්නේ. ජනාධිපතිතුමියත් එක්ක ඇවිල්ලා මූලාසනයේ ඉඳගෙන අත්තනගල්ල ගැන විවේචනය කරන්න එතුමාට පුළුවන්ද ? මම අහන්නේ ඒකයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට පැමිණිලි කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක නම් එච්චර හොඳ දෙයක් නොවෙයි. ඒ කාරණාව එච්චර හොඳ නැහැ. එහෙම ගියාම ඒවා හැල්ලු වෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒක කරන්න ඕනෑ මම නොවෙයි නේ. මම නියෝජනය කරන්නේ දිස්ත්‍රික්ක කමිටු තුන. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඒ ප්‍රදේශයේ ඉන්න පළාත් සභාවේ හෝ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු පත් කරලා තිබෙනවා. ඒකේ තීන්දුව ගන්න ඕනෑ ඒ සභාපතිවරු. ඒක පක්ෂ තුනෙන්ම පත් කරලා තිබෙනවා නේ? දැන් ඉතිහාසයේ තිබුණේ නැහැ නේ? එක්කෝ හිටියේ ආණ්ඩුවේ විතරයි. දැන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙත් සම සභාපති කෙනෙක් ඉන්නවා. එක්සත් ජාතික පක්ෂයෙත් එක්කෙනෙක් පත් කරලා තිබෙනවා. එතකොට එක්සත් ජාතික පක්ෂයේ ඉන්න කෙනා දැන ගන්න ඕනෑ ඒ ගොල්ලන්ගේ සංවිධායකතුමා ඇවිල්ලා වැරැදි විධියට හැසිරෙන කොට ඒ සම්බන්ධයෙන් දැනුවත් කරන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා වෙන්න එයා පාර්ලමේන්තු මන්ත්‍රීවරයෙක් වෙන්න ඕනෑ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒ ගොල්ලෝ විතරයි පත් කරන්නේ. ඒ ගොල්ලෝ නැති තැන්වල, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු නැති තැන්වල පළාත් සභා මන්ත්‍රීවරු පත් කරලා තිබෙනවා.

**ගරු අශෝක දයාරත්න**
Hon.Ashoka Dayarathne

එතුමා එක්සත් ජාතික පක්ෂයේ සංවිධායක විතරයි.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

දැන් කළුතර දිස්ත්‍රික්කයේ එක්සත් ජාතික පක්ෂයේ අය පත් කරලා තිබෙනවා. අපේ ලැයිස්තුව තවම ගිහිල්ලා නැහැ. අපේ ලැයිස්තුව අපේ පක්ෂයේ ලේකම්තුමා යැව්වාම ජනාධිපතිතුමා අපේ අයව පත් කරනවා. මම හිතන්නේ මට ආසන තුනක විතර හම්බ වෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම දැක්කා පත්තරේක තිබෙනවා, මීරිගමට අපේ උදේන විජේරත්න ගරු මන්ත්‍රීතුමයි අපේ අලගියවන්න ඇමතිතුමයි දාලා තිබුණා. ඒ වාගේ දාලා තිබෙනවා මම දැක්කා. නමුත් ගරු මන්ත්‍රීතුමා කියන ප්‍රශ්නය ඊට පටහැනියි. මෙතුමා කියන්නේ මන්ත්‍රීවරයෙක් නොවෙන පුද්ගලයෙක් මූලාසනයට ආවා කියලා. ඒක බරපතළ ප්‍රශ්නයක්. ඒක හරි නැහැ.

**ගරු අශෝක දයාරත්න**
Hon.Ashoka Dayarathne

මූලාසනයට ඇවිල්ලා සම්පූර්ණයෙන් සංවර්ධනය ගැන කථා කරනවා නොවෙයි. විවේචනය කරනවා. නිලධාරීන්ට බණිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක එච්චර හොඳ දෙයක් නොවෙයි. ඒක හරි නැහැ.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු සභාපතිතුමනි, පක්ෂයෙන් ඉල්ලීමක් යවලා තිබුණා සංවිධායකවරුන්ටත් සම සභාපතිකම දෙන්නය කියලා. ඒ උඩ එක්සත්ජාතික පක්ෂයේ අගමැතිතුමාත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙන්න කිව්වාට ගරු මන්ත්‍රීතුමා දීලා නැහැ නේ?

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

මහ ලේකම්තුමාත් ජනාධිපතිතුමා සමඟ සාකච්ඡා කරලා නාම ලේඛනයක් යවලා තිබෙනවා, සංවිධායකකම් කාටද - සංවිධායක තිබුණත් ප්‍රගති සමාලෝචන රැස්වීමේ සම සභාපතිකම දෙන්නේ කාටද කියලා ලියුමක් එවලා තිබෙනවා. ලිඛිතව හැම එක්කෙනාටම ජනාධිපතිතුමාගෙන් ලියුමක් ඇවිල්ලා තිබෙනවා. හැම කෙනාටම සම සභාපතිකම පත්වීමක්.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

දැන් අච්චාරුවක් නේ. අවුලක් නැහැ. ඔහොම යන්න.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

බරපතළ වරදක්.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ඒක ජනාධිපතිතුමා තමයි දීලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගටම යන්න බැහැ. න්‍යාය පත්‍රයානුකූලව තිබෙන්නේ පෞද්ගලික පැහැදිලි කිරීම්. පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ අධීක්ෂණ මන්ත්‍රී වශයෙන් කටයුතු කිරීමේදී ඒ සඳහා නැඟෙන චෝදනා පිළිබඳ පැහැදිලි කිරීමට රසික මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. ඔබතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු රසික මංජුල බුද්ධදාස**
Hon. Rasika Manjula Buddhadasa

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අද මට මේ අවස්ථාව ලබා දීම ගැන මේ අවස්ථාවේදී මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම පසුගිය සභා කටයුතු කාරක සභාවේදී අපේ බස්නාහිර පළාත් සභාවේ ගරු මන්ත්‍රී ජගත් කුමාර මැතිතුමා විසින් ගරු මහ ඇමතිතුමා වෙත යොමු කරන ලද ප්‍රශ්න- ඒ අවස්ථාවේ මම සභාවට සහභාගී නොවුණත්, මන්ත්‍රීවරුන්ගෙන් දැන ගන්න ලැබුණා, මා වෙත බස්නාහිර පළාත් සභාවේ වර්තමාන මහ ඇමති ඉසුර දේවප්‍රිය මැතිතුමා විසින් ලබා දුන්න මේ අධීක්ෂණ මන්ත්‍රී පදවිය පිළිබඳව අසන ලද යම් කාරණා කිහිපයක්. නමුත් ගරු සභාපතිතුමනි, මම ඒ ගැන ඒ අවස්ථාවේ කිසි විටක ඒ ගැන සඳහන් කිරීම ඇරෙන්න වෙන ප්‍රශ්න කිරීමක් කරන්න ඉදිරිපත් වුණේ නැහැ. නමුත් මම හිතන්නේ, ඊට සුමානයකට විතර පස්සේ පත්තරවලින් මට දැනගන්නට ලැබුණා. මේ පිළිබඳව මාධ්‍ය නිකුත් කරලා තිබුණු ලිපියක්. ඒ ලිපියේ එදා සභා කටයුතු කාරක සභාවට ඉදිරිපත් කරපු කාරණාව හා සමාන කාරණාවක් කොළඹ දිස්ත්‍රික්කයත්, කඩුවෙල ආසනයත් නියෝජනය කරන පළාත් සභා මන්ත්‍රීවරුන් තුන් දෙනෙකුගේ අත්සනින් යුතුව ඉදිරිපත් කරලා තිබෙනවා කියලා. එහි සඳහන් කරලා තිබුණු කරුණු අනුව ඇත්තටම ඒක සභා කටයුතු කාර්යාලයේදී මේක ගරු මහ ඇමතිතුමා වෙත යොමු කරලා තිබෙන අවස්ථාවේදී මේකට ගරු මහ ඇමතිතුමා පිළිතුරු දීමට ප්‍රථමයෙන් මේක මාධ්‍ය වෙත නිකුත් වෙලා තිබුණා. මමත් ඇත්තටම මේ ප්‍රදේශය සහ කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් වශයෙන් මට මේ පිළිබඳව උත්තර දීමට, කෙසේ උත්තර දෙන්නද කියලා මට අවස්ථාවක් ලැබුණේ නැහැ. මොකද, ඇත්තටම අපේ ගරු මහ ඇමතිතුමා මේකට උත්තර දුන්නාට පස්සේ ඒ පිළිබඳව එතුමාගේ දැන ගැනීමට ලක් කරලා මේ පිළිබඳව මම උත්තර දෙන විධිය තමයි මම ඒ වේලාවේ හිතාගෙන සිටියේ. නමුත් ගරු සභාපතිතුමනි, මේකට හේතුව මොකක්ද කියලා මම දන්නේ නැහැ. සාමාන්‍ය සම්ප්‍රදායෙන් බැහැරව ඒ ප්‍රශ්නය මාධ්‍ය වෙත යොමු කරලා තිබුණා. ඒක අපි අනිවාර්යෙන්ම දකිනවා. ඒක යම්කිසි ජනප්‍රිය වීමේ අරමුණක් මත සභාවේදී ඇසිය යුතු ප්‍රශ්නයක්. ගරු මහ ඇමතිතුමා ඒ පිළිබඳව පිළිතුරු දුන්නාට පස්සේ, මාධ්‍ය වෙත හෝ වෙන ප්‍රසිද්ධ කිරීමකට ලක් කරන්න තිබුණා. ඉතින් ගරු සභාපතිතුමනි, මේ තත්ත්වය තුළ ඔබතුමන්ලා කවුරුත් දන්නවා, වර්තමාන ගරු මහ ඇමතිතුමා ඉසුර දේවප්‍රිය මැතිතුමා මහ ඇමති වීමෙන් පසුව කඩුවෙල මහ සභාවේ අධීක්ෂණ මන්ත්‍රී වශයෙන් මාව පත් කරනු ලැබුවා. ගරු සභාපතිතුමනි, එහිදී ඒ අධීක්ෂණයට - ඒ වචනය අලුත් ධූරයක් නොවෙයි.මේක මීට ප්‍රථමව චන්ද්‍රිකා කුමාරණතුංග මැතිනිය ඉන්න කාලයේ, රෙජිනෝල්ඩ් කුරේ ගරු මහ ඇමතිතුමා ඉන්න කාලයේ, ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමා ඉන්න කාලයේ මේ අධීක්ෂණ මන්ත්‍රී තනතුරු -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාගේ කාලයේ දුන්නේ නැහැ.

**ගරු රසික මංජුල බුද්ධදාස**
Hon. Rasika Manjula Buddhadasa

දීලා තිබෙනවා. මගේ ළඟ තිබෙනවා. ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමා මේ රෝහණ අබේගුණවර්ධන මන්ත්‍රීතුමාට දුන්න අධීක්ෂණ මන්ත්‍රී ලිපියේ පිටපතක් මා ළඟ තිබෙනවා. මම ඒක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම නම් දන්නේ නැහැ.

**ගරු රසික මංජුල බුද්ධදාස**
Hon. Rasika Manjula Buddhadasa

දීලා තිබෙනවා. කළුතර මහ නගර සභාවේ විතරක් නොවෙයි. කළුතර ප්‍රාදේශීය සභාවටත් එක්ක දීලා තිබෙන්නේ. මෙතුමා ඉන්නවා, මෙතැන. සාක්ෂි දරයි. ඒ ලියුමේ පිටපතක් මා ළඟ තියෙනවා. මම ඒක මහ ඇමැතිතුමාට භාර දීලා තියෙනවා. අත් අකුරෙන් ලියපු -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඒක සභාගත කරන්න.

**ගරු රසික මංජුල බුද්ධදාස**
Hon. Rasika Manjula Buddhadasa

ගරු සභාපතිතුමනි, මට සභාගත කරන්න පුළුවන්. ඒ ගැන වාදයක් නැහැ. මට ඒ ගැන තර්කයකුත් නැහැ, කිසි ද්වේශයකුත් නැහැ. කිසිම ප්‍රශ්නයක් නැහැ. නමුත් මේ පිළිබඳව තර්ක කිරීමේදී මට වැඩිය මීට කලින්, මේ පළාත් සභාවට අපේ කර මතින් පැමිණි මන්ත්‍රීවරු ඉන්නවා. ඒ පිළිබඳව විවාදයක් නැහැ. නමුත් මේ අධීක්ෂණ මන්ත්‍රී ධූරය ලබා දීමේදී ඒ පිළිබඳව යම්කිසි කථාවක් එහෙම හැදිලා තිබෙනවා නම්, ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් විතරයි අහන්න පුළුවන්. මොකද, මෙතෙක් කල් මේ රටේ සම්ප්‍රදායක් තිබුණා පරිණතභාවය සහ ජ්‍යෝෂ්ටත්වය මත - නමුත් ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේ සමහර පළාත් සභාවල සමහර මහ ඇමැතිවරු පළාත් සභාවට පළමුවැනි වතාවේ අඩිය තියනකොට මහ ඇමැති තනතුරු දරලා තිබෙනවා. අපේ ශෂීන්ද්‍ර රාජපක්ෂ හිටපු මහ ඇමැතිතුමා වාගේ. ඒ වාගේ කාලයක් තියෙද්දී, මේ වාගේ ප්‍රශ්න වර්තමානයේ අහන එක මහ විහිළුවක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, එහෙම කථා කරන්න එපා. ඔබතුමා ඒ පැත්තට යන්න එපා.

**ගරු රසික මංජුල බුද්ධදාස**
Hon. Rasika Manjula Buddhadasa

නැහැ, නැහැ. මම ඒ පැත්තට යන්නේ නැහැ. මෙතුමන්ලා කියනවා නම්, මට දුන්නු අධීක්ෂණ මන්ත්‍රී ධූරය සහ එතුමන්ලාගේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තනතුරු දරන්න එපමණ පළපුරුද්දක් බලන්නේ නැහැ. ඒකයි ප්‍රශ්නය.

**ගරු රසික මංජුල බුද්ධදාස**
Hon. Rasika Manjula Buddhadasa

පළාත් සභාවේ තිබෙන පරිණතභාවය ගැන කථා කරන්නේ කොහොමද? එහෙම නම් ඒ කාලයේ හිටපු මහ ඇමැති කෙනෙක් ගෙදර හාන්සි කරලා තමයි, ඒ මහ ඇමැති තනතුර දුන්නේ. එහෙම කොහොමද අභියෝගයට ලක් කරන්නේ? දැන් ඉසුර දේවප්‍රිය ගරු මහ ඇමැති ඒ තනතුරට පත් කිරීම ජනාධිපතිතුමාගේ තීරණයක් නම්, එතුමාට මට මේ තනතුර දෙන්න පුළුවන් නේ? අනෙක් එක ගරු සභාපතිතුමනි, මේ තනතුරු එපමණ ලොකු දේවල් නොවෙයි. කඩුවෙල ආසනයේ සංවර්ධනය කිරීම හෝ කොළඹ දිස්ත්‍රික්කයේ දේශපාලනය කිරීමට මේ අධීක්ෂණ මන්ත්‍රී ධූරය අමුතු වරප්‍රසාදයක් නොවෙයි. මේ තුළින් කවදාවත් මුදල් පරිපාලන කටයුතුවලට ඇඟිලි ගහන්න බැහැ. මේ තුළින් වෙනයම් රාජකාරි දෙයකට ඇඟිලි ගහන්න බැහැ. සම්පූර්ණයෙන් මේ ලියුම කියවලා බැලුවාම ඔබතුමාට තේරෙයි. මේකේ තියෙන්නේ කඩුවෙල මහ නගර සභාවේ පරිපාලනය අධීක්ෂණයට ලක් කර -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කාලය නම් අවසන්.

**ගරු රසික මංජුල බුද්ධදාස**
Hon. Rasika Manjula Buddhadasa

මට සමාවෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විනාඩියක් ලබා දෙන්නම්.

**ගරු රසික මංජුල බුද්ධදාස**
Hon. Rasika Manjula Buddhadasa

මම ඔබතුමාගෙන් පළමුවැනි වතාවට කාලය ඉල්ලුවේ. මට කවුරුත් බාධා කළෙත් නැහැ. මට මගේ කථාව කියන්න දෙන්න. ඒ වාගේ දීලා තිබෙනවා. ඉතින් ඒ අධීක්ෂණ තනතුර දීමෙන් කවුරුවත් අභිබවා යැමටවත්,

[ගරු රසික මංජුල බුද්ධදාස]

කවුරුවත් පිළිබඳ පරීක්ෂණ කිරීමටවත්, යම්කිසි හේතුවක් නිසා කාටවත් බාධා කිරීමටවත් ඒ තුළින් කරන්න බැහැ. අනෙක් එක ගරු සභාපතිතුමනි, මේ තුළ සඳහන් වෙනවා, මම කඩුවෙල මහ නගර සභාවේ රියදුරු මහත්මයෙක් පාවිච්චි කරනවා කියලා සහ කඩුවෙල හිටපු නගරාධිපතිතුමාගේ ගෙදර වලං පිහන් හෝදනවා කියලා. එහෙම දේවල් වෙලා නැහැ. කඩුවෙල හිටපු නගරාධිපතිතුමා අවුරුදු 22 ක් මේ නගර සභාව පාලනය කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේ රජයේ වැඩ කරන සේවකයෝ 70% ක් විතර එතුමාගේ පාලනය කාලයේ රැකී රක්ෂා ලබා දීපු කඩුවෙල ආසනයේ සහ කොළඹ දිස්ත්‍රික්කයේ පිරිස් ඉන්නේ. එතකොට නිරායාසයෙන්ම ඔබතුමන්ලා සභාපතිවරු හැටියට දන්නවා. ඔබතුමන්ලා රස්සාවක් දුන්නාම, ඒ තුළ තිබෙන වටිනාකම අනුව පෝය දවසට, නිවාඩු දිනයක සේවයෙන් බැහැරව එතුමන්ලා එනවා ඔබතුමන්ලාගේ දුක සැප බලන්න. සමහර වෙලාවට ඔබතුමන්ලා මළ ගෙදරකට, මඟුල් ගෙදරකට, දානේ ගෙදරකට යනකොට ඒ වාහනේ නැඟලා යනවා. එහෙම ගිහිල්ලා ඇවිල්ලා ඒ අය තමන්ගේ ප්‍රදේශයේදී ඒ වාහනයෙන්ම බැහැ ගන්නවා. ඒ ඇරෙන්න අඩු ගාණේ, ඒ සේවකයෙක් ඒ ආයතනයේ වැඩ කරනවා නම්, ඒ සේවකයාට තිබෙනවා අයිතිවාසිකමක් තමුන්ගේ රාජකාරියෙන් බැහැරව, තමන්ට අයිති නිවාඩු දිනවල, පොහොය දිනවල, අවශ්‍ය නම් නිවාඩුවක් දාලා ඇවිල්ලා මගේ වාහනය එළවන්න. ඕනෑ තරම් ඒ වාගේ දේවල් තිබෙනවා. වෙලා තිබෙනවා. නමුත් රාජකාරී අවස්ථාවක, මොනයම් හෝ වෙලාවක රාජකාරියේ යෙදිලා ඉන්න වෙලාවක - හරියට මේ පත්තරවලට ලියලා තිබෙන්නේ, අපි ගිහිල්ලා මහ නගර සභාවේ සල්ලි ටික කොමසාරිස්තුමාගේ අනු දැනුමකින් තොරව අරගෙන එනවා. ඒවාගේ නිකම් දූෂණ කථාවක් මවලා තිබෙන්නේ. මේවා හුදෙක් තමන්ගේ ජනප්‍රියතාවය සහ ඉදිරියට යන්න ඕනෑ ගමන, යා යුතු තැනක් නැති වුණාම හොයා ගෙන ගිහිල්ලා කරන අන්ත අසරණ තුච්ඡ දෙකේ දේශපාලනය. ඇත්තටම ගරු සභාපතිතුමනි, කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ, දංකුඩ හෝදන, වළං හෝදන රස්සාව නොවෙයි. සමහර අයට නම් පත් වීම් දුන්නා. මොකද, වටේ පිටේ තිබෙන ගෙවල්වල වළං ටික බේරාගන්න ඕනෑ හින්දා මගේ පියා තනතුරු දීලා තිබෙනවා. ඒ වාගේ තත්ත්වයක් පසුගිය කාලයේ උදා වෙලා තිබෙනවා. ඒවා ගැන අද අපි කනගාටුවට පත් වෙනවා. නමුත් නම් වශයෙන් චෝදනා කරන්න බැහැ. නමක් ඉලක්කගත කරලා, නමක් ලියලා නගරාධිපතිතුමා කියලා, මේ ගැන සැකයි කියලා - පරීක්ෂණ පවත්වන්න පොලිස් දෙපාර්තමේන්තුව තිබෙනවා. ඒක ගැන විභාග කරන්න උසාවිය තිබෙනවා. ඒවායින් වැරැදිකරුවෝ වෙලා චෝදනා ඔප්පු වුණාම තමයි කියන්න පුළුවන් ඇඟිල්ල දික් කරලා මේ වැරැද්ද කළාය කියලා. මෙහෙම කොහොමද කියන්නේ? කරුණාකරලා ගරු සභාපතිතුමනි, මින් ඉදිරියට අපේ සභාවේ ඉන්න ගරු මන්ත්‍රීවරු මේ වාගේ ප්‍රකාශ කිරීමට පෙර - සාමාන්‍යයෙන් මේ පළාත් සභාවේ නැති අය ගැන ප්‍රකාශ කරන්න මට අදාළතාවක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු රසික මංජුල බුද්ධදාස**
Hon. Rasika Manjula Buddhadasa

පළාත් සභාවේ ඉන්න ගරු මන්ත්‍රීවරුන් වන අපි වාගේ අයගේ නම් සඳහන් කරමින් කථා කිරීම ගැන ක්‍රමවේදයක් ඇති කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා ගරු මන්ත්‍රීතුමා. කරුණාකරලා කථාව අවසන් කරන්න. සමාවෙන්න. මොකද, අද න්‍යාය පත්‍රය අනුව පෞද්ගලික පැහැදිලි කිරීම් එකයි ගියේ. තව විනාඩි 29 ක් තිබෙනවා ඒ සඳහා. ශෝක යෝජනා දෙකක් තිබෙනවා. ඒ යෝජනාවලට අදාළ අය ඇවිල්ලා අසුන් ගෙන ඉන්නවා. ඒ නිසා ඒවාට කාලය තිබෙන්නට ඕනෑ. ඒ නිසා මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා පෞද්ගලික පැහැදිලි කිරීම් කරන කොට නියමිත කාලයෙන් කථාව අවසන් කරන්න. නැත්නම් ප්‍රශ්නයක් වෙනවා. ඔබතුමාටත් මම ගොඩක් කාලය දුන්නා.

**ගරු රසික මංජුලබුද්ධදාස**
Hon. Rasika Manjula Buddhadasa

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය සභාපති යසපාල කෝරලගේ මැතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***
*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාට ඔබතුමාගේ පෞද්ගලික පැහැදිලි කිරීම සඳහා අවස්ථාව.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි පසුගිය දවසක දැක්කා, ලංකාවේ තිබෙන පළාත් සභාවල ප්‍රධාන අමාත්‍යවරුන් එකතු වෙලා, පළාත් සභාවල් නිලධාරීන්ව මධ්‍යම ආණ්ඩුවේ සාකච්ඡාවලට නොයවන්න තීරණයක් අරගත්තාය කියලා. මම ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් දැන ගන්න කැමැතියි බස්නාහිර පළාතේ ඒ වාගේ තීරණයකට ඔබතුමා පැමිණියාද? මහ ආණ්ඩුවේ සාකච්ඡාවලට මේ පළාත් සභාවේ නිලධාරීන් යොදවන්නේ නැහැයි කියලා චක්‍රලේඛයක් නිකුත් කළාද කියන එක ඔබතුමාගේ මාර්ගයෙන් මම ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් දැනගන්න කැමැතියි. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා මධ්‍යම ආණ්ඩුවයි, පළාත් සභාවයි කියන්නේ ව්‍යවස්ථාපිත ආයතනයන්. ව්‍යවස්ථාදායක සභාවේ බලතල තිබෙන්නේ මධ්‍යම ආණ්ඩුවට. 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරිලා තිබෙන බලය තිබෙන්නේ, පළාත් සභාවට. ඒ පළාත් සභාවේ තිබෙන බලතල උපයෝගී කරගෙන පළමුවැනි ලැයිස්තුවේ තිබෙන සියලු කාර්ය භාරය කරන්න 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පළාත් සභාවට පැවරිලා තිබෙනවා. හැබැයි අපට මධ්‍යම ආණ්ඩුව අමතක කරලා යන්න බැහැ. මොකද, මධ්‍යම ආණ්ඩුවේ මුදල් ප්‍රතිපාදන ලබාගෙන මධ්‍යම ආණ්ඩුව පාලනය කරන විධායක බලතල තිබෙන ජනාධිපතිතුමාගේ නිර්දේශය මත මහ ඇමැතිවරුන් පත් කරගෙන එතුමාගේ නිලධාරියෙකු හැටියට ආණ්ඩුකාරතුමාව යොදවාගෙන තමයි මේ ලංකාවේ තිබෙන සෑම පළාත් සභාවක්ම කටයුතු කරන්නේ. විශේෂයෙන් පළාත් සභාවේ ජනතාවට සේවාවල් කරන්න මේ ක්‍රමවේදය හදලා, මේ සේවාවන් ලබා දෙන්නේ ඒ ආකාරයටයි. එහෙම නම් ඊයේ පෙරේදා මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා කරපු වැඩ පිළිවෙළ තුළ අපි දකිනවා, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ සංකල්පත්, ඒ වාගේම අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ දැවැන්ත සැලසුම් සහගත ඉලක්කයන් ඇති වැඩ පිළිවෙළත්, මේ ගන්නා වූ තීරණය මත කඩා වැටෙන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා කියන එක ඔබතුමාගේ මාර්ගයෙන් මම මතක් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පළාත් සභාවල බලතල ක්‍රියාත්මක වනකොට අපි දැක්කා, එක යුගයක උතුරු පළාතේ ප්‍රධාන අමාත්‍ය වර්ධරාජා පෙරුමාල් මැතිතුමා මධ්‍යම ආණ්ඩුවේ නියෝග අභිබවා ගිහිල්ලා පළාත් සභාවේ කොඩි වෙනම උස්සන්න ගිහිල්ලා, ඒ ජාතික කොඩියට තිබුණු ගෞරවය අගෞරවයක් කරන්න ගිහිල්ලා ඒ පළාතේ ජනතාවට අවුරුදු 20 කට විතර පළාත් සභාව අහිමි වුණා. ජනතා මතයෙන් නියෝජිතයින් පත් කර ගන්නේ නැතුව නිලධාරින් ලව්වා පළාත් සභාවල් පාලනය වුණු ඉතිහාසයක් උතුරු - නැගෙනහිර පළාතේ ජනතාවට අත්විඳින්න සිද්ධ වුණා. ඊයේ පෙරේදා අපේ රටේ මේ ඇති වෙලා තිබෙන යහපාලන ආණ්ඩුක්‍රම වැඩ පිළිවෙළ තුළ ගරු ප්‍රධාන ඇමැතිතුමා මේ සභාවට ඉදිරිපත් කරපු 2016 මූල්‍ය ප්‍රකාශයේ සඳහන් කරුණු අනුව එතුමා බලාපොරොත්තු වෙනවා, මිලියන දහස් ගණනක් මධ්‍යම ආණ්ඩුවෙන් පළාත් සභාවට ලබාගෙන පළාත් සභාවේ ජනතාවගේ සංවර්ධනය ඇති කරන්න. ඒ සංවර්ධනය ඇති කරන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරවීමේදී මේතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලය ඉදිරිපත් කරපු කරුණුත් එක්ක අපට විශාල සැකයක් තිබෙනවා. දැන් ජනවාරි මාසේ ඉවරයි. පෙබරවාරි ඉවරයි. මේ ප්‍රශ්නය උග්‍ර වෙන්න, උග්‍ර වෙන්න ඔබතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලය ඉදිරිපත් කරපු ඒ සැලසුම් සහගත ඉලක්ක වැඩ පිළිවෙළ කරා යන්න පුළුවන්ද කියන එක මේ සභාවේ ගරු මන්ත්‍රීවරු 104 දෙනාටම තියෙන ප්‍රශ්නයක්

[ගරු කිත්සිරි කහටපිටිය]

හැටියට මම ඔබතුමන්ලාට දැනුම් දෙන්න කැමැතියි. එහෙම නම් අපි ඉල්ලීමක් කරන්න කැමැතියි. බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන ඇමැතිතුමා සාකච්ඡාවට සම්බන්ධ වුණාද? එහෙම නැත්නම් ඒ සාකච්ඡාවේ හිටියාද? ඒ ගත්තු තීන්දු තීරණ පිළිබඳව ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ඔබතුමා දැනගෙන හිටියාද කියන එක පිළිබඳව අපට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මෙතුමා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අවධානයට.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු ප්‍රධාන ඇමැතිතුමනි, ඒ මහ ඇමැති සමුළුවේදී ගත්තු තීන්දුව පිළිබඳව ඔබතුමා දැනුවත් වුණාද කියන එක සම්බන්ධව ලොකු ප්‍රශ්නයක් අපට තිබෙනවා. එහෙම නම් අන්න ඒ වැඩ පිළිවෙළ තුළ මම බලාපොරොත්තු වෙනවා, ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමා මේ පළාතේ නිලධාරීන්ව මධ්‍යම රජයේ සාකච්ඡාවලට යැවීමේ අවස්ථාව ලබා දීලා තිබෙනවාද කියන එක මේ සභාවට ප්‍රකාශ කරන්න කියන එක කියමින්, මගේ කාලය අවසන් වීම නිසා මගේ කථාව අවසන් කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අපි සාකච්ඡාවේදී මහ ඇමැතිවරු හැටියට තීන්දු ගන්න කොට එකට ඉන්න ඕනෑ. උතුරු - නැගෙනහිරත් ඇවිල්ලා තිබුණා නේ? ඕක ඇත්තටම බලපාන්නේ බස්නාහිර පළාතට නොවෙයි. නිලධාරී ප්‍රශ්නය. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ නිලධාරියෙක් නම් ගියා ආවා නේ? පැහැදිලිද කියන කථාව? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තේරුණාද? දැන් අපේ නිලධාරියෙක්ට කොළඹට යන්න පුළුවන් නේ? ළඟයි. බස්නාහිර පළාතට ඕකේ තිබෙන බලපෑම අඩුයි. අර නිලධාරියෙක් ආවොත් ඒ නිලධාරියා පාන්දර එන්න ඕනෑ. ආපහු හම්බ වෙන්නේ හෙට. අපේ එක්කෙනා උදේ 8.30 ට, 9.00 ට හරි 10.00 ට හරි තියෙන සාකච්ඡාවට ගියොත්, අධ්‍යාපන අමාත්‍යාංශයට ගියොත් එයා 02.00, 03.00 වනකොට ආපහු කාර්යාලයට එනවා නේ? තේරුණාද? බස්නාහිර පළාතට ඒක බලපාන්නේ නැහැ. අපට File එකක් අත්සන් කර ගන්න ඕනෑ නම්, අපි කියමු අධ්‍යාපන අමාත්‍යාංශයට ජයන්ති විජේතුංග මහත්මිය ගියා කියලා. අපේ පියන් කෙනෙකුට File එක අරගෙන ගිහිල්ලා අත්සන් කරගෙන එන්න පුළුවන්. ඒකේ බරපතළ ප්‍රශ්නය තිබෙන්නේ අනෙක් පළාත්වලට. ඒක නිසා මම මහ ඇමැති හැටියට එකට ඉන්නවා. නමුත් මේකේ විශාල බලපෑම තිබෙන්නේ අපට නොවෙයි කියන එකයි මම මේ කියන්නේ. තිලකසිරි ඇමැතිතුමා? තේරුණාද කියන කථාව? නේද සභානායකතුමා? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියන එක පැහැදිලිද? ඒ නිසා අපි ඒක එපමණ මේවා කරගන්න අවශ්‍ය නැහැ. නමුත් මහ ඇමැතිවරු හැටියට අපි සාමූහිකතාවය රකින්න ඕනෑ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පැහැදිලි කිරීමක් කරන්න කැමැතියි. නැගෙනහිර පළාතයි, උතුරු පළාතයි දෙකම. මම කථා කළා. අපේ රෙජිනෝල්ඩ් කුරේ මහත්මයාත් හිටියා. ඒ ප්‍රදේශයේ ආණ්ඩුකාරතුමා හැටියට දැන් වැඩ කරනවා. එතැන ඒ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ, අපේ ප්‍රධාන ඇමැතිතුමා කියපු කාරණාව නොවෙයි. මෙතැන අමාත්‍යාංශ මගින් මධ්‍යම ආණ්ඩුවෙන් මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම පිළිබඳව ගැටළුවක් තිබෙන්නේ ගරු ප්‍රධාන ඇමැතිතුමනි. මම හිතන්නේ, ඒ පිළිබඳව ඔබතුමන්ලා කථා කරන්න ඕනෑ මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා සමග. එතුමා සමග කථා කරලා මූල්‍ය ප්‍රතිපාදන ප්‍රශ්නය විසඳා ගත්තා නම් මේ නිලධාරීන්ව නොයවා සංවර්ධන වේගය අඩු කර ගන්න තමයි අපට වෙන්නේ. ඒ නිසා මම දකින පෞද්ගලික දේ තමයි ඔබතුමන්ලා මහ ඇමැති සම්මේලනයේදී හරියට කවුරු හරි කරුණු කාරණා කථා කරලා කිව්වා නම්, මුදල් අමාත්‍යාංශයේ ලේකම් එක්ක සාකච්ඡා කරලා මූල්‍ය ප්‍රතිපාදන අර්බුදය සහ අධ්‍යාපන අමාත්‍යාංශවල තිබෙන අර්බුද විසඳා ගත්තා නම්, අනෙක් සේරම විසඳා ගන්න පුළුවන්. මෙහෙන් නිලධාරීන් යවන්නේ නැතුව හිටියොත් මධ්‍යම ආණ්ඩුවත් දෙන මූල්‍ය ප්‍රතිපාදන කපලා දායි. අපි ගියේ නැහැ. යෝජනා දුන්නේ නැහැ කියලා -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අපට දැනට ප්‍රශ්නයක් වෙලා නැහැ. අපි එක තීන්දුවක ඉන්න ඕනෑ. මහ ඇමැති කෙනෙක් හැටියට අපේ

මහ ඇමැති කණ්ඩායමත් එක්ක අපි ඉන්න ඕනෑ. බස්නාහිර පළාතට තිබෙන ගැටළු අඩුයි. ඒක නිසා අපි ඒක ගැටළුවක් කර ගන්න ඕනෑ නැහැ. නමුත් මහ ඇමැතිවරුත් එක්ක මම එකට ඉන්න ඕනෑ නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සුනිල් ජයමිණි ගරු සභානායකතුමා, ඔබතුමාට විනාඩි 05 ක් තිබෙනවා.

**ගරු සුනිල් ජයමිණි -** සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම විශේෂ ප්‍රකාශයක් කරන්න තමුන්නාන්සේගෙන් අවස්ථාව ලබා ගත්තේ බස්නාහිර පළාත් සභාවේ අප සහෝදර පළාත් සභා මන්ත්‍රී ජගත් කුමාර මැතිතුමාගේ නිවසට එල්ල වුණු ප්‍රහාරය සම්බන්ධව. මොකද, පළාත් සභා මන්ත්‍රීවරයෙක් වශයෙන් කටයුතු කරන ජගත් කුමාර මැතිතුමා බලාපොරොත්තු වුණේ නැති අවස්ථාවක එතුමාගේ නිවසට පසුගිය 18 වැනිදා රාත්‍රියේ හදිසි මැර ප්‍රහාරයක් එල්ල වුණා. ඒ මැර ප්‍රහාරය එල්ල වීම තුළින් මා විශ්වාස කරනවා ඒ ප්‍රහාරය එතුමාට විතරක් නොවෙයි, සමස්ත පළාත් සභාවේ සියලුම මන්ත්‍රීවරුන්ට එල්ල වුණු ප්‍රහාරයක් හැටියටයි. මොකද, ජගත් කුමාර මැතිතුමා මේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කරනවා වාගේම මේ රටේ සමෘද්ධි ව්‍යාපාරයේ ප්‍රධාන නිලධාරියෙක් හැටියටත්, ඒ වාගේම මේ රටේ වර්තමාන දේශපාලන තත්ත්වය තුළ යම් මත පළ කරමින් එතුමා තමන්ගේ ඍජුභාවය පෙන්වමින් කටයුතු කරන කෙනෙක් හැටියටත් සිටින අවස්ථාවක තමයි මේ මැර ප්‍රහාරය එල්ල වෙන්නේ. ඒ නිසා බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරුන් හැටියට විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ අපි අපේ බලවත් අප්‍රසාදය මේ අවස්ථාවේදී පළ කරනවා. එවැනි ප්‍රහාරයක් එල්ල වීම සම්බන්ධව. අපි මේ වෙලාවේ යහපාලන රජයෙන් කවදාවත් බලාපොරොත්තු වුණේ නැහැ, මෙවැනි මැර ප්‍රහාරයක් අපේ මන්ත්‍රීවරයෙකුට එල්ල වෙයි කියලා. මොකද, මෙවැනි දේ නැති කරන්න තමයි මේ ආණ්ඩුව බලයට පත් වුණේ. නමුත් ක්‍රමක්‍රමයෙන් අද (බාධා කිරීමක්) එහෙම නම් යහපාලන රජය මේ දක්වා (බාධා කිරීමක්) අපක්ෂපාතී පරීක්ෂණයක් පවත්වලා, මේකේ පහර දුන් පුද්ගලයෝ කවුද කියන එක හොයන්න ඕනෑ. නමුත් දැන් සිද්ධිය වෙලා දවස් 05 ක් වෙනවා. මේ දවස් 05 තුළ එතුමාගෙන් කටඋත්තරයක් ගැනීම පමණයි කරලා තිබෙන්නේ. සිද්ධිය වෙලා දවස් 05 ක් වෙනවා. මේ දක්වා ගෙදරට ඇවිල්ලා එතුමාගෙන් (බාධා කිරීමක්) කටඋත්තරයක් ගැනීම පමණයි සිද්ධ වෙලා තිබෙන්නේ. මම පැහැදිලිව දන්න නිසා කියන්නේ. ඒක නිසා තමුන්නාන්සේට යහපාලන ආණ්ඩුව ගැන කැක්කුමක් තිබෙනවා නම්, තමුන්නාන්සේ මෙවැනි දේවල් සිද්ධ නොවෙන්න තමුන්නාන්සේගේ නායකයින්ට කියලා ඒවා වළක්වන්න කටයුතු කරන්න ඕනෑ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

නායකයෝද ගහලා තියෙන්නේ?

**ගරු සුනිල් ජයමිණි -** සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

අපි දන්නේ නැහැ නේ කවුද ගැහුවේ කියලා. නිවසට ගහලා තියෙනවා නේ?

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

එහෙම කියන්න එපා.

**ගරු සුනිල් ජයමිණි -** සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

ඒක තමයි.ආණ්ඩුවට තමයි චෝදනා එන්නේ. ඒ නිසා තමුන්නාන්සේට -

[සභාවේ ඝෝෂා]

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අපි සියලු දෙනාට ඒ ඇඟිල්ල දික් කරනවා. කවුද දන්නේ නැහැ -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

තමුන්නාන්සේ වහෙන් හොරෝ කියන්න එපා. නඩුයි, බඩුයි දෙකම මේ පළාත් සභාවේ තියෙනවා නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එතුමාට බාධා කරන්න එපා. සභානායකතුමා ඔබතුමා මූලාසනයට කථා කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නඩුයි, බඩුයි දෙකම මේ පළාත් සභාවේ තිබෙනවා. යහපාලනයට ඇඟිල්ල දික් කරන්න එපා. ඒක හරි අසාධාරණයි.

[සභාවේ ඝෝෂා]

**ගරු සුනිල් ජයමිණි** - සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වෙලාවේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධ කිරීම් කරන්න එපා. ඔබතුමා මූලාසනයට කථා කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සුනිල් ජයමිණි** - සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

ඔබතුමාට මේ සම්බන්ධව ප්‍රකාශයක් කරන්න අවශ්‍ය නම් ඔබතුමා කරන්න. මම මේ ප්‍රකාශය කරන්නේ මන්ත්‍රීවරයෙක් වෙනුවෙන්. ඒ නිසා විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට මේ එල්ල වුණු ප්‍රහාරය සම්බන්ධව මේ දක්වා තලංගම පොලීසිය කටයුතු කරන ආකාරය ඉතාම ඛේදජනකයි. තලංගම පොලීසිය කටඋත්තරයක් ලබා ගත්තා පමණයි. ගරු මන්ත්‍රීතුමාගේ සිද්ධිය සම්බන්ධව තලංගම පොලීසිය ඊට පස්සේ මේ දක්වා කිසි දෙයක් කරලා නැහැ. ඒ නිසා අපි මේ රටේ නීතිය පිළිබඳව -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මන්ත්‍රීතුමා ආණ්ඩුව වෙන්නත් පුළුවන්. අනෙක් අය වෙන්නත් පුළුවන්. අපි දන්නේ නැහැ හරියට.

**ගරු සුනිල් ජයමිණි** - සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

ඒ නිසා මේ රටේ නීතිය පිළිබඳ ඇමැතිවරයාගෙන් ඉල්ලා සිටින්නේ මේ සම්බන්ධව අපක්ෂපාතී පරීක්ෂණයක් කරලා, පහර දුන්නු අය කවුද කියලා -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

නැහැ, නැහැ. දන්නවා කිව්වේ නැහැ. දන්නවා නම් පොලීසියෙන් අල්ලන්න ඕනෑ.

**ගරු සුනිල් ජයමිණි** - සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

ගරු මන්ත්‍රීතුමා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කිරීම් කරන්න එපා. සභානායකතුමා ඔබතුමා මූලාසනයට කථා කරන්න. බාධා කරන්න එපා. මේක පොදු

**ගරු සුනිල් ජයමිණි** - සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමාගේ නිවසට පහර දීම සම්බන්ධව අවට CCTV කැමරවල - නිවෙස් කිහිපයක කැමරා පද්ධති තිබෙනවා. ඒ කැමරා පද්ධතිවල සටහන් වෙලා තිබෙනවා පහර දෙන්න ආපු අය කවුද කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඉතින් ඒක නේ?

**ගරු සුනිල් ජයමිණි** - සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

ඒක අපිද කරන්න ඕනෑ? තමුන්නාන්සේද කරන්න ඕනෑ? ඒකට තමයි පෙලීසියක් තියෙන්නේ. මේ පොලීසිය ඒක කරලා තිබෙනවාද? පොලීසියෙන් මේ දක්වා ක්‍රියාත්මක වෙලා නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අර මන්ත්‍රීතුමා කිව්වා CCTV කැමරාවල සටහන් වෙලා නැහැයි කියලා. ඒකේ Night Vision නැහැයි කියලා. දැන් මෙතුමා කියනවා CCTV කැමරාවල තියෙනවා කියලා. බොරු කියන්න එපා.

**ගරු සුනිල් ජයමිණි** - සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

ගරු මන්ත්‍රීතුමා, තමුන්නාන්සේ පොලීසිය සුද්ධ කරන්න යන්න එපා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එතුමා කියනවා නම් නැහැයි කියලා. ඔබතුමා කොහොමද කියන්නේ? මේවා පට්ටපල් බොරු.

**ගරු සුනිල් ජයමිණි -** සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

තමුන්නාන්සේ පොලීසිය සුද්ධ කරන්න යන්න එපා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නැහැ, නැහැ. කාවවත් සුද්ධ කරන එක නොවෙයි. එතුමාගෙන් මම අහපු වෙලාවේ එතුමා කිව්වා Night Vison නැහැයි කියලා. මේ සභාව නොමඟ අරින්න එපා ගරු සභානායකතුමා.

**ගරු සුනිල් ජයමිණි -** සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

මේ වටපිටාවේ තිබෙන CCTV කැමරාවල සටහන් වෙලා තිබෙනවා නම් ඒවා බලලා කවුද පහර දුන්නු කෙනා කියලා අත්අඩංගුවට ගන්න පුළුවන්කම තිබෙනවා. මම කියන්නේ, පොලීසිය මේ දක්වා කටයුතු කරලා තිබෙන ආකාරය බොහොම මදී කියන එක තමයි මගේ අදහස. ඒ නිසා අපි අද මේ වෙලාවේ කළු පටි පැළඳලා විරෝධය පළ කරන්නේ, මේ සම්බන්ධව අපක්ෂපාතී පරීක්ෂණයක් කෙරෙන්නේ නැති නිසයි. ඒ සම්බන්ධව තමයි විරෝධය පළ කරන්නේ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම තමුන්නාන්සේගෙන් පැහැදිලිව ඉල්ලන්නේ, මේ සම්බන්ධව අපක්ෂපාතී පරීක්ෂණයක් පවත්වලා එතුමාට පහර දීපු අය කවුද කියන එක හොයා බලලා අධිකරණය හමුවට පමුණුවන්න කියන කාරුණික ඉල්ලීමයි මම කරන්නේ. (බාධා කිරීමක්) ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමැතිතුමා මෙතැන ඉන්නවා. මම පොඩි කාරුණික ඉල්ලීමක් කරනවා. දැන් ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමාගේ නිවසට මධ්‍යම රාත්‍රියේ ඇතුල් වෙලා ලොකු හොරකමක් කළා. බොරලැස්ගමුව පොලීසියට ඒ කවුද කියලා හොයා ගන්නවත් හම්බ වුණේ නැහැ. විශාල මුදලක්. ඇත්තෙන්ම එතුමා හරි හම්බ කරපු දේවල් සියල්ල හොරකම් කරගෙන ගියා. හම්බ වුණේ නැහැ. ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමාගේ නිවසට පහර දුන්නා. පහර දීලා ඇත්තටම ඒක අල්ල ගන්න ක්‍රමයක් දුන්නා. ඇත්තටම අද නවීන විද්‍යාවත් එක්ක, නවීන තාක්ෂණයත් එක්ක ඒක සොයා ගන්න පුළුවන්කම තිබුණා. අද අහන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මන්ත්‍රීවරු කී දෙනෙකුගේ ගෙවල්වල -

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

පොලීසියේ රාජකාරියට -

**ගරු සුනිල් ජයමිණි -** සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

ඒ නිසා මම -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, මේ කාටවත් පහර ගන්න නොවෙයි.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ඔබතුමා එහෙම කථා කරන්න එපා. යහපාලනය කියලා.

**ගරු සුනිල් ජයමිණි -** සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

යහපාලනය -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අහගන්න. මේ කථාව අවසන් වන විට -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

යහපාලනයෙන් කළේ නැහැයි කියලා කොහොමද කියන්නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, මේ යෝජනාවක් කරන්න හදන්නේ. ඒක නිසා ඒකට ඇහුම්කන් දෙන්න.

**ගරු සුනිල් ජයමිණි -** සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ වෙලාවේ විශේෂයෙන්ම ගරු ප්‍රධාන ඇමැතිතුමා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයෙන්, අපේ විපක්ෂයේ සංවිධායකතුමාගෙන් ඉල්ලනවා. අපේ මන්ත්‍රීවරුවන්ගේ මම දන්න විධියට කාගේවත් ගෙවල්වල CCTV කැමරා පද්ධති නැහැ. ඒ මොකද, මන්ත්‍රීවරුන්ට ඒවා සවි කර ගන්න පුළුවන්කමක් නැහැ. ඒනිසා මම මේ පළාත් සභාවට යෝජනා කරනවා. පළාත් සභා මන්ත්‍රීවරුන්ට අද ආරක්ෂාව දෙන්න බැහැයි කියලා මධ්‍යම ආණ්ඩුව පොලිස් නිලධාරීන් ලබා දෙන්නේ නැහැ. පළාත් සභා මන්ත්‍රීවරුන්ට ඉස්සර ආරක්ෂාව දුන්නා. දැන් ආරක්ෂාව දෙන්නේ නැහැ. ඒ නිසා පොලිස් නිලධාරීන් දෙන්නේ නැහැ. නමුත් පළාත් සභා මන්ත්‍රීවරු හැම කෙනාටම නිවසක් තිබෙනවා. තමන්ට ඉන්න ස්ථානයක් තිබෙනවා. ආරක්ෂාවක් නැහැ. ඒ නිසා මම යෝජනා කරනවා. පළාත් සභාව මැදිහත් වෙලා පළාත් සභාවේ සියලුම මන්ත්‍රීවරුන්ගේ නිවෙස්වලට CCTV කැමරා පද්ධති ලබා දෙන්න කියන කාරණය. ඒ යෝජනාව අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කරන්න කියන එකත් මම මේ වෙලාවේ ඉල්ලනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

මෙතුමාගේ යෝජනාව ඉතාමත් කාලෝචිතයි. 88 – 89 මගේ පියා පළාත් සභාවේ හිටියා. එතකොට 89 භීෂණකාරී තත්ත්වයක් ඇති වුණේ. මගේ තාත්තාට විශාල බල්බ් ටිකක් පළාත් සභාවෙන් දුන්නා. ඒ දේම තමයි මේ ඉල්ලන්නේ. මේ යෝජනාව ස්ථිර කරනවා වාගේම, මේ සභා කටයුතු කාරක සභාවට දාලා ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සුනිල් ජයමිණි -** සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

ඒ වාගේම ගරු මන්ත්‍රීවරු විශාල ප්‍රමාණයක් පැමිණිලි කරනවා, අදාළ පොලිස් ස්ථානවලින් ඒ සටහන් පොත අත්සන් කරන්න නිවෙස්වලට පැමිණෙන්නේ නැහැයි කියලා. රාත්‍රියට එන්නේ නැහැයි කියලා. සෑම මන්ත්‍රීවරයෙකුගේම නිවෙසකම තිබෙනවා පොලිස් නිලධාරීන් අත්සන් කරන පොතක්. ඒ පොත අත්සන් කරන්න පොලිස්පතිතුමාව දැනුවත් කරලා සෑම මන්ත්‍රීවරයෙකුගේම නිවෙස්වලට රාත්‍රී කාලයේ වේලාවන් දෙකකදී පැමිණිලා ඒ පොත අත්සන් කරන්න කටයුතු කරන්න කියන කාරුණික ඉල්ලීමත් කරනවා. ඒ නිසා ඒ ආකාරයටවත් පළාත් සභාව මැදිහත් වෙලා මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව සලසන්න කියන ඉල්ලීම කාරුණිකව මම කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම හිතන්නේ සියලුම ගරු මන්ත්‍රීවරුන් එකඟ වෙයි. ඔබතුමා ඉදිරිපත් කරපු යෝජනා දෙකටම සභා කටයුතු කාරක සභාවට යොමු කරලා, අපි ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අවධානයට යොමු කරන්න කටයුතු කරනවා.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. මෙතුමා කිව්වා, පළාත් සභා මන්ත්‍රීවරුන්ට ආරක්ෂාව ලබා දෙන්නේ නැහැයි කියලා. ඇත්තටම මගේ සහෝදරයා 2004 දී පළාත් සභාව නියෝජනය කරලා ඝාතනය වුණාට පස්සේ මගේ ආරක්ෂාවට පොලිස් නිලධාරීන් දෙදෙනෙකු දුන්නා. විශේෂයෙන්ම කාන්තාවක් වීම සහ මට තිබුණු තර්ජන සියල්ලත් එක්ක. තවමත් ඒ තර්ජන ඒ විධියටම තිබෙනවා. එහෙම තිබියදී මගේ ආරක්ෂාවට හිටපු පොලිස් නිලධාරීන් දෙදෙනා යහපාලන ආණ්ඩුව ඇවිල්ලා මාස 02 ක් යනකොට ඉවත් කළා. හැබැයි, අපේ පළාත් සභාවේම විපක්ෂයේ ඉන්න අනෙක් පළාත් සභා මන්ත්‍රීවරයාට මේ වනකොට පොලිස් ආරක්ෂාව දීලා තිබෙනවා. ඒ නිසා මම ඔබතුමා මාර්ගයෙන් ඉල්ලීමක් කරනවා. පොලිස්පතිතුමා කොහොමද එහෙම කරන්නේ? තර්ජන තිබෙන, දේශපාලනය නිසා මිනීමැරුමක් සිදු වුණු පවුලක ඉන්න කාන්තාවක් වන මට ආරක්ෂාව නැති කරලා අද එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකතුමාට MSD එකේ ආරක්ෂාව දීලා තිබෙනවා. එතුමාගේ ආරක්ෂාව ඉවත් කරන්න කියලා මම මොන මොහොතකවත් ඉල්ලන්නේ නැහැ. ඒ ආරක්ෂාව තියන්න. හැබැයි අනෙක් පළාත් සභා මන්ත්‍රීවරුන්ටත් ඒ ආරක්ෂාව ලබා දෙන්න කටයුතු කරන්න. මොකද, එක පළාත් සභා මන්ත්‍රීවරයෙකුට MSD එකේ ආරක්ෂාව දෙන්න පුළුවන් නම් මම විශ්වාස කරනවා. අනෙක් සියලුම පළාත් සභා මන්ත්‍රීවරුන්ටත්

ඒ අයිතිවාසිකම තිබෙන්න ඕනෑ. විශේෂයෙන්ම කාන්තාවක් හැටියට සහ මගේ සහෝදරයා ඝාතනය වුණු කෙනෙක් හැටියට ඔබතුමාගේ මාර්ගයෙන් මම ඉල්ලීමක් කරනවා, නැවත වතාවක් ඒ ආරක්ෂාව ලබා දෙන්න කටයුතු කරන්න කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟ පෞද්ගලික පැහැදිලි කිරීම සඳහා ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් ලබා දෙනවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warnakumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ස්තුතිවන්ත වෙනවා. මගේ පෞද්ගලික පැහැදිලි කිරීම යොමු කළේ අපේ හොරණ රජයේ රෝහලේ කම්කරු සේවකයන් පිළිබඳව. ඇත්තටම අපි දිගින් දිගටම හදිසි අවස්ථාවලදී ලෙඩක් දුකක් හැදුනාම අපි යනවා රෝහල්වලට. නමුත් යන බොහෝ වෙලාවල්වලදී කම්කරුවන්ගේ සේවය එතැන අඩුම ගාණේ ඇවිද ගන්න බැරුව එන ලෙඩෙක්ව ඇතුළට අරගෙන යන්න පුළුවන් කම්කරුවෙක්වත්, ට්‍රොලියක් ගෙනියන කෙනෙක්වත් බොහෝ වෙලාවට නැහැ. මම හිතන්නේ එහෙම විය යුතු නැහැ. රජයේ මුදල්වලින් පඩි ගන්නවා නම්, ඒ අය ඒ සේවය කළ යුතුයි. සමහර වෙලාවට පත්වීම් සුදුසුකම් අනුව යන්න පුළුවන්. දේශපාලනය අනුව සමහර වෙලාවට යන්න පුළුවන්. ඒ කොහොම ගියත් තමන්ට හිමි රාජකාරිය කළ යුතුයි. ඒ අය පඩි ගන්නවා නම්, ඒ සේවය කරනවා වාගේම ඒ අය මෙහෙයවන්න ඉන්න පරිපාලනයේ නායකයොත් ඒ ගන්න පඩියට ඒ සේවාව හරියට කළ යුතුයි කියන එකයි මම දකින්නේ. මොකද, අපි කිහිප අවස්ථාවකදී දැක්කා. අදාළ තැන්වලට කිව්වා. විශේෂයෙන්ම රජයේ රෝහලට යන්නේ කිසි දෙයක් කර ගියා ගත නොහැකි අසරණ ජනතාව. ඒ යනකොට විශේෂයෙන්ම සමහර වෙලාවට දවල්ට නොවෙයි, රෑට යනකොට අඩුම ගණනේ හදිසියේ ලෙඩෙක්ව අරගෙන එන්නේ. ඒ අරගෙන එනකොට වෙනත් අය නොහිටින්න පුළුවන්. සමහර වෙලාවට ලෙඩාව ගෙනැල්ලා උස්සා ගන්න බැරි වෙනවා. මම විශේෂයෙන්ම මේ දින කිහිපයකට පෙර රෑ 01.30 ට විතර ගියා අපේම ඥාති කෙනෙකුගේ හදිසි අවස්ථාවකට. ඒ ගියාම මේ සේවකයෝ කිසි කෙනෙක් නැහැ. හැබැයි අපි පිරිමි හතර දෙනෙක් සිටිය නිසා අපි උස්සලා ලෙඩාව ගත්තා මිසක් වෙන කෙනෙක් ආවා නම් ලෙඩා එළියේ තියාගෙන තමයි ඉන්න වෙන්නේ. ගන්න විධියක් නැතුව. එහෙම නැත්නම් දොස්තරවරු හරි නර්ස්ලා හරි ඇවිල්ලා තමයි ගන්න වෙන්නේ. හැබැයි ඇතුළට යනකොට, අර සේවකයෝ පුටුවක වාඩි වෙලා ලෙඩ්ඩු එක්ක, කාන්තා ලෙඩෙක් එක්ක හොඳට කයිය ගහා ගහා ඉන්නවා. නමුත් මම කිව්වා ඔහොම නොවෙයි විය යුතු කාරණාව. මෙතැන මෙහෙමයි කිව්වාම ඔවුන් මගේ ඇඟට ආවා. නමුත් සමහර වෙලාවට තිබෙන නීතිරීතිත් එක්ක කට පියාගෙන අපි සද්ද නැතුව හිටියා. උද්ඝෝෂණවලට අරවාට මේවා යන්නේ ඕක නොවෙයි. පහුවෙනිදාට එළියට එන්නේ අද තිබෙන සමාජයත් එක්ක. නමුත් ඒක අපට හිමි තැන. අපටත් මේකේ යම්කිසි ප්‍රතිපාදනයක් වෙන් වෙනවා. ජනතාගේ මුදල්වලින් අපි මෙතැනට ඇවිල්ලා ඉන්නවා. අපට දීමනා ගෙවනවා වාගේම මේ කාර්යයට ලොකු මුදලක් වැය කරනවා. එහෙම නම් අපට හිමි තැනවත් අපි කථා කරලා මේක සකස් කර ගත යුතුයි. සමහර වෙලාවට ඒ රෝහලට සේවකයෝ මදි නම් ඒක දන්වලා සේවකයෝ ලබා ගන්න එක වෙනම දෙයක්. මදී නම් ඒ කාර්යය කරන්න බැහැ කියන එක ආයතනයේ ප්‍රධානීන් දන්වන එක වෙනම දෙයක්. නමුත් දවල්ට නම් ලෙඩෙක් එක්ක සමහර වෙලාවට තුන් හතර දෙනෙක් එන්න පුළුවන්. රෑට ඒ පහසුකම නැති නිසා අඩු ගාණේ ඒ සේවය ලබා දෙන කෙනාත්, ඒක මෙහෙයවන කෙනාත් තමන් දරන රාජකාරිය, තමන් ගන්න වැටුපට අදාළව ඒ කාර්යය කළ යුතුයි කියලයි මම විශ්වාස කරන්නේ.

විශේෂයෙන්ම පළාත් සභාව තුළින් යැපෙන, පළාත් සභාව සම්පූර්ණ අයිතිවාසිකම් කියන රෝහලක් තමයි හොරණ රජයේ රෝහල. එහෙම නම් පළාත් සභාවේ අපේ ඇමැතිතුමාත්, මේ වැඩ පිළිවෙළට යම් ක්‍රමවේදයක් හැදිය යුතුයි. එහෙම නොවෙනවා නම් අපෙන් ලබා දෙන සේවය ඇත්තට හරියට වෙන්නේ නැති තත්ත්වයට පත් වෙනවා කියන එකයි මම දකින්නේ. ඒ නිසා මම කියන්නේ, කම්කරුවන් පුරප්පාඩු නම්, ඒක මෙහෙයව ගන්න බැරි නම්, විශේෂයෙන්ම අපේ පළාත් සභාවේ ඒ විෂයයට අදාළ ඇමැතිවරයාට දන්වලා එයට විසඳුමක් සොයනවා වාගේම, ඉන්න ප්‍රමාණයෙන් යම්කිසි විධියකට ජනතාවට උපරිම සේවයක් කරන්නට ඒ පරිපාලනය කරන නිලධාරීන්, නායකයෝ දැන ගත යුතුයි කියලයි මම මතක් කරන්නේ.

[ගරු ලලිත් වර්ණකුමාර]

ඒ නිසා ඉදිරියටත්, කතන්දරයක් නොහා බෙහෙත් ටික නිකම් දුන්නාට, වෙනත් පහසුකම් නිකම් දුන්නාට වැඩක් නැහැ. අඩුපාඩුවක් තියලා. ඒ අඩුපාඩුව තුළින් අපි කරන සියලුම දේවල් පල්ලෙහාට යනවා. සමහර ලෙඩ්ඩුන්ගේ ඥාතීන් කියන්න තැනක් නැතුව, කරන්න දෙයක් නැතුව උඩ බලාගෙන ඉන්නවා. පුළුවන් අය කොළඹ අරගෙන යනවා. වෙනත් තැන්වලට අරගෙන යනවා.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ලංකාවේ බෙහෙත් වැඩක් නැහැ. රට යනවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warnakumara

ඒ ඔබතුමන්ලාගේ ඇමැතිතුමා. ඇමැතිතුමාට රට ගිහිල්ලා යන වියදමට මෙහේ ඉස්පිරිතාල දෙකක් හදන්න තිබුණා. ඔයිට වැඩිය හොඳ ඉස්පිරිතාල දෙකක් හදන වියදමක් කරලා තියෙන්නේ ඇමැතිතුමා රට ගිහිල්ලා. එතුමාම පූර්වාදර්ශයක් දීලා තිබෙනවා, මෙහේ බෙහෙත් ගන්න එපා. යන්න සිංගප්පූරු කියලා. ඉතින් එහෙම නොවෙයි. අපේ ගම්වල ඉන්න අසරණ දුප්පත් ජනතාවට අපි කරන සේවය, ඉහළින්ම ලබා දෙන්න නම්, මේක ක්‍රමවේදයකට ගෙනියන්න කියලා මේ මොහොතේ මෙතැන නැති වුණත් ප්‍රායෝගික ඇමැතිවරයෙක් හැටියට අපේ නවක ඇමැතිතුමාට මතක් කරනවා. ඒ නිසා මම විශ්වාස කරනවා. මම හිතන්නේ මේක හොරණ රෝහලට විතරක් නොවෙයි. අපේ පළාතේ තිබෙන බොහෝ රෝහල්වලට අදාළ ඇති. මම නැවතත් මතක් කරන්නේ දේශපාලන පත්වීමකින් කවුරු හරි ගිහිල්ලා තිබෙනවා නම්, එහෙම ඒ දේශපාලන පත්වීමට සලකන්න එපා. ඒවා වැඩක් නැහැ. ගත්තා නම් ඒ නිලයට, තනතුරට හිමි රාජකාරිය පවරන්න. එහෙම කරන්නේ නැත්නම්, ඒකට නීතිමය වැඩ පිළිවෙළ කරන්න ආයතන ප්‍රධානියාට අයිතිය තිබෙනවා. ඒ නිසා හරි දෙයක් ජනතාවට දෙන්න සියලු දෙනාම ගන්න පඩියට පව් නැති වෙන්න, තමන්ගේ දරුවෝ කන බොන දේට පව් නැති වෙන්න රාජකාරිය කළ යුතුයි කියන එක මම මේ අවස්ථාවේ මතක් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් මම අද මේ ප්‍රකාශයට තමයි ලැහැස්ති වෙලා හිටියේ. හදිසියේ තමයි අර අනෙක් ප්‍රකාශය කරන්න සිද්ධ වුණේ. මේ ප්‍රකාශය මම බලාපොරොත්තු වුණේ කඩුවෙල මහ නගර සභාව තුළ ඇති වෙන්නා වූ අඩුපාඩු සම්බන්ධව කරුණු කියන්න. ඒ සම්බන්ධව අපි ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. මම විතරක් නොවෙයි. පළාත් සභාවේ මන්ත්‍රීවරු තුන් දෙනෙක් අත්සන් කරලා තමයි ප්‍රශ්නයක් ඉදිරිපත් කළේ. මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමාගේ අදහස් කියන කොට වැටට ඉස්සෙල්ලා කෙහෙල් කැන පැන්නා වාගේ එතුමා කිව්වා මම මෙහෙම කළා, මෙහෙ කරනවා. මෙහෙම කරන්න පුළුවන් කියලා. නීතියේ මොනතරම් ප්‍රතිපාදන තිබුණත්, මම විශ්වාස කරන්නේ නැහැ පළාත් සභා මන්ත්‍රීවරයෙකුට යම් පෞද්ගලික කාර්ය මණ්ඩලයට මේ විධියට සේවකයෝ යොදා ගන්න හැකියාවක් තිබෙනවා කියලා. ඒ වාගේම විශේෂයෙන්ම හිටපු නගරාධිපතිවරුන්ට - පළාත් සභා නම් මන්ත්‍රී ධූරයක්වත් තිබෙනවා කියලා හිතන්න පුළුවන්. හිටපු නගරාධිපතිවරුන්ට තමන්ගේ ගෙදර වළං හෝදන තැනට, මේ සේවකයෝ ගෙනිහිල්ලා තියාගන්න තැනට - ඒ තරමට සේවකයන්ව ගෙනිහිල්ලා තිබෙනවා. මම සෘජුවම නම් ගම් ඇතුව කිහිප දෙනෙක් පිළිබඳව නගර සභාවේ රියදුරන් දෙදෙනෙකුගේ නම් ගම් ඇතුවම දුන්නා. නගර සභාවේ තව රියදුරන් කිහිප දෙනෙක් මේ නිවෙස්වල වැඩ කරමින් ඉඳලා තිබෙනවා. එතකොට මේ කාර්යයේදී මමත්, ප්‍රදීප් උඳුගොඩ ගරු මන්ත්‍රීතුමාත්, සරත් සුමනසේකර ගරු මන්ත්‍රීතුමාත් මේ නිසා අපි තුන්දෙනාටම. මේ කියන අය සම්බන්ධව කිසිම පෞද්ගලික කාරණාවක් නැහැ. හැබැයි සභාවේ මුදල්, මහජන මුදල් පෞද්ගලිකව එක් පළාත් සභා මන්ත්‍රීවරයෙකුට යොදවන්න පුළුවන් නම්, මේ සභාවේ ඉන්න සියලු මන්ත්‍රීවරුන්ට ඒ අයිතිය, වරප්‍රසාදය තිබෙනවා කියලා මම විශ්වාස කරනවා.

ඒ වාගේම හිටපු නගරාධිපතිවරු එක්කෙනෙකුට තිබෙනවා නම් මේ රටේ හිටපු අනෙකුත් නගරාධිපතිවරුන්ටත් ඒ පහසුකම් භුක්ති විඳින්න අවස්ථාව තිබෙනවා. එහෙම හිතන්නේ නැතුව එක් පාර්ශවයකට විතරක් කඩුවෙල මහ නගර සභාවේ සම්පත්, දේපළ, සේවකයන් යොදාගෙන පෞද්ගලික සුඛ විහරණය සහ

පෞද්ගලික අවශ්‍යතා සඳහා කටයුතු යොදා ගැනීම සම්බන්ධව -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එතුමා මතු කළා මංජුල බුද්ධදාස -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මන්ත්‍රීතුමා, ඔබතුමා ඔබතුමාගේ පක්ෂය ගැනවත්, වෙන දෙයක්වත් කථා කරන්නේ නැත්නම් පාඩුවේ ඉන්න කෝ? අනුන්ගේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා ඔබතුමා මූලාසනයට කථා කරන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

කිසි දෙයක් කථා කරන්නේ නැතුව, අනුන්ගේ දේවල්වලට හොට දානවා. මම බොහොම පැහැදිලිව මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. (බාධා කිරීමක්) අපි මේ ඉල්ලීම් කරන්නේ යහපාලනය කියන කාරණාවත් එක්ක. යහපාලනය නම්, ප්‍රජාතන්ත්‍රවදාය නම්, නිදහස නම් - නිදහස නම් නිදහසේ ඉන්න තියෙන්න ඕනෑ. යහපාලනය නම්, කරන දේවල් පිළිබඳව නිවැරදිව ජනතාවට කරුණු කියන්න පුළුවන් වෙන්න ඕනෑ. දැන් මේ පිළිබඳව කරුණු කියන්න බැරි නිසා තමයි මහ ඇමැතිතුමා සති 02 ක් ඉල්ලුවේ. කරුණු තියෙනවා නම් මහ ඇමැතිතුමා ඉක්මණට උත්තර දෙයි නේ? ඒ කියන්නෙත් ටිකක් අමාරුයි. කෙසේ වෙතත් මේ කඩුවෙල මහ නගර සභාවේ කොන්ත්‍රාත් බෙදීම, සම්පත් බෙදීම සහ අනෙකුත් කටයුතු තවමත් හිටපු නගරාධිපතිතුමාගේ අධීක්ෂණය, මැදිහත්වීම තුළ සිද්ධ වෙනවා නම්, ඒ සඳහා මම පළාත් පාලන කොමසාරිස්තුමියට කථා කරලා ඇහුවා, රියදුරු පාවිච්චි කරනවාද කියලා. එතකොට පළාත් පාලන කොමසාරිස්තුමිය කිව්වා ඔව් පාවිච්චි කරනවා. මම ඇහුවා හරිද කියලා. නැහැ වැරැදියි මන්ත්‍රීතුමා කිව්වා. මම ඇහුවා වැරැදි නම් තව තියාගෙන ඉන්නේ කියලා. මම හෙටම අයින් කරනවා කිව්වා. හැබැයි හෙටම අයින් කරනවා කිව්වාට, අයින් කළේ නැහැ. දැන් එතුමා කිව්වේ, හිතවත්කමට නිවාඩු දාලා කියලා. හිතවත්කමට නිවාඩු දාලා ආවේ නැහැ. සභාවෙන් පඩි අරගන්න ගමන් තමයි මෙතුමන්ලාගේ ගෙවල්වල වළං හෝදන්න මේ මිනිස්සු යවන්නේ. ඉතින් මේ වැඩේ මහ විශාල අපරාධයක්. ඒක නිසා මේක නවත්වන්න ඕනෑ. මේක නවත්වන්නේ නැත්නම් අපට සිද්ධ වෙනවා ඒක නවත්වන, වෙන විධිමත් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයකට. මිනිස්සුන්ට ගහලා, බැණලා, ගෙවල්වලට ඇවිල්ලා තර්ජනය කරලා, නිවට නියාළු වැඩ නොවෙයි. හැබැයි මේ සමාජයේ ප්‍රජාතන්ත්‍රවාදී වැඩක්. මෙතුමා කිව්වා, මේක සමහර අයගේ වැඩක් කියලා. අපේ ගෙදර සිද්ධිය. මම එහෙම දාන්න ලැහැස්ති නැහැ. මොකද, මේකට යහපාලනයේත් උදව්. අපේ කාර්ය භාරය තුළ සමස්ත විරුද්ධ පක්ෂයක් විධියට කටයුතු කරන්නේ. ඒකේදී අඩුපාඩුකම් අපි විවේචනය කරනවා. ඒකේදී කඩුවෙල නගර සභාව කියන්නේ පොඩි කැල්ලක්. මම විරුද්ධව කටයුතු කරන, සමාජ සාධාරණය වෙනුවෙන් පෙනී සිටින කාර්යයේදී පුංචි කැල්ලක් විතරයි නගර සභාව. ඔය පුංචිම, පුංචි කිසි වැදගත්කමක් නැති දාස කෙනෙක් තමයි ඔය බුද්ධදාස. එතුමා ගැන මට ප්‍රශ්නයක් නැහැ. ඒක පැහැදිලියි. නමුත් මේ තියෙන්නේ, සභාවේ සම්පත් අයථා විධියට පරිහරණය කරද්දී අපේ මහ ඇමැතිතුමාට බලාගෙන ඉන්න පුළුවන් නම් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මහ ඇමැතිතුමා ගණන් ගන්නේ නැහැ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

පළාත් පාලන කොමසාරස්තුමියට බලාගෙන ඉන්න පුළුවන් නම්,

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

මහ ඇමැතිතුමා ගණන් ගන්නේ නැහැ.

**ගරු නිමල් ආර්. පීරිස්**
Hon. Nimal R. Peiris

මහ ඇමැතිතුමාට ඇහෙන්නේ නැහැ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මහ ඇමැතිතුමාට ඇහෙන්නේ නැත්තේ නැහැ නේ? මහ ඇමැතිතුමා හොඳට අහගෙන ඉන්නේ. ඔබතුමා පොඩ්ඩක් සද්ද නැතුව ඉන්න.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

එතුමා මගේ ඉස්කෝලේ මල්ලි කෙනෙක්. එයාට ගහන්න බැහැ. ඔබතුමාට ගහන්න දෙන්නෙත් නැහැ මම. එයාට ගහන්න දෙන්නෙත් නැහැ මම. ඔයගොල්ලෝ කාටවත් ගහන්න දෙන්නෙත් නැහැ. ඔයගොල්ලන්ට ගැහුවත් -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මහ ඇමැතිතුමාට කියන්න ඕනෑ ටික මම කිව්වා. දැන් පැහැදිලිව එතුමා අහගෙන හිටියේ. කරුණාකරලා මේ කථාව ඉවර කර ගන්න දෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ඔය වාගේ වැඩ කරලා පුරුදුයි නිමල් ආර්. පීරිස් ගරු මන්ත්‍රීතුමාට. ඔබතුමාගේ ගේ ළඟ මෙතුමා ඉන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඒක තමයි මම කිව්වේ. යහපාලනය. මෙතුමා කළාද කියලත් ඇත්තට දන්නේ නැහැ නේ? ඒක මම දන්නෙත් නැහැ. මොකද, ඒකේදී මෙතුමා හරි සතුටු වෙනවා. පැහැදිලිව සතුටු වන බව මට තේරුණා. අද උදේ වනකල් මම හිතුවේ නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඔබතුමාත් එක්ක සරත් සුමනසේකර හොඳද? සරතුත් ඔය වාගේ වැඩ කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා බලන්න බොරුවටවත් ආවද?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

නැහැ නේ? ඒක තමයි. ඒ නිසා අපි දන්නේ නැහැ කවුද කළේ කියලා. ඒ සිද්ධිය සම්බන්ධයෙන් රටේ යහපාලනයට, ඔබතුමන්ලාට කැක්කුමක් තිබෙනවා නම්, රටේ නීතිය ක්‍රියාත්මක කරන්න. අපේ ගේ ළඟ CCTV නැති වුණාට, රටේ වෙන තැන්වලට CCTV තිබෙනවා. සොයා බලන්න පුළුවන්. පොලීසියට ගෙනියන්න පුළුවන්. කම්බියක්, වයර් එකක් ආපු අයගේ යම් තොරතුරු දීලි තිබෙනවා. සොයා ගන්න පුළුවන්. හැබැයි පොලීසිය බුදි. නීතිය වල් වැදිලා. ඒකයි එතැන ප්‍රශ්නය.

**ගරු නිමල් ආර්. පීරිස්**
Hon. Nimal R. Peiris

ගලක් විසි කළා විතරයි. කවුරුවත් ගැහුවේ නැහැ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

එහෙම නම් ඔබතුමා වෙන්න ඇති ඇවිල්ලා ගල විසි කරන්න ඇත්තේ. අපි දන්නේ නැහැ.

[සභාවේ ඝෝෂා]

අපි දන්නේ නැහැ. ඒක තමයි මම කිව්වේ නිමල් ආර්. පීරිස් ගරු මන්ත්‍රීතුමා ඉතිහාසයේ කූඨ කුමන්ත්‍රණ කරපු මිනිහෙක් කියලා සමාජගතයි. ඉතින් ඔබතුමාට තොප්පිය දාගන්න ඕනෑ නම් -

**ගරු නිමල් ආර්. පීරිස්**
Hon. Nimal R. Peiris

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒක ඉල්ලා අස්කර ගන්න කියන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නිමල් ආර්. පීරිස්**
Hon. Nimal R. Peiris

මෙතුමා මට අපහාස කළා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමා තමන්ගේ පාඩුවේ ඉන්නේ නැතුව මේ කාරණාවට අනවශ්‍ය බාධා කිරීමක් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා බාධා කරන්න එපා.

**ගරු නිමල් ආර්. පීරිස්**
Hon. Nimal R. Peiris

මෙතුමා බොරු කියන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නම් කියන්නේ නැතුව ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු නිමල් ආර්. පීරිස්**
Hon. Nimal R. Peiris

මෙතුමාම ගලක් විසි කර ගත්තා. බොරු කරන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඌලා නැති වළට කනයා පණ්ඩිතයා වෙනවා. සමහරු හදනවා තමන් ගැහුවා කියලා පෙන්වන්න. තමන් පණ්ඩිතයෝ. මට ගැහුවාම ගෞරවයක් එනවාද? හැබැයි පැහැදිලිව කියන්න ඕනෑ නිවට නියාලු, සාමාන්‍යයෙන් කියනවා, පස්සෙන් ඇවිල්ලා පිහියෙන් අනින්නේ නැහැ කියලා. කොන්දක් තිබෙනවා නම්, පණ තියෙනවා නම්, මනුස්සකමක් තියෙනවා නම් ඉස්සරහින් එන්න එපැයි. ඔය ඕනෑම මිනිහෙකුට, ඕනෑම බලුකම් කරපු කෙනෙකුට මම කියන්නේ, කෙලින් ඇවිල්ලා කථා කරන්න. Face to Face මුහුණට හම්බ වෙලා ඕනෑම දෙයක් බේරා ගමු. හැබැයි මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙනී සිටින එක්සත් ජාතික පක්ෂයේ අනෙක් අයටත් කියන්නේ, නිදහස නම් මිනිස්සුන්ට නිදා ගන්නත් තියෙන්න ඕනෑ. කථා කරන්නත් තියෙන්න ඕනෑ. වැඩ කරන්නත් තියෙන්න ඕනෑ. ඒ අවස්ථාව තමයි මේ ලබා දීලා නැත්තේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තූතියි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මම මේ සභාවට පෙත්සමක් ඉදිරිපත් කළා. ඒ පෙත්සම විභාග කළා 2016 ජනවාරි මාසේ 11 වැනිදා. ඒ පෙත්සම විභාග කරන්න හිටියේ සුනිල් විජේරත්න ගරු සභාපතිතුමා, ප්‍රදීප් උඳුගොඩ ගරු මන්ත්‍රීතුමා, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා, සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමා සහ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා. එතකොට මේ පෙත්සම විභාග කරලා ඉවර වෙලා දැන් ඒ පෙත්සමේ තීන්දුව එවලා තිබෙනවා. බොහොම හාස්‍යජනක තීන්දුවක්. ඒකෙන් ඉල්ලලා තිබුණේ අවුරුදු 45 ක් විතර, කැලණියේ තමන්ට අයිති පුද්ගලික ගොඩනැගිල්ලක්, කැලණියේ විවිධ සේවා සමූපකාර සමිතියට දීලා තිබෙනවා. අයිතිකාරයා මේක නැවත ඉල්ලුවා. අයිතිකරු වයසක නෝනා කෙනෙක්. ඒ ඉල්ලීම තමයි මම පෙත්සමක් විධියට ඉදිරිපත් කළේ. එතකොට ඒකෙන් බොහොම පැහැදිලිව කියැවුණා, තමන්ගේ අයිතිය තිබෙනවා. එතකොට කාලයක් තිස්සේ මේක වහලා තිබුණා. වහලා තිබිලා ඉල්ලුවාට පස්සේ නැවත වතාවක් ගෑස් ටැංකි ටිකක් දාලා අලුතින් කැලණිය සමූපකාර සමිතිය මේක පටන් අරගෙන තිබෙනවා කියලා. දැන් මේ දීලා තිබෙන වාර්තාව බැලුවාම මට පරස්පර විරෝධතාවයක් තිබෙනවා. මේකේ බොහොම පැහැදිලිව කියනවා, පෙත්සම්කාරිය සභාව වෙතින් ඉල්ලා සිටින ලද මෙම පෙත්සමට අදාළ දේපලවල අයිතිය තහවුරු කර ගැනීමට නොහැකි වීම කියලා සඳහන් කරලා තිබෙනවා. එතකොට ඊට පස්සේ ආයිත් සඳහන් කරනවා මේක දිගින් දිගට තවත් පවත්වාගෙන යන්න ඕනෑ නම් කුලිය පොඩ්ඩක් වැඩි කරලා දෙන්නම් කියලා. රු. 7500 දක්වා වැඩි කරලා දෙන්නම් කියලා පෙත්සම් කාරක සභාව තීන්දු කරලා තිබෙනවා. ඉතින් මට මේක තේරෙන්නේ නැහැ. අයිතියක් නැති කෙනෙකුට කොහොමද කුලියක් වැඩි කරලා දෙන්නේ? ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්රීතුමාත් මේකේ හිටියා. ඒ නිසා මම බොහොම කරුණාවෙන් ඉල්ලනවා බොහොම අසාධාරණ වැඩක් කරන්නේ. කැලණිය විවිධ සේවා සමූපකාර සමිතිය -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාත් පෙත්සම් කාරක සභාවේ ඉන්නවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මම තමයි පෙත්සම ඉදිරිපත් කළේ. ඒක නිසා මට ඒකට ඉන්න බැරුව ගියා. මම පෙත්සම ඉදිරිපත් කරපු නිසා එන්න බැරුව ගියා. ඒ නිසා මම ඔබතුමාගේ මාර්ගයෙන් නැවත ඉල්ලන්නේ ඇත්තටම මේක කියෙව්වාම -

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ගරු මන්ත්‍රීතුමා -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඉන්න කෝ මම කියන්නම්. ඔබතුමාත් මේකේ ඉන්නවා නේ? ඒ නිසා බොහොම හාස්‍ය ජනකයි මේ එවලා තිබෙන -

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

හාස්‍ය ජනකත්වය නොවෙයි. ගරු මන්ත්‍රීතුමා ඒ කාන්තාවට ඒ ඉඩමේ අයිතිය නැහැ. ඉඩමේ අයිතිය -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

බොහොම පැහැදිලිවම ඔප්පුවෙන් තිබෙනවා.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ඇටෝර්නි බලයක් දීලා තිබෙන්නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මම ඒක තමයි කියන්නේ. ඒ අයිතිය පෙත්සම් කාරක සභාව ඒ වෙලාවේ -

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

පුතා එතුමියට ඇටෝර්නි බලයක් දීලා තිබෙන්නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

බොහොම පැහැදිලිවම තිබෙනවා. ඒක තමයි මම කියන්නේ.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ඉදිරිපත් කරන්න පුළුවන්කම ලැබුණේ නැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

එක තැනක කියනවා අයිතිය නැහැයි කියලා.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

පෙත්සම් කාරක සභාවේ -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

එහෙම නම් මේක දිගින් දිගටම පවත්වාගෙන යන්න ඕනෑ නම් ඔබතුමියට -

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

පෙත්සම් කාරක සභාවේදී ඉදිරිපත් කරන්න සාක්ෂි තිබුණේ නැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අයිතියක් නැති කෙනෙකුට කොහොමද -

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

පෙත්සම් කාරක සභාවේදී ඉදිරිපත් කරන්න එහෙම සාක්ෂි තිබුණේ නැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මම එහෙම තර්ක කරන්නේ නැහැ. මම ඉල්ලීම කරන්නේ,මේ පෙත්සම නැවත සලකා බලන්න කියලා. මේ පෙත්සම නැවත සලකා බලන්න කියන ඉල්ලීම ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලන්නේ.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

එතුමියට කියන්න කරුණාකරලා අදාළ ලියකියවිලි අරගෙන එන්න කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පෙත්සම් කාරක සභාවෙන් යවපු ලිපි ලේඛන කිහිපයකම මමත් දැක්කා වාර්තාව විකෘති වෙලා වාගේ යන අවස්ථාවල් තිබුණා. ඒ නිසා ඔය සිද්ධිය අපි ප්‍රධාන පෙත්සම් කාරක සභාවේදී නැවත සාකච්ඡාවට ගන්නවා. බොහොම ස්තුතියි. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාගේ පෞද්ගලික පැහැදිලි කිරීම සඳහා විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම ස්තුතියි. මා මතු කරන්න හදන කාරණය පසුගිය කාලයේදී දිගින් දිගටම සාකච්ඡාවට ලක් වුණු විදේශ සංචාර හා සම්බන්ධ එකක්. අපි දන්නවා, පළාත් සභා මන්ත්‍රීවරුන්ට විදේශ සංචාරවල යෙදෙන්න බැහැයි කියලා ලොකු කථා බහක් තිබුණා. හැබැයි, අපි දන්නේ නැහැ මොන ලියවිල්ලෙන්ද, මොන නියෝගයෙන්ද මේක වුණේ කියලා. කෙසේ වෙතත් අපි දන්නවා අනෙක් පළාත් සභාවල ඕනෑ තරම් විදේශ සංචාර යනවා. අපට ඒ පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. හැබැයි කොයි වෙලාවේත් අපි ඒ ගැන අවධානයට ලක් කළේවත්, බල කළේවත්, සාකච්ඡා කළේවත්, තර්ක කරන්න ගියේවත්, අදාළ ලියවිලි අභියෝගයට ලක් කරන්නවත් ගියේ නැහැ. හැබැයි ඊට වඩා වෙනස් ආකාරයේ කාරණයක් සොයාගෙන යනකොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පිළිබඳව ලියවිලි දෙකක් මම සොයා ගත්තා. එකක් තමයි 2015.06.17 වැනිදා බස්නාහිර පළාතේ ආණ්ඩුකාර ලේකම් කාර්යාලයෙන් නිකුත් කළ පළාත් සභා හා පළාත් පාලන ආයතන මන්ත්‍රීවරුන්ගේ විදේශ සංචාර කියන ලිපිය. ප්‍රධාන ලේකම්තුමියට යොමු කරලා තිබෙන්නේ. දෙවැනි ලිපිය කේ.සී. ලෝගේෂ්වරන් මහතාගේ පෞද්ගලික ලිපි ශීර්ෂය යටතේ යවපු ලියුමක්. ඒක යවල තිබෙන්නේ ප්‍රධාන ලේකම්තුමියට. ඒක හඳුන්වලා තිබෙන්නේ විදේශ සංචාර කියලා. මම කියන්නම් මේකේ අනෙක් කාරණය. දැන් මම මේ කථා කරන්න යන්නේ පළාත් සභා මන්ත්‍රීවරු ගැන නොවෙයි. නිලධාරීන් ගැන.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සංවිධානය කළා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් වෙනුවෙන් විදේශ පුහුණු වැඩ සටහනක්. මොකක්ද මේ විදේශ පුහුණු වැඩ සටහන? මේ විදේශ පුහුණු වැඩ සටහන එක්සත් රාජධානියේ සිවිල් සේවා විද්‍යාලයේ - Civil Service College එකේ දින 10 ක විදේශ පුහුණුවක්. මම දන්න හැටියට මේකේ එක් අයෙක් වෙනුවෙන් පවුම් 2000 ගණනේ ගෙවලා, මේ විදේශ සංචාරය සංවිධානය කළේ. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් 19 දෙනෙක් මේකට තෝරා ගත්තා. මේ 19 දෙනාගෙන් 16 දෙනෙක් සේවය කරන්නේ මධ්‍යම ආණ්ඩුව යටතේ. 03 දෙනෙක් පළාත් සේවයේ. ඒ කියන්නේ මේ පළාත් සභාව යටතේ සේවය කරන්නේ. එක්කෙනෙක් බන්දුල ප්‍රේමකුමාර, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය). නිශාන්ති විජේසුන්දර, ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ, චම්පිකා පතිරණ, අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ. දැනගන්න තිබෙන විධියට මෙපමණ මුදල් ගෙවලා මේ අයට යන්න අනුමැතිය දුන්නා.

විශේෂයෙන්ම මධ්‍යම ආණ්ඩුව යටතේ ඉන්න 16 දෙනාට විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් අනුමැතිය දීලා තිබුණා. හැබැයි ඉතිරි තුන් දෙනාටත් අනුමැතිය දුන්නා. ඒ අයව තෝරාගෙන තිබුණා. මුදල් ගෙව්වා. ඒ වාගේම ගුවන් ටිකට් පත් දුන්නා. බ්‍රිතාන්‍යයට යන්න විසා ලබා ගත්තා. සියලු දේවල් කරලා හෙට උදේ 09.00 ට යන්න ඉන්නකොට අද උදේ 10.00 ට 11.00 ට පණිවිඩයක් එවනවා. ඒ තුන් දෙනාගේ විතරක් විදේශ සංචාරය Cancel කළා කියලා. මේකට හේතුව මොකක්ද? මේකට හේතුව තමයි, ප්‍රධාන ලේකම්තුමිය අන්තිම වෙලාවේ, අන්තිම මොහොතේ ආණ්ඩුකාරතුමාට බලපෑමක් කරනවා, අපි කොයිකටත් මේක ජනාධිපති ලේකම්ගෙන් අහමු කියලා. අවාසනාවකට ජනාධිපතිතුමා ලංකාවේ නැහැ. ජනාධිපති ලේකම්ගෙන් කථාව අහනකොට එතුමා කියනවා, මේ තුන් දෙනාට යන්න දෙන්න බැහැයි කියලා. කිසි හේතුවක් නැහැ. එකම සේවයේ. මේක දීප ව්‍යාප්ත සේවයක්. ගණකාධිකාරී සේවය. මේකේ මධ්‍යම ආණ්ඩුවේ ඉන්න 16 දෙනාට යන්න පුළුවන්. අනේ පළාත් සභාවට සම්බන්ධ වීමේ ශාපයට මේ නිලධාරීන් තුන් දෙනාට යන්න බැරි වෙනවා. මම පෙන්වන්න හදන්නේ ඒක නොවෙයි.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ කිසිදු ඇමැතිවරයෙක් මේ සභා ගර්භය තුළ නැහැ. ඔබතුමාගේ මාර්ගයෙන් ආණ්ඩු පක්ෂයේ සංවිධායතුමාට යොමු කරනවා, වහාම මෙතැනට ගෙන්වා ගන්න. නැත්නම් මේ කථා කරන දේවල්වල වගකීමක් ගන්න කිසිම කෙනෙක් නැහැ. මේක හැන්සාඩ් එකට විතරයි යන්නේ. අද මේක සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්න -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා ඒ ගැන සැලකිලිමත් වෙන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මට අවස්ථාව දෙන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකෙන් මොකක්ද වෙන්නේ? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තිය යටතේ, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ජනාධිපතිවරයා සම්පූර්ණයෙන් තමන්ගේ විධායක බලය ආණ්ඩුකාරවරයාට පවරලා තිබෙනවා. ආණ්ඩුකාරවරයා තමයි අපේ විධායකය. හැබැයි ආණ්ඩුකාරවරයා මොකද කරන්නේ? ප්‍රධාන ලේකම් කිව්වා කියලා ජනාධිපති ලේකම්ගෙන් අහනවා, මේගොල්ලන්ව රට යවන්නද කියලා. මේ ක්‍රමවේදය මෙතැන දස දහස් වාරයක් කැඩිලා. මොකක්ද වෙන්නේ? අවසානයේ බලාගෙන ගියාම ආණ්ඩුකාරවරයා ඉන්නේ ජනාධිපති ලේකම්ගේ යටින්. හැබැයි ඊට පස්සේ කවුරුත් මේකට කථා කරන්න ඉදිරිපත් වෙන්නේ නැහැ. මේ මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් බැලුවාම ලිපි දෙකේ කථාව එනවා. මේ ලිපි දෙකේ කථාවෙන් එකක මෙන්න තිබෙනවා. මේකේ කියනවා, පළාත් සභා සහ පළාත් පාලන මන්ත්‍රීවරුන්ට විතරක් පළාත් සභා අරමුදල්වලින් රට යන්න බැහැ. මේක එවන්නේ ලෝගේෂ්වරන් මහත්තයා. හැබැයි මේකේ කියන්නේ නැහැ, නිලධාරීන් ගැන. මෙන්න තිබෙනවා දෙවැනි ලියුම. දෙවැනි ලියුමේ මොකක්ද කියන්නේ? දෙවැනි ලියුමේ විදේශ සංචාර කියලා එවනවා. පළාත් සභාවේ වැඩ කරන රජයේ සේවකයින්ව විදේශ පුහුණුව සඳහා යවන්න පුළුවන්. හැබැයි ඒක ප්‍රධාන ලේකම්වරයා හෝ ලේකම්වරිය විසින් පත් කරනු ලබන කමිටුවක් විසින් අනුමත කරන්න ඕනෑ. එතකොට මම අහන පළමුවැනි ප්‍රශ්නය. මේ කමිටුව අනුමත කළාද? නැද්ද? ප්‍රධාන ලේකම්තුමිය වහාම අනුමත කළ යුතුයි. මේකේ තිබෙනවා, 12 වැනි මාසේ 03 වන දින ආණ්ඩුකාරතුමා විසින් විදේශ සංචාරයන් ශීර්ෂ සහිතව පළාතේ සියලු ලේකම්වරුන්ට යවපු ලියුමේ කොහොමද තියෙන්නේ? විදේශ පුහුණු වැඩ සටහන් සහ සම්මන්ත්‍රණ සඳහා සුදුසු නිලධාරීන් තෝරා ගැනීම පළාත් ප්‍රධාන ලේකම්ගේ අධීක්ෂණය යටතේ පවත්නා මණ්ඩලයක් මගින් සිදු කළ යුතුයි. එම මණ්ඩලය ප්‍රධාන ලේකම් විසින් වහාම පත් කළ යුතුයි. ඒ අනුව මම පළාත් සභාවෙන් මෙන්න මේ ප්‍රශ්න ටික අහනවා. මොකක්ද? මම අහන්නේ මේ ලිපි දෙකෙන්ම නිලධාරීන් රට යැවීම නවත්වලා නැහැ. එහෙම නම් ඇයි මේ නිලධාරීන් තුන් දෙනාගේ පුහුණුව අත්හිටෙව්වේ? ඊළඟට 12 වැනි මාසේ 03 වැනි දින ආණ්ඩුකාරතුමා විසින් නිකුත් කළ ලිපියට අනුව ප්‍රධාන ලේකම් විසින් අදාළ මණ්ඩලයක් පත් කළාද? නැද්ද? දැන් පරීක්ෂණයට ලක් කරන්න ඕනෑ කාරණා. පළාත් සභාවේ අදාළ නිලධාරීන් මෙම මණ්ඩලයට යොමු කළාද? නැද්ද? එසේ නම් අවසාන මොහොතේ ඔවුන්ගේ විදේශ පුහුණුව අත්හිටෙව්වේ කවර බලවේගයක් විසින්ද? මෙවැනි තත්ත්වයක් තිබියදී ජනාධිපති ලේකම්ගෙන් කරුණු විමසුවේ ඇයි? මේක ඊළඟ ප්‍රශ්නය. ආණ්ඩුකාරවරයා ඉන්නේ ජනාධිපති ලේකම් යටින්ද කියලා මේ ප්‍රශ්නය මතු වෙනවා. ආණ්ඩුකාරවරයාගේ නියෝග කඩ වීමට ඉඩ හැර කරුණු නොදන්නා අයෙකු සේ ක්‍රියා කරමින් තමා යටතේ සිටින නිලධාරීන් තිදෙනෙකුගේ අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමට ප්‍රධාන ලේකම් වගකිව යුතු නැද්ද කියලා මම මේ සභාවෙන් අහනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පිළිබඳව දැනගත් වහාම මම දිගින් දිගටම ජනාධිපති ලේකම්ට දුරකථනයෙන් කථා කළා. එතුමා රජයේ නිලධාරියෙක්. මන්ත්‍රීවරයෙක් හැටියට මට ජනාධිපති ලේකම්ට කථා කරන්න තියෙන්න ඕනෑ. අවාසනාවකට ජනාධිපතිතුමා ලංකාවේ හිටියේ නැහැ. ජනාධිපතිතුමා ලංකාවේ හිටියා නම් මම කෙසේ හෝ ජනාධිපතිතුමා අමතනවා. එහෙම නම් මේ ප්‍රශ්නය බේරා ගන්න තිබුණා. හැබැයි වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමාට මම දුරකථනයෙන් කථා කරලා කිව්වාම, මම දැන් මේ දිවුරුම් දෙන ගමන්. දැන් ඉන්නේ ආණ්ඩුකාර කාර්යාලයේ. දැන් කථා කරලා ප්‍රශ්නය විසඳන්නම් කිව්වා. විසඳගන්න බැරි වුණා. ඊට පස්සේ මම මොකක්ද කළේ? අපේ ප්‍රධාන

අමාත්‍යවරයා පිටරට. මම එතුමාට Call කරනවා. Internet හරහා එතුමාගේ දුරකථනය වැඩ කළා. හැබැයි Aunswer කළේ නැහැ. 2016 පෙබරවාරි 15. මම SMS එකක් යනවා. *An agent matter. Please send me a massage when you are free. Thank you. Kindelpitiya.* ඒකට උත්තර නැහැ. ඊට විනාඩි තුනකට පස්සේ මම සිංහලෙනුත් යැව්වා. *ඉතා හදිසි කාරණයක්. නිදහස් වේලාවක ඇමතුමක් දෙන්න.* අපේ මහ ඇමැතිතුමා මේවා අමතනවාද? අමතන්නේ නැහැ. ඊට පස්සේ මම කථා කළා ප්‍රධාන ලේකම්තුමියට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. කථා කරලා මම කියනවා මේ ප්‍රශ්නය ඔබතුමියට මැදිහත් වෙන්න පුළුවන්. මේ නිලධාරීන් තුන් දෙනා ඔබතුමිය යටතේ ඉන්න නිලධාරීන් තුන් දෙනෙක්. මේ තුන් දෙනාව බේරා ගන්න. කරුණාකරලා මහ ඇමැතිතුමාට කථා කරලා කියන්න. එතුමා කොරියාවේ හිටියත්, ජනාධිපතිතුමා ජර්මනියේ හිටියත් ඒ දෙන්නාට කථා කරන්න පුළුවන්. මම මහ ඇමැති නම් මේ නිලධාරීන් සම්බන්ධයෙන් ජනාධිපතිතුමාට කථා කරන්න ඕනෑ. අනිවාර්යයෙන් ජනාධිපතිතුමා දන්නවා නම් කියනවා කරුණාකරලා මේ නිලධාරීන් තුන් දෙනා යවන්න. මුදල් ගෙවලා, වීසා අරගෙන, ටිකට් අරගෙන පැය කිහිපයක් ඇතුළත මේ සංචාරය - ඇත්තටම අනෙක් 16 දෙනාත් අවලංගු කළා නම් මෙතැන ප්‍රශ්නයක් නැහැ. හැබැයි 16 දෙනෙක් යවලා, පළාත් සේවයේ ඉන්න 03 දෙනා නොයැවීම ඉතා අසාධාරණයක්. මම දන්නේ නැහැ මේ ප්‍රධාන ලේකම්තුමිය මේකට කථා කළාද නැද්ද කියලා. හැබැයි ප්‍රධාන ලේකම්තුමිය මගේ දුරකථන ඇමතුමට කරපු ජුගුප්සාජනක වැඩේ මම මේ පළාත් සභාවේ මතු කරන්නේ නැහැ. ඒකම මගේ වරප්‍රසාද කඩ කිරීමක්. හරිද? මම නිලධාරියෙකුට විරුද්ධව මීට වඩා කථා කරන්නේ නැහැ. හැබැයි තව ප්‍රශ්න ඇති කළොත් මම දන්නවා අද්මිරාල් තිසර සමරසිංහ මහත්මයා. ඉහළම නිලධාරියෙක් ඔස්ට්‍රේලියාවට ගිහිල්ලා පුහුණුවට එක දවසක්වත් සහභාගී නොවීම පිළිබඳව විදේශ අමාත්‍යාංශයට එවපු ලියුම. එහෙම කරන්න ආවොත් ඒ ලියුම සභාගත කරලා, මම අභියෝග කරනවා.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේවා ඉතාම අසාධාරණ කාරණා. ඒ නිසා මම කියන්නේ, මේ වාගේ දේවල් යළි සිද්ධ වෙන්න දෙන්න එපා. මම කියන්නේ, මේ අපේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රශ්න. අපි නිලධාරීන් වැරදි නම් වැරදියි කියනවා. නිලධාරීන් හරි නම් හරි කියනවා. නිලධාරීන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් අපි ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් වාගේම සටහන් කරනවා කියන එකත් මම මේකේදී මතු කරනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. පළාත් සභාවක් හැටියට අපට මේවා මෙහෙම වෙන්න දෙන්න බැහැ. අපේ ප්‍රධාන ඇමැතිතුමාට වගකීමක් තිබෙනවා. ඇමැතිවරුන්ට වගකීමක් තිබෙනවා. වැඩ බලපු ප්‍රධාන ඇමැතිවරයාට වගකීමක් තිබෙනවා. ප්‍රධාන ලේකම්වරියට වගකීමක් තිබෙනවා, මේ අයට නිසි පුහුණුවක් දීලා මේ අයව නියම තැන්වල තියන්න. මේවාට කුහක වෙන්න නරකයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ නිසා මම ඉල්ලා සිටිනවා. මගේ ලියවිල්ල සභාගත කරනවා.[1] කරුණාකරලා මේ පිළිබඳව පරීක්ෂණයක් පවත්වලා නිලධාරීන් විතරක් නොවෙයි, අසාධාරණයට ලක් වෙලා ඉන්න අපේ පළාත් සභා මන්ත්‍රීවරුන්ගේත් අයිතිවාසිකම් වෙනුවෙන් අපි මීට වඩා හඬ නැඟිය යුතුයි කියන එක මතක් කරමින් ඔබ සියලු දෙනාට ස්තුතියි පුද කරනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මාතෘකාව සම්බන්ධව පොඩි වෙනසක් තිබුණත්, මම මේ කථා කරන්නේ, පසුගිය 19 වැනිදා ගම්පහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට සජීවීව මැදිහත් වුණු මේ සභාවේ මන්ත්‍රීවරයෙක් විධියට. ඒ අවස්ථාව අපි දකින්නේ, ඇත්තෙන්ම ආයතනික ව්‍යුහයත් උල්ලංඝණය කරමින්, ඒ වාගේ න්‍යාය පත්‍රයානුකූලව කටයුතු කිරීමත් පැත්තකට තියලා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙනම පැත්තකට ගමන් කළාය කියලා තමයි අපි දකින්නේ. ඉතාමත් අවාසනාවන්ත සිද්ධියක්. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ විශ්‍රාමික ජනාධිපතිනිය වාඩි වෙන්නේ කොහොමද? මේක ප්‍රධාන ගැටළුවක්. මහජන මන්ත්‍රීවරයෙක් නොවන විශ්‍රාමික ජනාධිපතිනියක් ඒ සභාව තුළ ප්‍රධාන මූලාසනයේ අසුන් ගන්නවා. ඊළඟ කාරණය තමයි මෙතනදී උප සභාපතිවරු දෙදෙනෙක්, සම සභාපතිවරු තුන් දෙනෙක් නම් කරලා තිබෙනවා. අපේ ප්‍රධාන ඇමැතිතුමා එදා පැමිණියේ නැහැ. ඊට අමතරව සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමිය, ඒ වාගේම අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා මේ දෙන්නාගේ මැදින් අර විශ්‍රාමික ජනාධිපතිනිය වාඩි වෙලා සම්පූර්ණයෙන්ම සභාව මෙහෙයවන්නේ මෙතුමිය.

[1] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

[ගරු අසෝක සපුමල් රන්වල]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහජන මන්ත්‍රීවරුන් නොවන අය මේ ආකාරයට ප්‍රධාන මූලාසනයට නැඟලා සියලු නිලධාරීන්ව මෙහෙයවන මට්ටමට ඇද වැටිලා තිබෙනවා නම්, මේ සම්බන්ධයෙන් මොකක්ද අපි ප්‍රකාශ කරන්නේ? අපි දැක්කා, මීට කලින් බැසිල් රාජපක්ෂ ඇමැතිතුමා මඟින් අත්තනෝමතිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව කැඳවන අවස්ථාව. ඒ අවස්ථාවත් අපි දැක්කේ ඉතාමත් තද අත්තනෝමතිකත්වයක් කරා ගමන් කරන විධියක්. ඊටත් වඩා එහාට ගිහිල්ලා දැඩි අත්තනෝමතික විධියට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව කැඳෙව්වා.

මෙතැන අවාසනාවන්ත සිද්ධිය තමයි පසුගිය 06 වැනිදාට පෙර සියලු අයගෙන් අදහස් විමසුවා, න්‍යාය පත්‍රයට යොදන්න. මම ලිඛිතව තැපෑලෙන් Register Post යැව්වා මගේ ප්‍රශ්නය සම්බන්ධව. දනව්කන්දේ, ගල්කොරිය සම්බන්ධව තිබෙන ගැටලුව. න්‍යාය පත්‍රයට මේක අඩංගු වෙලා තිබුණා. හැබැයි ඒ න්‍යාය පත්‍රය පැත්තකට තියලා, වෙනම න්‍යාය පත්‍රයක් දිස්ත්‍රික් ලේකම්ට මෙහෙයවන්න සිද්ධ වුණා. දිස්ත්‍රික් ලේකම්තුමා අසරණ වෙලා හිටියා. එක එක්කෙනා ඇවිල්ලා වාඩි වෙද්දී දිස්ත්‍රික් ලේකම් කෙලවරට ගිහිල්ලා අවසානයේ එතුමාට වාඩි වෙන්න ස්ථානයක් පවා නැති වුණා. මෙන්න මේ විධියට නම් මේ රටේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව කැඳවන්නේ. ඉතාමත් අවාසනාවන්ත ශෝචනීය තත්ත්වයක්. එතැනදී මේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ න්‍යාය පත්‍රය අවසන් කරන්නේ නැතුව විශ්‍රාමික ජනාධිපතිනිය නැඟිටින අවස්ථාවේදී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව නවත්වනවා. මම ඒ අවස්ථාවේදී දිසාපති සුනිල් ජයලත් මහත්මයාට කථා කරලා කියනවා, ඇයි න්‍යාය පත්‍රයේ කටයුතු කරන්නේ නැත්තේ කියලා. ඒ වෙලාවේදී කියන්නේ හිටපු ජනාධිපතිනිය කිව්වා, දැන් නවත්වන්න කියලා. සම සභාපතිවරු දෙදෙනක් ඉඳිද්දී, ලේකම්තුමාත් ඉඳිද්දී, දිසාපතිතුමාත් ඉඳිද්දී සභාව ඉදිරියට ගෙනියන්නේ නැතුව ඒ ප්‍රශ්න ටික ඒ විධියටම තියෙද්දී, න්‍යාය පත්‍රයක් මඟින් නවත්වලා කිසිදු පැහැදිලි කිරීමක් නැතුව සභාවේ වැඩ නවත්වනවා. දිගින් දිගටම මේ විධියට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව කැඳවනවා නම් ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවට වෙන කියන්න දෙයක් නැහැ. අබ සරණයි. අපි ඉල්ලා සිටිනවා. අඩුම තරමින් මේ දිස්ත්‍රික් සම්බන්ධීකණ කමිටුවේ තිබෙන ආයතන ව්‍යුහය - මෙතුමාත් හිටියා. ලලිත් වනිගරත්න ගරු ඇමැතිතුමා. ඉතාමත් පිටිපස්සට ගිහිල්ලා අසරණ වෙලා හිටියා. අදහසක් ප්‍රකාශ කරන්න බැරුව. අපි ඉල්ලා සිටින්නේ, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව තියෙන්න ඕනෑ ප්‍රදේශයේ නිලධාරීනුත්, අදාළ මහජන නියෝජිතයනුත් - ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාටත් මම හිතන්නේ ගොඩක් දේවල් කථා කරන්න තිබුණා. නමුත් එහෙම කථා කරන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. මෙතුමාත් උත්සාහ කළා, බලහත්කාරයෙන් වාගේ නැඟිටලා කථා කරන්න. ඇත්තෙන්ම න්‍යාය පත්‍රයානුකූලව කථා කරන්න අවස්ථාවක් ලබා දුන්නේ නැහැ. අපි ඉල්ලා සිටින්නේ, ප්‍රදේශයේ මහජන නියෝජිතයින් විධියට බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරු ඉන්නවා. ඒ වාගේම එතැන ප්‍රාදේශීය සභාවේ නගරාධිපතිවරුන්, සභාපතිවරුන්, ඒ වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඉන්නවා. ඒ නිලධාරීන් අතර ඉතාමත් හොඳ සම්බන්ධීකරණයක් හැදෙන අවස්ථාවට තමයි ඒ සම සභාපතිවරු කටයුතු කරන්න ඕනෑ. සම සභාපතිවරු එතැන අසරණ වෙලා හිටියා. න්‍යාය පත්‍රය හසුරුවන්න බැරුව දිස්ත්‍රික් ලේකම්තුමා අසරණ වෙලා හිටියා. ඒක නිසා ඉසුරු දේවප්‍රිය ගරු ප්‍රධාන ඇමැතිතුමා මඟින් මේ සභාවට දැනුම් දෙන්නේ. ඒ සම්බන්ධීකරණ කමිටුව මේ සභාවේ නිල වශයෙන් දැනුම් දීලා එවන්න, දිසාපතිතුමාට ආයතනික ව්‍යුහය තුළ කටයුතු කරන්න. නිලධාරීන් සමඟ ඉතා සුහදව කටයුතු කරලා නිලධාරීන්ට අදාළව ප්‍රතිපාදන පැත්තෙනුත්, අනෙකුත් සුභ සාධන කටයුතු පැත්තෙනුත් ඒ මනා සහයෝගය මහජන නියෝජිතයින්ට ලබා දෙන්න තිබෙන එකම ස්ථානය බවට පත් වෙලා තිබෙන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව නිවැරැදි ආයතනික ව්‍යුහයක් තුළ පවත්වාගෙන යන්න ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම විශේෂ ප්‍රකාශයක් කරන්න බලාපොරොත්තු වෙන්නේ රැකියා විරහිත උපාධිධාරීන් සම්බන්ධව. රැකියා විරහිත උපාධිධාරීන් සම්බන්ධව කථා කරනවා නම්, ඊයේ පෙරේදා අපි දැක්කා අවාසනාවන්ත සිද්ධියක්. ඒ අවාසනාවන්ත සිද්ධියට හේතු ගණනාවක් තිබෙනවා. ඇත්තටම ඒ උදවිය හොඳට ඉගෙනගෙන, උපාධිය අරගෙන අද කඳුළු ගෑස් ප්‍රහාරවලට ලක් වෙනවා නම් මේකට සියලුම දෙනා වග කියන්න ඕනෑ.

ඒ සම්බන්ධව තමයි මම කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ. මම බස්නාහිර පළාත් සභාවට තමයි එක පැත්තකින් අත දික් කරන්නේ. රජයට වාගේම බස්නාහිර පළාත් සභාවට. ඒකට හේතු ගණනාවක් තිබෙනවා. බස්නාහිර පළාත් සභාවේ උපාධිධාරී විභාග තියලා 4100 ක් පාස් වෙලා අද 200 ක් වාගේ ප්‍රමාණයකට තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රැකියා ලබා දීලා තිබෙන්නේ. ඉතින් ඒ අයත් මේ ගොඩේ ඉන්නවා. එහෙම නම් අපි එවකට හිටපු ගරු ප්‍රධාන ඇමැතිතුමාට ප්‍රශංසා කරනවා. අපි අවංකව කියන්න ඕනෑ. එතුමාගේ උත්සව ගණනාවකට මම සහභාගී වුණා. හැමදාම රැකියා විරහිත උපාධිධාරීන් ඇවිල්ලා උපාධි පත්වීම් ගන්නවා. මම විපක්ෂය වෙලා සුමානයකට සැරයක් ඒ උත්සවලට යනවා. අපට දැන ගන්න ලැබුණා ඊයේ පෙරේදා අපි එක උත්සවයකට ගියා. 200 ක්ද කොහේද. ඉතින් දෙයියනේ හාරදහස් ගණනක් පාස් වෙලා. 3000 ක් 3500 ක් මට මතකයි, මහ ඇමැතිතුමා මාධ්‍යයෙන් ප්‍රකාශ කළා පත්වීම් තිබෙනවා කියලා. මේකේ කඹ ඇදිල්ලක් තිබෙනවා. අමාත්‍ය මණ්ඩලයෙන් ඉල්ලීමක් කරනවා. එහෙම නම් අමාත්‍ය මණ්ඩලයෙන් හෝ අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් හෝ නැත්නම් මධ්‍යම රජයේ කඹ ඇදිල්ලක් තුළ මේ උදවිය අද කඳුළු ගෑස් ප්‍රහාරයට ලක් වන තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

මම ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඕනෑ තරම් ගුරු පත්වීම්වල හිඟ තිබෙනවා. එවැනි තත්ත්වයක් තිබියදී කොමිෂන් සභාවෙන්ද මේක හිර වෙන්නේ? නැත්නම් වෙන කෙනෙකුගෙන්ද හිරවීමක් ඇති වෙන්නේ? නැත්නම් ගරු අධ්‍යාපන ඇමැතිතුමාගේත්, ගරු ප්‍රධාන ඇමැතිතුමාගේත් තිබෙන කඹ ඇදිල්ලක්ද? නැත්නම් අමාත්‍ය මණ්ඩලය තීන්දුවක් ගන්නේ නැති නිසාද? මොකක්ද මේකේ තිබෙන වෙනස කියන එක අපට පැහැදිලි කරන්න. යහපාලන රජයට මේක ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මෙතුමාට ප්‍රධාන අමාත්‍ය ධූරය දෙනවා නම්, අධ්‍යාපන ඇමැතිතුමාට එම ඇමැතිකම දෙනවා නම්, යහපාලනය කඩා වැටෙන්න මේක ප්‍රශ්නයක් නොවෙයිද? එහෙම නම් මෙතුමන්ලාගේ යුතුකම් බස්නාහිර පළාත් සභාවේ හරියට කරනවා නම්, මේ අයට කඳුළු ගෑස් කන්න වෙන්නේ නැහැ. 3000 ක් 4000 ක් අද මහ පාරේ මේ වාගේ තත්ත්වයට වැටෙන්න අපේ බස්නාහිර පළාත් සභාවත් වග කියන්න ඕනෑ කියන එක තමයි මම මේ වෙලාවේ ප්‍රකාශ කරන්නේ. මේක සාමූහිකව අපි හිතන්න ඕනෑ දෙයක්. එහෙම නම් මේ ප්‍රශ්නය තුළ මම සභාවෙන් ඉල්ලීමක් කරනවා. අපේ බස්නාහිර පළාතේ අධ්‍යාපනය කඩා වැටීම් සම්බන්ධව කථා කරනවා. ගුරු හිඟය සම්බන්ධව කථා කරනවා. එහෙම නම් උපාධිධාරීන් 4100 ක් විභාග සමත් වෙලා ඒ අයට රැකියා නොමැතිව තිබෙන අවස්ථාවක මම ඉල්ලීමක් කරනවා, මෙතැන ඉන්න අමාත්‍ය මණ්ඩලයෙන්. අමාත්‍ය මණ්ඩල සංදේශයක් දාලා හරි කොමිෂන් සභාව දැනුවත් කරලා හරි, කොමිෂන් සභාව මාර්ගයෙන් හරි මේ පත්වීම් ලබා දීලා රැකියා විරහිත උපාධිධාරීන්ගේ පත්වීම් ලබා දෙන්න අපේ බස්නාහිර පළාත් සභාව කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා. ඒ වාගේම ගම්පහ උපාධිධාරීන්ට සංගමයේ සංවිධායක වශයෙන් කටයුතු කරන කේ.ඩී. රුවනි මෙනෙවිය ඇතුළු කණ්ඩායමක් මාව හමු වෙන්න ආවා. ඒ අයගේ සංදේශයක්, ඒ අයගේ ලිපි ගරු ප්‍රධාන ඇමැතිතුමාට, ගරු අධ්‍යාපන ඇමැතිතුමාට යොමු කළ ලිපියත් මේ වෙලාවේ මම සභාගත කරමින්[2] තමුන්නාන්සේලා සියලුම දෙනා මාර්ගයෙන් මම ඉල්ලීමක් කරනවා බස්නාහිර පළාත් සභාවෙන් මේ සම්බන්ධව කටයුතු කරන්න කියලා. ස්තුතියි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් අපේ අධ්‍යාපන ඇමැතිතුමා සභාව දැනුවත් කරන්න ඕනෑ. මම දන්න හැටියට අනුමැතිය ලැබිලා තිබෙනවා විභාගය සමත් වුණු 491 ක් දෙනෙකුට - ඇයි ඔබතුමා මේ සභාව දැනුවත් කරන්නේ නැත්තේ? එතුමාගේ කටින් මේ ප්‍රශ්නය මතු වුණා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මට සමාවෙන්න ඕනෑ. රීති සංග්‍රහය තුළ පෞද්ගලික පැහැදිලි කිරීම් සඳහා පිළිතුරු දෙන්නට අවස්ථාවක් නැහැ. හැකියාවක් නැහැ. හැබැයි 36 (1) යටතේ මට විනාඩියකට අවසරයි. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා දැඩි ලෙස මැදිහත් වුණා. අපට ඉල්ලීම් කළා. මොකද, කොලොන්නාවේ වැරැදි වැඩ පිළිවෙළක් ගියා. අපි ගුරු

2 සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

පත්වීම් දෙන්න සියලුම ලිපි ලේඛන සකස් කරලා අවසන්. නමුත් ඒක හදිසියේ පාන් බනිස් පුච්චනවා වාගේ දෙන්න බැහැ නේ? ඒ නිසාවෙන් අපි විධිමත් විධියට ක්‍රමවේදය සකස් කරලා අවසන්. අපි මාර්තු මාසේ මුල් සතියේ පළමුවැනි පියවර සඳහා 825 ක් දෙන්න දැනට තීන්දු කරලා තිබෙනවා. තවත් ඉස්සරහාට දෙනවා. කොලොන්නාවේ ප්‍රශ්නයක් ගෙනැල්ලා මගේ අමාත්‍යාංශය ඉස්සරහා පිකටිං එකක් කරලා තිබුණා. ඒවාට උපන් මිනිහෙක් මම. මට ඒවා නම් ශත පහකට වැඩක් නැහැ. අපි වැඩ කරන මන්ත්‍රීවරු.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ඇමැතිතුමා දෙමළ මාධ්‍යයත් ඇතුළුවද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමන්ලා මට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. දෙමළ මාධ්‍ය පත්වීම්වලට අපි මුලින්වම ප්‍රමුඛත්වය දුන්නා. 157 ක්. ඉස්සරහාටත් උදව් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. අභිනවයෙන් පත් වූ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ගුණසිරි ජයනාත් මැතිතුමාට විනාඩි 05 ක අවස්ථාවක් ලබා දෙනවා.

**ගරු ගුණසිරි ජයනාත්** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක තනතුර මා වෙත ලබා දෙන්නට කටයුතු කරපු ගරු ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමාටත්, අපේ අමාත්‍ය මණ්ඩලයටත්, අමාත්‍යතුමා සහ ධුරධාරීන් සියලු දෙනාටමත්. ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන් සියලු දෙනාටමත් මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. කිසිදු බෙදීමකින්, භේදයකින් තොරව සියලු දෙනාගේ සහයෝගය මත මේ අවස්ථාවේ මට ලබා දීම සම්බන්ධයෙන්. ඒ වාගේම විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් මගේ ගෞරවය, ස්තුතිය මේ අවස්ථාවේ පුද කරනවා. මේ තනතුර ලබා දීම සම්බන්ධව සහ ලබා දුන් සහාය සම්බන්ධයෙන්. ඒ වාගේම විශේෂයෙන්ම 1997 බියගම ප්‍රාදේශීය සභාවේ පළමු සභාපතිවරයා හැටියට පත් වෙලා 2002 වසර දක්වා බියගම ප්‍රාදේශීය සභාවේ කටයුතු කරමින් 2004 වසරේ බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට පත් වෙලා එදා ඉඳන් මේ දක්වා ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් අඛණ්ඩව වාර තුනක් මේ පළාත් සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කරනවා. මම හිතන්නේ, ගරු ප්‍රධාන ඇමැතිතුමා ගම්පහ දිස්ත්‍රික්කයට අදාළ තනතුරක් හැටියට සලකා තමයි ගම්පහ දිස්ත්‍රික්කයේ මහජන නියෝජිතයෙක් හැටියට මා වෙත මෙය ලබා දුන්නේ.

විශේෂයෙන් මේ පළාත් සභාවේ තනතුරු තුනක් කොළඹත්, තනතුරු තුනක් කළුතරත්, ඒ වාගේම මගේ මේ පත්වීමත් එක්ක තනතුරු තුනක් ගම්පහ දිස්ත්‍රික්කයටත් දීමෙන් සමබරතාවය ඇති වෙනවා. ඒ අවස්ථාව ලබා දීමේදී විශේෂයෙන් ප්‍රධාන ඇමැතිතුමා මාවත්, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාත් කැඳවලා ඔබතුමන්ලා දෙන්නාගෙන් එක්කෙනෙකුට මේ තනතුර දෙනවා කියන කාරණාව සඳහන් කරපු වෙලාවේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. එතුමා එක හෙලාම කියා සිටියා, මේ තනතුර ජයනාත් මන්ත්‍රීතුමාට ලබා දෙන්න. ඔහුගේ කිසිදු විරෝධතාවයක් නැහැයි කියන කාරණාව. මම මේ වෙලාවේ එතුමාට ගෞරවයක් හැටියට මේ සභාවේ සඳහන් කරන්න කැමැතියි. ඒ වාගේම මම සතුටු වෙන්නේ ගරු සභාපතිතුමනි, මේ තනතුර මා වෙත ලබා දීමේදී - සාමාන්‍යයෙන් අපට තිබෙන අත්දැකීම් තමයි කිසියම් තනතුරක් ලබා ගැනීමේදී, තනතුර ලබන පුද්ගලයා මොන හෝ විධියේ ක්‍රියා මාර්ගයකින් උත්සාවන්ත වෙනවා ඒ තනතුර ලබා ගන්න. හැබැයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම බොහොම පැහැදිලිව සඳහන් කරන්නට ඕනෑ. මේ තනතුර ලබා ගැනීමට මම හීනෙන්වත් හිතුවෙත් නැහැ. කිසිදු උත්සාහයක් ගත්තෙත් නැහැ. ඒ ගැන මට ලොකු සතුටක්, ඒ වාගේම අභිමානයක්. ඒ නිසාම ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු ඉහත සඳහන් කරපු සියලු පාර්ශවයන් වෙත මගේ ගෞරවය පුද කරනවා. තනතුර හඹා ගියා නොවෙයි. තනතුර මා වෙත ආවා. ඒ නිසා ඒ ලැබුණු තනතුර මම විශ්වාස කරන්නේ, ගම්පහ දිස්ත්‍රික්කයේ

ජනතාවට කරපු ගෞරවයක් හැටියට තමයි මේ තනතුර මා වෙත ලබා දීම මම සලකන්නේ. ඒ නිසා තනතුරේ අභිමානය රැකෙන පරිදි විශේෂයෙන් ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගේ ඒ අවශ්‍යතාත්, මේ සභාවේ කටයුතුත්, ඒ වාගේම ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් ගම්පහ දිස්ත්‍රික්කයෙන් පත් වෙලා ඉන්න නිසා අපි සංවිධායකවරු දෙදෙනා හැටියට මේ පළාත් සභාවේ ශක්තියට, දායකත්වයට උපරිම දායකත්වය ලබා දෙන්න පුළුවන් කැප කිරීම කරනවාය කියන කාරණාව මතක් කරමින් සියලු දෙනාටම මගේ ගෞරවය පුද කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රය අනුව මීළඟට තිබෙන්නේ ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කිරීම. ඒ අනුව අද දින ශෝක ප්‍රකාශ යෝජනා දෙකක් ඉදිරිපත් කිරීමට තිබෙනවා. අපේ පළාත් සභාවේ හිටපු ගරු සභාපති ආරියරත්න ජයතිලක මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීමේ යෝජනාව සහ මෙම පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරයෙක්, ඉන් පසු පාර්ලිමේන්තු අමාත්‍යවරයකු වශයෙන් පත් වුණු ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය ඉදිරිපත් කිරීමේ යෝජනාව. ඒ අනුව මුලින්ම හිටපු ගරු සභාපතිවරයකු වූ ආරියරත්න ජයතිලක මැතිතුමාගේ අභාවය වෙනුවෙන් යෝජනාව ඉදිරිපත් කිරීම.

ඒ අනුව මම සියලුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා, ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කරන අවස්ථාවේදී සභාවේ ගෞරවය ආරක්ෂා වන ආකාරයෙන් අප අතරින් වියෝ වූ ගරු සභාපතිතුමාට අපේ ගෞරවය පළ කරමින් සභාවේ සහභාගී වන ලෙස ඉල්ලා සිටිනවා. එමෙන්ම හිටපු ගරු සභාපතිතුමාගේ සහ ගරු මන්ත්‍රීතුමාගේ ඥාතීන් අපේ ආරාධනයෙන් අද මෙම අවස්ථාවට සහභාගී වී සිටිනවා. මම ඒ සියලු දෙනාම මේ සභාව වෙනුවෙන් පිළිගනු ලබනවා.

ඒ අනුව ගරු සභානායකතුමාට ආරාධනා කරනවා, හිටපු ගරු සභාපති ආරියරත්න ජයතිලක මැතිතුමා වෙනුවෙන් ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කරන ලෙස.

# ශෝක ප්‍රකාශ යෝජනාව : I
# ආරියරත්න ජයතිලක මැතිතුමා

## MOTION EXPRESSING CONDOLENCES : I
### HON. ARIYARATHNE JAYATHILAKE, MEMBER

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාත් සභාවේ දෙවන පළාත් සභාවට ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ නියෝජනය කරමින් ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ගරු පළාත් සභා මන්ත්‍රීවරයකු වශයෙන් තේරී පත් වී එම පළාත් සභා නිල කාලය තුළ ද වසර හයකට ආසන්න කාලයක් තුළ බස්නාහිර පළාත් සභාවේ සභාපති ධූරය දරමින් පළාත් සභාවට, පළාතේ ජනතාවට ඉමහත් සේවයක් ඉටු කළ ගරු ආරියරත්න ජයතිලක මැතිතුමා නොබෝදා අභාවප්‍රාප්ත විය. බස්නාහිර පළාතේ පළාත් සභාව එතුමාගෙන් වූ සේවය අගය කරන අතර එතුමාගේ අභාවය වෙනුවෙන් වූ ස්වකීය සාතිශය සංවේගය පළ කර සිටී"* යන යෝජනාව මම මේ අවස්ථාවේදී මෙම සභාවට ඉදිරිපත් කරනවා.

ගරු සභාපතිතුමනි, ආරියරත්න ජයතිලක මැතිතුමා බස්නාහිර පළාත් සභාව නියෝජනය කරපු ඉතාමත් දක්ෂ මන්ත්‍රීවරයෙක්, සභාපතිවරයෙක් කියන එක මම පළමුවෙන්ම සඳහන් කරන්නට ඕනෑ. 1923 ජූලි මාසේ 29 වැනිදා දිවුලපිටිය උල්වලපොල ප්‍රදේශයේදී උපත ලැබූ එතුමා ජයතිලක හිටිහාමි අප්පුගේ දොන් පවුලිස් මැතිතුමාගේත්, දිසානායක මුදියන්සේලාගේ පුංචි නෝනා මහත්මියගේත් ආදරණීය පුතණුවන් හැටියට තමයි ජන්ම ලාභය ලබන්නේ. ආරියරත්න ජයතිලක මැතිතුමාට එක් සොහොයුරෙක් සහ සොහොයුරියන් තිදෙනෙක් සිටිනවා.

[ගරු සුනිල් ජයමිණි - සභානායකතුමා]

උල්වලපොල කනිෂ්ට විද්‍යාලයෙන් හා කොළඹ ආනන්ද මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලැබූ එතුමා පාසල් අධ්‍යාපනය නිම කිරීමෙන් පසු ලන්ඩන් විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය සමත්ව පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් පශ්චාත් උපාධිය ලබා අනතුරුව නීති විද්‍යාලයට ඇතුළත්ව නීතිඥවරයෙක් වශයෙන් සමත් වෙලා තමන්ගේ සේවා කටයුතු ආරම්භ කරන මහත්මයෙක්.

ඒ වාගේම 1954 අප්‍රේල් මාසේ 24 වැනිදා සෝමලතා වික්‍රමනායක මෙනෙවිය සමඟ විවාහ වන එතුමාට දයාබර දියණියන් දෙදෙනෙක්, දයාබර පුතුන් දෙදෙනෙක් සිටිනවා. දයාබර දියණියන් දෙදෙනාම ඔස්ට්‍රේලියාවේ පදිංචි වෙලා සිටින අතර, පුතුන් දෙදෙනා වැවිලිකරුවන් වශයෙන් තමන්ගේ ජීවන වෘත්තිය මේ රට තුළ පවත්වාගෙන යනවා. ආරියරත්න ජයතිලක මැතිතුමා 1947 වර්ෂයේදී සඳලංකා මහා විද්‍යාලයේ ගුරුවරයකු වශයෙන් සේවයට එක් වෙනවා. 1956 සිට 1968 දක්වා එතුමා නාරම්මල මයුරදාප මධ්‍ය මහා විද්‍යාලයේත්, කුරුණෑගල මලියදේව විද්‍යාලයේත්, මීරිගම මධ්‍ය මහා විද්‍යාලයේත් කීර්තිමත් විදුහල්පතිවරයකු වශයෙන් කටයුතු කරනවා. ආරියරත්න ජයතිලක මැතිතුමා මම විශ්වාස කරන ආකාරයට ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය තුළ ප්‍රසිද්ධ වෙන්නේ, පළමුවෙන්ම ඉතාමත් දක්ෂ විදුහල්පතිවරයකු හැටියට. ඒ වාගේම විදුහල්පතිවරයකු හැටියට කටයුතු කිරීමේ දක්ෂතාවයත්, ජනප්‍රියතාවයත් නිසා එතුමා 1970 දී එතුමාගේ සමීපතම මිත්‍රයකු හැටියට සිටි ඩඩ්ලි සේනානායක මැතිතුමාගේ ආරාධනයෙන් එක්සත් ජාතික පක්ෂයෙන් දිවුලපිටිය ආසනයෙන් දේශපාලන ක්‍රියාකාරීත්වයට එතුමා පැමිණෙනවා. 1970 පැවති මැතිවරණයට ඉදිරිපත් වෙලා එතුමාට ආසනය ජයග්‍රහණය කරන්න අවස්ථාව ලැබෙන්නේ නැහැ. නමුත් 1977 එතුමා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් දිවුලපිටිය ආසනය ජයග්‍රහණය කරලා එතුමා පාර්ලිමේන්තුවට තේරී පත් වෙනවා. ඉන් පස්සේ 1978 ගම්පහ දිසා අමාත්‍යවරයා හැටියටත් ගම්පහ දිස්ත්‍රික්කයේ දිවුලපිටිය ජනතාවට ඒ දිසා අමාත්‍ය ධුරයෙන්, මන්ත්‍රී ධුරයෙන් අති දැවැන්ත සේවයක් එතුමාට කරන්න අවස්ථාව ලැබෙනවා. 1989 දී එතුමා යළිත් වරක් ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට තේරී පත් වෙලා බණිජ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යවරයා වශයෙන් තේරී පත් වෙනවා. 1991 වර්ෂයේදී එතුමා එවකට හිටපු අග්‍රාමාත්‍ය ආර්. ප්‍රේමදාස මැතිතුමා සමඟ එරෙහි වෙලා දෝෂාභියෝගයට සහාය දක්වලා ලලිත් ඇතුළත්මුදලි, ගාමිණී දිසානායක, ජී.එම්. ප්‍රේමචන්ද්‍ර මැතිතුමන්ලා එක්ක වෙනත් දේශපාලන පක්ෂයකට සම්බන්ධ වෙලා, පක්ෂයෙන් ඉවත් වෙලා එතුමාට ඒ අවස්ථාවේත් පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය, පාර්ලිමේන්තු ආසනය පවා අහිමි වෙනවා. ඉන් පස්සේ ආරියරත්න ජයතිලක මැතිතුමා ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ බිහි කිරීමේ පුරෝගාමියකු හැටියට කටයුතු කරනවා. 1993 පළාත් සභා මැතිවරණයේදී එතුමා ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් බස්නාහිර පළාත් සභාවට තරඟ වදිනවා. 1993 ගම්පහ දිස්ත්‍රික්කයෙන් ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණෙන් මන්ත්‍රීවරු හතර දෙනෙක් තේරී පත් වෙනවා. ඒ හතර දෙනා අතරින් වැඩිම මනාප සංඛ්‍යාවක් ලබා ගෙන මේ පළාත් සභාවට තේරී පත් වෙන්නේ ආරියරත්න ජයතිලක මැතිතුමායි කියන එක මම මේ සභාවට මතක් කරන්න ඕනෑ.

ඒ නිසා ගරු සභාපතිතුමනි, ආරියරත්න ජයතිලක මැතිතුමා පිළිබඳ අතීතය මේ අවස්ථාවේදී තමුන්නාන්සේටත්, මටත්, මේ සභාවේ ඉන්න ගාමිණී තිලකසිරි අමාත්‍යතුමාටත්, රංජිත් සෝමවංශ ඇමතිතුමාටත්, මේ සභාවේ එතුමාත් එක්ක කටයුතු කරපු බොහෝ දෙනෙකුගේ අතීතයට මේ වෙලාවේ ගමන් කරනවා. අපි පළාත් සභාවට තේරී පත් වන කොට, ඇත්තටම අපි ආරියරත්න ජයතිලක මැතිතුමාව එපමණ හඳුනන්නේ නැහැ. හැබැයි, එදා පළාත් සභාවේ තීන්දුවක් ගත්තා. එතුමා පිළිබඳව නිර්ණායකයක් ඉදිරිපත් කළා, හිටපු ප්‍රධාන අමාත්‍යතුමිය වන චන්ද්‍රිකා කුමරතුංග මැතිනිය. ඒ වෙලාවේ අපට මතකයි. පළාත් සභාවේ මහ ඇමතිතුමිය හැටියට එතුමිය පත් වෙන කොට එතුමිය යෝජනා කළා. ආරියරත්න ජයතිලක මැතිතුමා කියන්නේ, දක්ෂ කෙනෙක්. ආරියරත්න ජයතිලක මැතිතුමාව මේ සභාවේ සභාපතිවරයා හැටියට පත් කරන්න ඕනෑය කියලා. ඒ වෙලාවේ ආරියරත්න ජයතිලක මැතිතුමා - මම හිතන්නේ මම නිවැරදියි. කවුරුත් එතුමාත් එක්ක තරඟයට ආවේ නැහැයි කියන එකයි මගේ විශ්වාසය. එතුමා නිතරඟයෙන් මේ සභාවේ තමුන්නාන්සේ ඉන්න පුටුවට පත් වුණා. පළාත් සභාවේ එදා ලක්ෂ්මන් නිපුණ ආරච්චි මැතිතුමා හිටියා. ආරියරත්න ජයතිලක මැතිතුමා හිටපු කාලයේ පළාත් සභාවේ හිටපු සභාපතිවරු අතර මම හිතනවා ඉතාමත්ම

රසකාමී, ඉතාමත්ම නිහතමානී සභාපතිවරයෙක් හැටියට තමයි මම ආරියරත්න ජයතිලක මැතිතුමාව දකින්නේ. පළාත් සභාවේ ප්‍රශ්න ගණනාවක් මතු වුණු වෙලාවේ ආරියරත්න ජයතිලක මැතිතුමා ඒවාට උත්තර දෙන්නේ පුටුවේ ඉඳගෙන බොහොම උස් හඬින් හිනා වෙලා, ඒ ප්‍රශ්නය තමන්ගේ ඇඟට ගන්නේ නැතිව ඒ ප්‍රශ්නය විසඳන්න එතුමාට හැකියාව තිබුණා. මම පළමුවැනි විදේශ සංචාරයට එකතු වුණේ එතුමාත් එක්ක. ගාමිණී තිලකසිරි ඇමතිතුමා, මම, රංජිත් සෝමවංශ ඇමතිතුමා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඉන්දියාවේ.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ඉන්දියාවේ. ඉන්දියාවට ගියේ ආරියරත්න ජයතිලක මැතිතුමාත් එක්ක. ආරියරත්න ජයතිලක මැතිතුමා කියපු දේවල්, කරපු දේවල් මේ සභාවේ කියන්න බැහැ. මොකද, එතුමා එපමණ රසකාමී සභාපතිවරයෙක්. අපට එතුමා කවදාවත් එක්සත් ජාතික පක්ෂයේද, ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණේද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේද කියලා - ජගත් අංගගේ මැතිතුමාත් මෙතැන ඉන්නවා. එතුමාත් හිටියා. අපට හැඟෙන්නේ නැහැ. මොකද, එතුමා හැමෝගේම සභාපතිවරයා. එතුමා පුදුම විධියට මන්ත්‍රීවරුන් එක්ක සුහදත්වයක් ගොඩ නගන්න මේ සභාව තුළ දක්ෂ වෙලා හිටියා. කිසිම ප්‍රශ්නයක් තමන්ගේ ඇඟට ගත්තේ නැති සභාපතිවරයෙක් කියන එක මම මේ සභාවේදී ගෞරවයෙන් මතක් කරන්න ඕනෑ. එතුමා මිය ගියා කියන පුවත ඇත්තටම මම දන්නේ නැහැ. මට සතියකට පමණ පසුව තමයි දැන ගන්න ලැබුණේ එතුමා මිය ගියා කියලා. එතුමාගේ අවසන් කටයුතුවලට මට සම්බන්ධ වෙන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. මම ඒ ගැන ඇත්තටම කනගාටු වෙනවා. මොකද, ආරියරත්න ජයතිලක මැතිතුමා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කළා. එක්සත් ජාතික පක්ෂයේ හිටියා. නමුත් එතුමා පළාත් සභාවට ආවාට පස්සේ මම නම් දැක්කේ, එතුමාට පක්ෂයක් නැහැයි කියන එකයි. පුදුම පරාර්ථකාමී, පුදුම හිතකාමී, පුදුම ජනහිතකාමී මනුස්සයෙක්ය කියන එක මම මේ සභාවේදී ගෞරවයෙන් මතක් කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, දැන් තමුන්නාන්සේ දන්නවා. එතුමා අවුරුදු හයක් මේ සභාවේ සභාපතිවරයා හැටියට හිටියා. හැබැයි, හිටපු කාලය තුළ මම හිතනවා, එතුමා අවුරුදු හයක් නොවෙයි, අවුරුදු හැටක් හිටියා වාගේ බොහොම දක්ෂ විධියට සභාවේ ඒ කටයුත්ත කළා. ඒ නිසා ආරියරත්න ජයතිලක මැතිතුමා වාගේ දක්ෂ පුද්ගලයෙක් අපට නැති වීම විශාල පාඩුවක් කියන එක මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. මට මතකයි. එතුමා කියලා තිබෙනවා, "මම ගම්පහ දිස්ත්‍රික්කයේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පාසල්වල විදුහල්පතිවරයෙක් හැටියට කටයුතු කළා. ඒ වාගේම මම ඩඩ්ලි සේනානායක මහත්මයා ළඟින් ආශ්‍රය කළා. මම එක්සත් ජාතික පක්ෂයට බැඳුනා. මම එක්සත් ජාතික පක්ෂය තුළ ඉන්න කොටත් මම ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කළා. වැරදි දේට වැරදියි කිව්වා. ප්‍රේමදාස මැතිතුමා එක්ක ආරවුල් ඇති වුණෙත් ඒ නිසයි." නමුත් එතුමා පක්ෂයෙන් එළියට ගිහිල්ලා, යළිත් වරක් පළාත් සභාවට ඇවිල්ලා, පළාත් සභාවේදී එතුමාගේ ගරුත්වය ආරක්ෂා වෙන්න එතුමා කටයුතු කිරීම ගැන අපි එතුමාට මේ වෙලාවේත් ගරු කරනවා.

ඒ නිසා මීට වඩා වෙලාවක් නොගනිමින් ආරියරත්න ජයතිලක මැතිතුමා වැනි ශ්‍රේෂ්ට පුද්ගලයින් ඇත්ත වශයෙන්ම දේශපාලනය තුළ සිටිය යුතු අය. හිටපු කාලයේ දේශපාලනය කරන, නවක මන්ත්‍රීවරුන්ට දේශපාලනය කියා දීපු අය. අවංක මන්ත්‍රීවරයකු හැටියට එතුමා තමන්ගේ කාර්යය ඉටු කරපු කෙනෙක් කියන එක මම මේ සභාවේදී ගෞරවයෙන් මතක් කරමින් ආරියරත්න ජයතිලක මැතිතුමාගේ අභාවය පිළිබඳව පෞද්ගලිකව මගේ සංවේගයත් මේ අවස්ථාවේදී පුද කරමින් ආරියරත්න ජයතිලක මැතිතුමාගේ ආදරණීය දියණියන් හෝ පුතුන් මේ සභාවට පැමිණ තිබෙනවා. ඒ වාගේම ඥාතීන් මේ සභාවට ඇවිල්ලා ඉන්නවා. ඒ සියලු දෙනාට මගේ සංවේගයත් පුද කරමින් ආරියරත්න ජයතිලක මැතිතුමා මම විශ්වාස කරන හැටියට එතුමාගේ ජීවිතය ඉතා සාර්ථක ජීවිතයක්. එතුමාගේ ජීවිතයේ සාර්ථකභාවය නිසා එතුමාට සමාජය ගරු කළා. ඒ නිසා එතුමාට සිංහල බෞද්ධයකු හැටියට මම මේ වෙලාවේ ප්‍රාර්ථනා කරනවා. අපි කවුරුත් ප්‍රාර්ථනා කරන ශාන්ත අමා මහා නිර්වාණ සම්පත්තිය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බෙහොම ස්තුතියි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, අපේ බස්නාහිර පළාත් සභාවේ මූලාසනය හෙබවූ කීර්තිමත් දේශපාලඥයකු, ඒ වාගේම පරිණත පරිපාලකයකු පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලැබීම මේ වෙලාවේ ඉතාමත් වටිනා දෙයක්. මමත් මතක් කරන්න ඕනෑ. අපේ සභානායක සුනිල් ජයමිණි මැතිතුමා කිව්වා වාගේ, එතුමාගේ අවසන් කටයුතුවලට අපට සහභාගී වෙන්න නොහැකි වීම පිළිබඳව අදත් අපි කනගාටු වෙනවා. අපට එතුමා පිළිබඳව එතරම්ම ලොකු ගෞරවයක් සහ ආදරයක් තිබුණා. 1993 දෙවන පළාත් සභාවේ එතුමා මූලාසනයට පත් වුණාට පස්සේ අපට එතුමා තුළින් දකින්න ලැබුණේ, ඉතාම පරිණත නායකත්වයක්. මූලාසනය තුළ ආරියරත්න ජයතිලක මැතිතුමා අසුන් ගත්තාම අපේ වචනයෙන් කිව්වා නම්, අපි ඒ කාලේ පොඩි අය හින්දා හඳ පෑව්වා වාගේ කියලා අපි කියන්නේ. මොකද, ඒ තැන්පත් බව, ඒ සෝභාව, ඒ කීර්තිය සහ ගෞරවය මූලාසනය තුළ තිබුණා. එතුමා ඉතාමත්ම හොඳ උගත් කෙනෙක්. ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් උපාධිය ලබලා, පේරාදෙණිය සරසවියට ගිහිල්ලා පශ්චාත් උපාධිය ලබලා, ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළත් වෙලා නීතිඥවරයකු හැටියට සමාජගත වුණු කෙනෙක්. එතුමා සමාජයට හුහාක් ආදරය කළ කෙනෙක් කියලා මට එතුමා පිළිබඳව පළමුවැනි අවස්ථාව මතු වෙන්නේ මෙන්න මෙතැනදී. ඒ තමයි එතුමා ගුරු වෘත්තියට එකතු වුණා. දැන් හුහක් නීතිඥවරු නීති විද්‍යාලයෙන් බැහැර වෙලා කෙළින්ම උසාවියට තමයි යන්නේ. බාර් එකට යන්නේ. ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා අමනාප වන එකක් නැහැ මම එහෙම කිව්වාට. මොකද, ඒක තමයි වෘත්තීමය තමන් තුළ තිබෙන මතය.

ඒ වාගේම මම කියන්න ඕනෑ, එතුමා දැන උගත් දේ රටට දෙන්න, දරුවන්ට දෙන්න එතුමාගේ හැකියාව සමාජගත කරන්න ආරියරත්න ජයතිලක අපේ මැතිතුමා සමත් වෙනවා. එතුමා ගුරු වෘත්තිය, මේ ලෝකයේ තිබෙන ඉතාම උසස්ම වෘත්තියට එතුමා නැඹුරු වුණා. එතුමා කුරුණෑගල මලියදේව විද්‍යාලය. අපි දන්නවා. කුරුණෑගල මලියදේව විද්‍යාලය කිව්වාම, අද මේ රටේ ඉන්න පාර්ලිමේන්තුව නියෝජනය කරන මැති ඇමතිවරු රැසක් ඉන්නවා. ඒ වාගේම මේ රටේ ඉතාම උසස් නිලතල හොබවන ප්‍රභූන් රැසක් ඉන්නවා. විවිධ අමාත්‍යාංශවල ලේකම්වරුන්, උසස් නිලධාරීන් ඉන්නවා මලියදේව විද්‍යාලයෙන් බිහි වුණු. දක්ෂ ක්‍රීඩකයෝ ඉන්නවා. ඒ වාගේම නාරම්මල මයුරපාද විද්‍යාලය. එතුමා විදුහල්පතිවරයා. එතුමා එතකොට මුලින්ම සඳලංකාවේ ගුරුවරයෙක් වුණේ. නාරම්මල මයුරපාද විද්‍යාලය, කුරුණෑගල මලියදේව විද්‍යාලය, අවසාන කාලයේ එතුමා මීරිගම මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිවරයා. එතුමා මේ සමාජයට දායාද කරපු යහපත් දරුවෝ දහස් ගණනක් ඉන්නවා. එතුමා බොහොම ප්‍රභාමත් කෙනෙක්. දැනුමෙන් පිරිලා. සමාජ අත්දැකීම්වලින් බොහොම ඉහළ අත්දැකීම් රාශියක් එකතු කර ගත් හොඳ සමාජ නායකත්වයකට පිරිපුන් කෙනෙක්. එතුමා තැනකට ගියාම එතුමා නායකයෙක් කියලා දැනෙනවා. එතුමාගේ අදහස්වලින් එතුමා කොයි තරම් විද්වත්, ඒ වාගේම යම්කිසි හැකියාවක් තිබෙන කෙනෙක්ද කියලා දැනෙනවා. ඒ නිසාවෙන් එතුමා ළඟට නායකත්වය ඉබේම ආවා. එතුමා එක්සත් ජාතික පක්ෂයේ පුරෝගාමියකු හැටියට කටයුතු කරලා තිබෙනවා. ඩඩ්ලි සේනානායක මැතිතුමා ඉන්න කාලයේ. දැන් ඉතින් ඒ දේශපාලනය නැහැ. ඩඩ්ලි සේනානායක මැතිතුමන්ලාගෙයි, බණ්ඩාරනායක මහත්තයලාගේයි දේශපාලනය දැන් ඉතින් ඉවර වෙලා තිබෙන්නේ. දැන් අපි ආපහු ඒක ගොඩනගන්න හදන්නේ. ඒ ගොඩ නගන එක තමයි අපි දැන් කරන්න ඕනෑ. ඒ පරණ දේශපාලනය ආපහු ගේන්න ඕනෑ. මේ රට යහපත් තැනකට ගෙනියන්න. මේ දූෂණ, වංචා ඔක්කොම අයින් කරලා දාන්න ඕනෑ.

ඒ නිසාවෙන් මම මතක් කරනවා. එතුමා 1991 ලලිත් ඇතුළත්මුදලි මැතිතුමායි, ගාමිණී දිසානායක මැතිතුමායි, ජී.එම්. ප්‍රේමචන්ද්‍ර මැතිතුමායි, ආරියරත්න ජයතිලක මැතිතුමායි එකතු වෙලා තමයි මේ රාජාලියා හැදුවේ. අලියාව උස්සන්න තමයි රාජාලියාව හැදුවේ. අලියාව ඉවර කරන්න. හැබැයි, අද අලියා ඉතුරු වෙලා රාජාලියා ආරියවංශ දිසානායක මැතිතුමාගේ ගෙදර පොඩි බෝඩ් එකක් තිබෙනවා. රත්මලාන පැත්තේ. ආරියවංශ දිසානායක. රාජාලියා බෝඩ් එක ආරියවංශ දිසානායක මැතිතුමා ළඟ තියෙනවා. දැන් රාජාලියා දිය වුණා. අලියා පොහොසත් වුණා. අදත් මේ පොහොසත් කරන්න හදනවා. හැබැයි, අතට ඉහළින් නම් අලියාට යන්න බැහැයි කියලා මම කියන්න ඕනෑ. අතට ඉහළින් යන්න බැහැ. නමුත් මම කියන්න ඕනෑ. ඒ නිසාවෙන් ඒ කාලයේ ආරියරත්න

ජයතිලක මැතිතුමා වේදිකාවට නැග්ගාම රස ගුලාවක්. කියන සමහර කථා. මට එක කථාවක් මතකයි. අපේ සුනිල් ජයමිණි ගරු සභා නායකතුමාත් මතක් කළා. එයින් සමහර දේවල් අපේ සභාපතිතුමාත් දන්නවා. සිංහල භාෂාවේ තිබෙන දෙයක් තමයි එක වචනයකින් ධ්වනිථාර්ථ මතු කිරීම. අර්ථ කිහිපයක් වක්‍රයෙන් දැනෙන විධියට භාෂාව භාවිතා කරන්න පුළුවන්. එවැනි දේවල් භාවිතා කළා. අපි ඇහුවා, සර් දැන් ඉතින් සර්ට ප්‍රේමදාස ජනාධිපතිතුමා ඇමතිකමක් එහෙමත් දුන්නා නේද? මේ නහින දෙහින කාලයේ මට භාරන්න පුළුවන්ද පුතේ. ඔහොම තමයි කියන්නේ. මට දුන්නා කිව්වා, භාරන ඇමතිකමක්. එහෙම නේද කිව්වේ? ඒ කියන්නේ ඛණිජ කර්මාන්ත ඇමතිකම දුන්නේ. එතුමාගේ දැන උගත්කමට තැනක් දුන්නේ නැහැ. ඛණිජ කර්මාන්ත ඇමතිකම දුන්නේ. එතුමා රසගුලාවක්. ඒ වාගේම එතුමා මේ මූලාසනයේ ඉඳලා ගත්ත බොහෝ තීන්දු ඉතාම නිවැරදියි. මම කියන්න ඕනෑ. අපි මූලාසනයට එන කොටත් ගරු සභාපතිතුමනි, එතුමාගෙන් ලැබුවා වූ ආදර්ශය ඒ පරමාදර්ශීභාවය ඉතාම හොඳින් මගේ නම් මනසේ තැන්පත් වෙලා තිබුණා. මම අදත් දුක් වෙනවා. එතුමාගේ අවමගුල් උත්සවය අපට දැනුවත් වුණේ නැහැ. අපට යන්න බැරි වුණා. ඒ නිසාවෙන් මම අද විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. එතුමා වාගේ විශිෂ්ට ගණයේ අධ්‍යාපනඥයෙක්. ඒ වාගේම පරිපාලකයෙක්. ඒ වාගේම විද්වතෙක්, ඒ වාගේම දේශපාලන සමාජය තුළ එතුමා මිනිස්සු අතර බොහොම ජන ප්‍රසාදයට ලක් වුණු කෙනෙක්. එවැනි කෙනෙකුගෙන් ලැබුවා වූ බොහෝ දේවල් මගේ දේශපාලන ජීවිතය තුළ - පරණ තුන් හතර දෙනෙක් ඉන්නවා. ඒවා අපේ ජීවිතයේ දේශපාලන ගමන ශක්තිමත් කරන්න, ආලෝක කරන්න බොහෝ සෙයින් පිටුවහල් වූ බව මතක් කරමින්, දිවංගත ආරියරත්න ජයතිලක මැතිතුමාට නිවන් සුව අත්වේවායි ප්‍රාර්ථනා කරනවා. එතුමාගේ දූ දරුවන්ටත් අපි මේ වෙලාවේ අපේ කනගාටුව, අපේ ශෝකය, අපේ සංවේගය පළ කර සිටිනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, අද දවසේ මේ සභාවේ සාකච්ඡා කරන්නේ ගම්පහ දිස්ත්‍රික්කයෙන් බිහි වූ ශ්‍රේෂ්ට දේශපාලඥයකු පිළිබඳව. එතුමාව පෞද්ගලිකව මම දැන හඳුනා ගත්තේ 1977 මහ මැතිවරණයේදී. එදා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා 5/6 ක බලයක් පාර්ලිමේන්තුව තුළ ලබා ගන්න කොට වාමාංශික බල කොටුවක් වෙලා තිබුණු ගම්පහ දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාශ 13 ක් තිබෙනවා. මේ දිවුලපිටිය කියන මැතිවරණ කොට්ඨාශය නියෝජනය කළේ එවකට සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රජයේ හිටපු බොහොම ප්‍රබල ඇමතිවරයෙක් වන ලක්ෂ්මන් ජයකොඩි ඇමතිතුමා. එතුමා රාජ්‍ය ආරක්ෂක ඇමතිවරයා හැටියට තමයි ඒ කාලයේ කටයුතු කළේ. එවැනි ප්‍රබල චරිතයක් පරාජය කරලා තමයි 1977 දී දිවුලපිටිය මැතිවරණ කොට්ඨාශය ජයග්‍රහණය කරලා එතුමා පාර්ලිමේන්තුවට පත් වුණේ. එතුමාත් එක්ක 1977 දී ගම්පහ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු බොහෝ පිරිසක් පත් වුණා. වත්තල මැතිවරණ කොට්ඨාශයෙන් ෂෙල්ටන් ජයසිංහ අපේ හිටපු තැපැල් ඇමතිතුමා. ඒ වාගේම වර්තමානයේ ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමා. දැනට මම හිතන්නේ, අපේ ඉතිරි වෙලා ඉන්න ගම්පහ දිස්ත්‍රික්කයෙන් එවකට පත් වුණු අපේ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා බියගම මැතිවරණ කොට්ඨාශය නියෝජනය කළා. මම හිතන්නේ, ඒ කාලේ ගම්පහ දිස්ත්‍රික්කයේ බොහොම ශක්තිමත් ඒ වාගේම වගකීම් දරන්න පුළුවන් දැන උගත් මන්ත්‍රීවරු බොහෝ පිරිසක් පත් වුණා.

මම මේ කියන්න උත්සාහ කළේ රංජිත් සෝමවංශ ගරු ඇමතිතුමා කිව්වා, එතුමා උපාධිධාරියෙක්. ඒ විතරක් නොවෙයි නීතිඥයෙක්. එතුමාගේ ඒ නීතිඥකමවත්, එතුමාට ලැබුණු ඒ උපාධියවත්, එතුමාගේ තිබෙන දැන උගත්කමින්වත් එතුමා කොයිම වෙලාවකවත් ඔළුව උදුම්මාගෙන ආඩම්බරයෙන් හිටපු පුද්ගලයෙක් නොවෙයි. එතුමා පාර්ලිමේන්තුවේ වැඩ කරන කාලයේ - මේ අද වාගේ නොවෙයි බොහොම සමාදානයි. මම දන්නේ නැහැ, ඒ සමාදානය අද මේ මන්ත්‍රීවරු අතර නැහැ. එතකොට තිබුණේ කේවල මැතිවරණ කොට්ඨාශ ක්‍රමය නිසා බොහොම සමාදානයි. ඒ කාලයේ මහපොළ උත්සව තියන කොට මට මතකයි, මීරිගම මහින්ද විජේරත්න මැතිතුමා අපේ උදේනගේ තාත්තා, ජෝන් අමරතුංග මැතිතුමන්ලා හැමදාම එකතු වෙනවා. ඒ එකතු වුණාම ආරියරත්න ජයතිලක මැතිතුමා තමයි අර කිව්වා වාගේ එතැන රස ගුලාවක් බවට පරිවර්තනය කරන්නේ. එතුමාගේ තිබුණු ඒ දැනුම් සම්භාරය මම හිතන්නේ, අද මැත කාලයේ හුඟක් දේශපාලඥයින්ට නැහැ. එතුමා පොත පත පරිශීලනය කරලා, සංදේශ කාව්‍ය පිළිබඳ මනා හොඳ වැටහීමක් තිබෙනවා. කවි කියන්න, ඒවා නැවත අර්ථ දක්වන්න

[ගරු සිරිකමල් පිලිෂියන් ද සිල්වා]

ඒ හිටපු මැති ඇමතිවරු අතරේ - අපි එතකොට කුඩා දරුවෝ. දේශපාලනය ආරම්භ කරපු කාලයේ. ඒවාට බොහොම රසවත් විධියට ඇහුම්කන් දෙනවා. ඒ නිසා ඒ කාලයේ වත්තල මැතිවරණ කොට්ඨාශයේ මොනවා හරි උත්සවයක් තියන කොට ජෝන් අමරතුංග මහත්තයාගෙන් අපි ඉල්ලීමක් කරනවා, ආරියරත්න ජයතිලක මැතිතුමාව මේකට ගෙන්වන්න ඕනෑය කියලා. ඒ ගෙන්වන්නේ එතුමාගේ කථාව මිනිස්සුන්ට අහන්න දෙන්න. ඒ කථාව රසවත් කථාවක් වාගේම ආදර්ශයක් ගන්න පුළුවන් කථාවක්. ඒක පැය ද, පැය එකහාමාර ද කිසිම වෙහෙසක් නැතිව ඕනෑ කෙනෙකුට ශ්‍රවණය කරන්න පුළුවන් විධියට එතුමා ඒ තිබෙන කරුණු කාරණා ඉතාම රසවත් විධියට ඉදිරිපත් කරලා කටයුතු කරනවා.

ඒ වාගේම තමයි එතුමා මම හිතන්නේ දිවුලපිටිය වාගේ මැතිවරණ කොට්ඨාශය, ග්‍රාමීය පාරවල්, බොරළු පාරවල් තිබෙන බොහොම කටුක මැතිවරණ කොට්ඨාශයක්. මේවාවල පයින් ගිහිල්ලා තමයි ඒවා සංවිධානය කළේ. ඒ නිසා තමයි එතුමා ඒ 1977 දී ජයග්‍රහණය කරලා නැවත වතාවක් මේ රටේ මනාප ඡන්ද ක්‍රමය, මේ රටේ පාර්ලිමේන්තුවට පළමුවැනි සැරේ ආපු වෙලාවේ 1989 දී එදා විජයපාල මෙන්ඩිස් මැතිතුමා, රනිල් වික්‍රමසිංහ මැතිතුමා, ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමා, ජෝන් අමරතුංග මැතිතුමා ආදී ඒ කණ්ඩායමත් සමඟ මම හිතන්නේ අද මනාප ඡන්ද හින්දා කෝටි ප්‍රකෝටි මුදල් ප්‍රමාණයක් වියදම් කරනවා. එහෙම වියදම් කරන්නේ නැතිව ආරියරත්න ජයතිලක මැතිතුමාටත් ඒ කණ්ඩායමට එකතු වෙලා පාර්ලිමේන්තුවට එන්න වරප්‍රසාදය ලැබුණා. ඒක මම හිතන්නේ, අපි හැමෝටම ආදර්ශයක්. කොහොමද එහෙම වෙන්නේ? අනික් අපේක්ෂකයෝ මන්ත්‍රී ධූරය දරන්න කෝටි ප්‍රකෝටි ගණන් මුදල් වියදම් කරන කොට මම හිතන්නේ, ඉතාමත්ම අඩුම මුදලක් වියදම් කරලා පාර්ලිමේන්තුවට පත් වෙන්න එතුමාට පුළුවන්කම ලැබුණේ එතුමා මහජනතාවගේ හදවත් තුළ සාමාන්‍ය ගැමියෙකු හැටියට ජීවත් වුණු නිසයි. ඒ වාගේම තමයි පසු කාලයක මේ පළාත් සභාවේ සභාපති ධූරය එතුමා දැරුවා. ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරමින්. අදත් ඉන්නේ අපේ ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන සභාපතිවරයෙක්. එදා මේ සභවේ හිටියා වත්තල මැතිවරණ කොට්ඨාශය නියෝජනය කරමින් ටයිටස් විමලසිරි කියලා පළාත් සභා මන්ත්‍රීවරයෙක්. මම හිතන්නේ, අපේ ගාමිණී තිලකසිරි ඇමතිතුමාට, රංජිත් සෝමවංශ ඇමතිතුමාට මතක ඇති. ටයිටස් විමලසිරි මැතිතුමා මේ සභාවේ ඉන්න කාලයේ එතකොට ආරියරත්න ජයතිලක මහත්තයා තමයි මේ සභාවේ සභාපති. පක්ෂ දෙකක හිටියේ. එක පක්ෂයක ඉඳලා කඩා ගෙන ගිහිල්ලා රාජාලියා පක්ෂයෙන් ඇවිල්ලා තමයි ආරියරත්න ජයතිලක මැතිතුමා මේ සභාවේ සභාපති වුණේ. නමුත් ගම්පහ දිස්ත්‍රික්කයේ යම් යම් ස්ථානවලදී අපි දෙගොල්ලෝ එකට හම්බ වෙනවා. මට තවම මතකයි. ටයිටස් විමලසිරි එදා හිටපු පළාත් සභා මන්ත්‍රීවරයා ආරියරත්න ජයතිලක මැතිතුමාගෙන් මේ තිබෙන රීති පිළිබඳව විග්‍රය කරමින් එකින් එක අහනවා. එතුමාට ඒවා පිළිබඳව පුදුමාකාර දැනීමක් තිබුණා. මේ සභාව කොහොමද කටයුතු කරන්න ඕනෑ. මේ සභාවේ මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් මොනවාද? වරප්‍රසාද මොනවාද? නීතිය කොහොමද? කට පාඩමින් කියන්න පුළුවන් තරම් දක්ෂතාවයක් එතුමාට තිබුණා. ඇත්ත වශයෙන්ම මම හිතන්නේ, එවැනි මන්ත්‍රීවරු බිහි වෙන්න ඕනෑ කාලයක්.

ඒ නිසා එතුමාගේ සේවය ගම්පහ දිස්ත්‍රික්කය ඉතාම හොඳින් උකහා ගත්තා. විශේෂයෙන්ම දිවුලපිටිය මැතිවරණ කොට්ඨාශය. මම අර කලින් කිව්වා වාගේ වාමාංශික බල කොටුවක් තිබුණු දිවුලපිටිය මැතිවරණ කොට්ඨාශය එක්සත් ජාතික පක්ෂයට අරන් දෙන්න, ලක්ෂ්මන් ජයකොඩි මැතිතුමා වාගේ ශ්‍රේෂ්ට, ජ්‍යෙෂ්ට ප්‍රබල ඇමතිවරයකුව පරාජය කරන්න එතුමාට හැකියාව ලැබුණේ එතුමා මේ මහපොළොවේ පය ගහලා, සාමාන්‍ය මිනිස්සුත් එක්ක ජීවත් වුණු සාමාන්‍ය ගැමියෙක් නිසා. ඒ නිසා මම හිතන්නේ, මේ සභාව පෝෂණය වුණා එතුමාගේ තිබුණු යම් අදහස්වලින්. එතුමාගේ තිබුණු වටිනාකම්වලින්. ඒ නිසා අනාගතයට යමක් ඉතිරි කරලා ගිය මන්ත්‍රීවරයෙක් හැටියට එතුමාට අපි මේ වෙලාවේ අපේ ගෞරවය පුද කරනවා. විශේෂයෙන්ම එතුමාගේ ආභාසය ලබලා, එතුමාගෙන් යම් යම් දේවල් ඉගෙන ගෙන, එතුමාගේ කථා අහලා, එතුමාගේ ඒ හැසිරීම් රටාව දැකලා ඒවා එක්ක අනුගත වුණු මන්ත්‍රීවරයෙක් හැටියට එතුමාට මේ වෙලාවේ මගේ ස්තුතිය පුද කරන අතර, මම අදහන ආගම අනුව එතුමාට මෝක්ෂ සම්පත්තියත්, එතුමා ඒ එතුමාගේ ජීවිත කාලයේ අදහපු ශ්‍රේෂ්ට බෞද්ධාගම අනුව එතුමාට අමා මහා නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, පළාත් සභා මන්ත්‍රීවරයෙක්, පළාත් සභාව තුළ ඉතාමත් කීර්තිමත් සභාපතිවරයකු හැටියට කටයුතු කරපු ආරියරත්න ජයතිලක මැතිතුමා පිළිබඳව ශෝක යෝජනාව ඉදිරිපත් වුණු මොහොතේ වචන කිහිපයක් කථා කරන්නට අවස්ථාව දුන් ගරු ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. 1933 ජූලි මාසයේ 29 වැනිදා උපත ලබපු ආරියරත්න ජයතිලක මැතිතුමා, 1947 වර්ෂය වන කොට ගුරුවරයෙක් හැටියට, ඒ වාගේම 1956 වන කොට විදුහල්පතිවරයකු හැටියට - විදුහල්පතිවරයකු කිව්වාට ඉතාමත් කීර්තිමත් විදුහල්පතිවරයෙක් හැටියටත්, 1977 වන කොට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියටත් දිවුලපිටිය ආසනය නියෝජනය කරපු ගෞරවනීය මන්ත්‍රීවරයෙක්. 1978 වන කොට ගම්පහ දිස්ත්‍රික්කයේ දිසා අමාත්‍යවරයා හැටියට අති විශිෂ්ට සේවාවක් කරලා එක්සත් ජාතික පක්ෂය යම් මොහොතක ඔහුට නිවැරදි පක්ෂයක් නොවෙයි. මේ මොහොතේ මෙයයි නිවැරදි නායකයා කියලා හිතන වෙලාවේ ලලිත් ඇතුළත්මුදලි, ගාමිණී දිසානායක, ප්‍රේමචන්ද්‍ර මහත්තයලාත් එක්ක එළියට බැහැලා, නව දේශපාලන පක්ෂයක ක්‍රියාකාරී නායකයකු වෙලා අවසානයේ 1993 වන කොට අපේ පළාත් සභාවේ මන්ත්‍රීවරයකු හැටියට මේ පළාත් සභාව නියෝජනය කළා.

මම හිතන්නේ, එක්තරා පැත්තකින් බලන කොට 1993 මේ පළාත් සභාව නියෝජනය කළ අය අතිශයින්ම වාසනාවන්තයි. මම එහෙම වාසනාවන්තයි කියලා කියන්නේ, ගුරුවරුන් හැටියට එදා පළාත් සභාවට ආපු, අපේ ගුරුවරු හැටියට වැඩ කළේ ආරියරත්න ජයතිලක මැතිතුමා ඔය මූලාසනයේ. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය, රත්නසිරි වික්‍රමනායක මැතිතුමා, ඒ.එච්.එම්. ෆවුසි මැතිතුමා, බර්නාඩ් සොයිසා මැතිතුමා වාගේ මහා ප්‍රවීණයන් විශාල පිරිසක් අපට ගුරුවරු හැටියට පෙනී සිටියා. ඔවුන් අපට වඩා මහා විශාල ජ්‍යෙෂ්ට ප්‍රතාපවත් චරිත. අපට ඔවුන්ගෙන් බොහෝ දේ ඉගෙන ගන්න තිබුණා. අපි ඔවුන්ට ජ්‍යෙෂ්ටයින් හැටියට ගරු කළා. ගරු කරලා ඔවුන්ගේ පසුපස යමින් ඔවුන් හඹා ගියා. අපි ඔවුන්ගෙන් ඉගෙන ගත්තා. ආරියරත්න ජයතිලක මැතිතුමා ටොරින්ටන් චතුරස්‍රයේ සභා කාර්යාලයේ තනි වන මොහොතක් සොය සොයා ඒ ඉස්සරා දොර ළඟින් මම එහාට මෙහාට ගිය වාර ගණන අනන්තයි. තනි වන මොහොතක එතුමාගේ කාර්යාලයට රිංගලා යම් මාතෘකාවක් යටතේ පුංචි සංවාදයකට ආරම්භයක් ඇති කළා නම් පොත් පත් දහසක් කියවලා ලබා ගන්න බැරි තරම් විශාල දැනුමක් අපට ලබා දෙන්න එතුමා ඒ මොහොතේදී සමත් වුණා. ඒ නිසා ආරියරත්න ජයතිලක වැනි ඒ ශ්‍රේෂ්ට දේශපාලඥයින්ගේ ඇසුර, ඔවුන්ට ගරු කිරීම - අදට වඩා එදා ජ්‍යෙෂ්ටයින්ට ගරු කිරීමේ ස්වභාවය හොඳින් තිබුණා. සභාවේ විනය හොඳින් පැවතුණා. මම මෙය අනිවාර්යයෙන්ම ප්‍රකාශ කරන්න ඕනෑ කාරණාවක්. සභාවේ මන්ත්‍රීවරුන් එකිනෙකාට ගෞරව කළා. තව කෙනෙකුගෙන් ඉගෙන ගන්න තිබෙන දේ ඉතාම නිහතමානීව ඉගෙන ගත්තා. ඒ තුළ බොහොම සාමකාමී පරිසරයක් ඒ සභාව තුළ දකින්න ලැබුණා. අර කිව්වා වාගේ ආරියරත්න ජයතිලක කියන්නේ, මහා දැවැන්ත, සුන්දර මනුස්සයෙක්. ඔහුගේ හැම ඉරියව්වකින්ම ඒ සුන්දරත්වය විකාශනය වුණා. දකින්න ලැබුණා. කථා කරන්න ගියාම ඉතාමත් ගෞරවනීය විධියට ආමන්ත්‍රණය කරලා අපි දරුවෝ හැටියට සලකලා ඔහු අපට බොහෝ දේ කියා දුන්නා. පසුකාලීනව දෛවෝපගතව මම මේ පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයා වන කොට එතුමාත් සමඟ මම කළ ඇසුර, එතුමා සමඟ කළ කථා බහ මට මහා දැවැන්ත ආශිර්වාදයක් බවට පත් වුණා. මම ඒක ඉතාමත් නිහතමානීව එතුමාට ගෞරවයක් වශයෙන් මේ මොහොතේ ප්‍රකාශ කළ යුතුමයි. ආරියරත්න ජයතිලක මැතිතුමා අර අපේ අනික් මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළා වාගේ තමන්ට කියන්න ඕනෑ දේ කිව්වේ, බොහෝ වෙලාවට ව්‍යංගාර්ථයකින්. ඍජුව කථා කළේ නැහැ. සිනහ මුසු මුහුණින්, ඉතාම සැහැල්ලුවෙන් තමන්ට කියන්න ඕනෑ දේ කිව්වා. ඉඳලා හිටලා දවසක තමයි කේන්ති ගියේ. කේන්ති ගියා කියන වචනයටත් ඕනෑ කෙනෙකුට හිනා යනවා. ඒ නිසා මෙවැනි අය සමඟ දේශපාලනයේ ආරම්භයක් ඇති කර ගන්න පුළුවන් වුණු එක ගැන තමයි මම කිව්වේ, අපි හරි වාසනාවන්තයි කියලා.

අද දවස වන කොට එතුමා අප අතරින් නැති වුණත් අනෙකුත් මන්ත්‍රීවරුන් කිව්වා වාගේ ඇත්තටම එතුමාගේ අභාවය පිළිබඳව බොහෝ දෙනා දන්නේ නැහැ. දන්නවා නම් මේ හැම කෙනෙකුම සහභාගී වෙනවා. ඒ තරමටම එතුමා හිටපු කෙටි කාලයේ අපිත් එක්ක බොහොම යාවජීවව ඉතාමත් හොඳින් ඇසුරට පත් වෙලා හිටියා. ආරියරත්න ජයතිලක කියන චරිතය අපේ සමාජයේ කිසිම චරිතයකට සමාන කරන්න බැරි චරිතයක්. අර කිව්වා වාගේ, ඔහුගේ තිබෙන අසීමිත දැන උගත්භාවය, විවිධ

[ගරු ජගත් අංගගේ]

ක්ෂේත්‍රවල මුහුකුරා ගිය දැනුම පුංචි දරුවෙක් වාගේ තමයි තවත් කෙනෙකුට ප්‍රකාශ කළේ. ඔහු සමඟ කථා කරන එක හරිම සුන්දරයි. ඒ නිසා අද දවසට ආරියරත්න ජයතිලක මැතිතුමා වාගේ අයගේ මහා හිඟයක් පවතිනවා. එවැනි දැන උගත්, එවැනි විනය ගරුක, එවැනි සාමකාමී මිනිසුන් අද සමාජයට අවශ්‍ය මොහොතක තමයි එතුමා අප අතරින් වියෝ වෙලා, අද ඒ චරිතය අපට අහිමි වෙලා තිබෙන්නේ. දියණියන් දෙදෙනා ශ්‍රී ලංකාවේ නොසිටියත්, ඔස්ට්‍රේලියාවේ විදේශ රටක ජීවත් වුණත්, ඒ පුතුන් දෙදෙනා මම හිතනවා, අද මේ සභාගර්භයට ආරාධනා ලැබ පැමිණ ඇති කියලා. මම හිතන්නේ ඒ දරුවෝ හරිම වාසනාවන්තයි. එවැනි කීර්තිමත් තාත්තා කෙනෙකුගේ දරුවන් වීම ජීවිතයේ මහා භාග්‍යයක්.

ඒ නිසා අපි ප්‍රාර්ථනා කරන්නේ, ආරියරත්න ජයතිලක මැතිතුමා අද අප අතරේ නැහැ. එතුමා වියෝව සිටියත් අප අදහන ආගම අනුව අපට තව ආත්මයක් හිමි බව අපි විශ්වාස කරනවා. පුනර්භවය පිළිබඳව විශ්වාස කරන, අදහන ආගමක සාමාජිකයකු හැටියට මම නම් හිතන්නේ ආරියරත්න ජයතිලක මැතිතුමා දේවත්වයට පත් වෙන්න ඇතියි කියලා. මොකද, ඔහු ඒ තරමම ඉහළ වර්ගයේ මනුෂ්‍යයෙක්. අපට කට පුරා, කට අරලා, ඉතාමත් විවෘතව පැකිළීමකින් තොරව මනුෂ්‍යයෙක් කියලා කියන්න පුළුවන් මනුෂ්‍යයෙක් තමයි ආරියරත්න ජයතිලක කියලා කියන්නේ. ඒ නිසා මම ප්‍රාර්ථනා කරනවා, එතුමා අපට කියා දුන් අකුරු අපි බොහොම හොඳින් ඉගෙන ගත්තා. අපි මේ සමාජයේ, මේ පළාත් සභාවේ ගරුත්වය රැකෙන විධියට ජීවත් වෙන්න අපි එතුමාගෙන් ඉගෙන ගත්තේ. මුල් ආරම්භයේ 1993 වර්ෂයේ සිට 1997 වර්ෂය වන තෙක් මේ පළාත් සභාව තුළදී. ඒ නිසා ආරියරත්න ජයතිලක මැතිතුමනි, ඔබතුමා සැබවින්ම අපටත් ගුරුවරයෙක්. ඔබ සැබවින්ම නිහතමානී මනුෂ්‍යත්වය පිළිබඳ පාඩම කියා දෙන්න දැන උගත් බුද්ධිමතෙක්. ඒ නිසා ඔබතුමාගේ වියෝව සමස්ත සමාජය තලයට මහා විසුම් පාළුවක්. පාඩුවක්. ප්‍රාර්ථනා කරනවා, දිසාපාමොක් ඇදුරුතුමන් වැනි ශ්‍රේෂ්ට ගුරුවරයකු වූ ඔබට ලබන්නා වූ ආත්මය - ඉතාමත් කෙටි කලකින් නිවන් දොර ඇරේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මගේ පෞද්ගලික ශෝකයත්, මේ සභාවේ ශෝකයත් ආරියරත්න ජයතිලක මැතිතුමාගේ දූ පුතුන්ට ප්‍රදානය කරමින් එතුමාට අජරාමර නිවන් සුව ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ ඉතාමත්ම ගෞරවනීය තනතුරක් තමයි සභාපති තනතුර. 1993 දී පළාත් සභා මැතිවරණය ජයග්‍රහණය කරලා, ප්‍රථමයෙන්ම මේ රටේ චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය ප්‍රධාන අමාත්‍ය ධුරයට පත් වුණු වසර. ඒක ඉතිහාස ගත වසරක්. ඒ පළාත් සභාව ගැන කථා කරන කොට අද තිබෙන පාර්ලිමේන්තුවටත් වඩා ඉහළ තැනකින් එදා පළාත් සභාව තිබුණේ. එදා හිටපු චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය, රත්නසිරි වික්‍රමනායක හිටපු අගමැතිතුමා, ඒ.එච්.එම්. ෆවුසි ඇමතිතුමා, ඉන්දික ගුණවර්ධන, සුසිල් මුණසිංහ අපේ හිටපු විපක්ෂ නායකතුමා, වජිර පැල්පිට, මහින්ද සමරසිංහ වැනි විශාල, ප්‍රබල දේශපාලන චරිත කිහිපයක්ම 1993 දී පළාත් සභාවට පැමිණියා. 1993 දී පළාත් සභා මැතිවරණය ජයග්‍රහණය කළ වැඩි පිරිසක්, 1994 දී මේ රටේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පාර්ලිමේන්තුවක් පිහිටුවලා, මේ සියලුම දෙනා ඒ රජයේ අමාත්‍යවරුන් බවටත් පත් වුණා. එවැනි පළාත් සභාවක තමයි මම පළමු වතාවට පළාත් සභාවට පැමිණියේ. ඒ දෙවන පළාත් සභාව ඉතාම සුන්දර පළාත් සභාවක් බවට පත් කරන්නට පුළුවන්කම ලැබුණේ, ඇත්ත වශයෙන්ම මේ හදවතට එකඟව කථා කරන්නේ. අපේ සභාපතිතුමා නිසයි. ගරු සභාපතිතුමනි, අද සමහර උදවිය ගැන කථා කරන්න ගියාම, අපේ සමාජය තුළ මළගෙවල්වලට ගියාම, පුද්ගලයා ගැන සමහර වෙලාවට කථා කරන්න දේවල් නැහැ. ඒ වෙනුවෙන් කථා කරන්න වෙන්නේ දරුවන් ගැන සොයලා, නැත්නම් තවත් කෙනෙක් ගැන කථා කරලා තමයි කථා කරන්න වෙලා තිබෙන්නේ. අපේ හිටපු සභාපතිතුමා පක්ෂ විපක්ෂ - මේ රටේ පළාත් සභාව නියෝජනය කළ අය පමණක් නොවෙයි, පාර්ලිමේන්තුව නියෝජනය කරපු,

ඒ වාගේම දිස්ත්‍රික්කය තුළ පක්ෂ විපක්ෂ කාගේත් ජනාදරයට පත් වුණු පුද්ගලයෙක්. 1977 කියන්නේ, මේ රටේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආසන 8 ට බැහැපු වසරක්. ඒ ගැන අමුතුවෙන් කථා කරන්න දෙයක් නොවෙයි. එදා දිවුලපිටිය මැතිවරණ කොට්ඨාශයේ ප්‍රබල චරිතයක් තමයි ලක්ෂ්මන් ජයකොඩි මැතිතුමා. එතුමාවත් පරාජය කරලා, එතුමාට පාර්ලිමේන්තුව නියෝජනය කරන්න පුළුවන්කමක් ලැබුණා. වාර දෙකක් එතුමා පාර්ලිමේන්තුව නියෝජනය කළ කෙනෙක්. බස්නාහිර පළාත් සභාවේ ඉන්න කාලය තුළ සුනිල් ජයමිණි ගරු සභානායකතුමා කිව්වා වාගේ මට මතකයි. අපි ඉන්දියානු සංචාරයට සහභාගී වුණා. ඒ ඉන්දියන් සංචාරයේදී එතුමාට තමයි මන්ත්‍රීවරු සියලු දෙනාගේ නායකත්වය ලැබුණේ. එතුමාත් එක්ක සති කිහිපයක් තුළ ගත කරපු කාල සීමාව අපට කවදාවත් අමතක කරන්න පුළුවන්කමක් නැහැ. සාමාන්‍ය ජීවිතයක පුද්ගලයෙක් විදුහල්පතිවරයෙක් වෙනවාය කියන එක ලෙහෙසි පහසු වැඩක් නොවෙයි. විදුහල්පතිවරයෙක් කියන එක හැම කෙනෙකුටම කරන්න පුළුවන් දෙයකුත් නොවෙයි. එදා එතුමා ඒ ප්‍රදේශයේ තිබෙන ජනප්‍රිය පාසල් ගණනාවක විදුහල්පතිවරයෙක් හැටියට කටයුතු කළ කෙනෙක්. එතුමා දේශපාලනයට පිවිසිලා ජයග්‍රහණය කරන්නත් සමහර විට ඒක බලපාන්න ඇති. එතුමගෙන් අධ්‍යාපනය ලබපු, එතුමාගේ ගෝල බාලයෝ මේ රටේ ඉහළ තැනක ඉන්න දරුවෝ අනන්ත අප්‍රමාණ බිහි වෙන්න ඇති. ඒක අපි දකින්නේ දේශපාලනය කරනවාට වඩා ඊට වඩා ඉහළ චරිතයක් හැටියටයි. විදුහල්පතිවරයෙක් කියන එක. ඒ නිසා විදුහල්පතිවරයෙක් හැටියට කටයුතු කරපු කාල සීමාව තුළ එතුමා දරුවන් දහස් ගණනකට ඇස් පාදන්න ඇති.

අද බස්නාහිර පළාත් සභාව තුළ එතුමා කරපු සේවය අගයනවා නම්, මිනිත්තු ගණනක් නොවෙයි දවස් ගණනක් කථා කරන්න පුළුවන්. අපි එදා එතුමා වෙනත් පක්ෂයක් නියෝජනය කරන, ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් පෙරමුණෙන් පළාත් සභාව නියෝජනය කරපු වෙලාවේ එතුමාට සභාපතිකම ලබා දෙන කොට තවත් කෙනෙකුගෙන් විරෝධතාවයක් මතු වුණේ නැහැ. අපේ සුනිල් ජයමිණි සභානායකතුමා කිව්වා වාගේ සියලුම දෙනාගේ සහයෝගය මත තමයි එතුමා සභාපති තනතුරට පත් වුණේ. එතුමා ඒ සභාපති තනතුරේ ගත කරපු කාලය අති සුන්දරයි. බොහොම ලස්සනට මේ සභාව හැසිරෙව්වා. ඇත්ත වශයෙන්ම - කවුරුවත් අමනාප වෙන්න එපා. මම හිටපු සභාපතිවරු අතර ඒ කාලයේ ඉඳලා පක්ෂ විපක්ෂ සියලු දෙනාටම එක හා සමානව වැඩ කටයුතු කරමින් බොහොම දක්ෂ අන්දමින් මේ පළාත් සභාවේ සභාපති පුටුව වර්ණවත් කරපු පුද්ගලයෙක් තමයි ආරියරත්න ජයතිලක මැතිතුමා. ඒ නිසා එතුමා පළාත් සභාව තුළ ඒ ගත කරපු කාල සීමාව අපට කවදාවත් අමතක කරන්න පුළුවන්කමක් නැහැ. 1993 පළාත් සභා මැතිවරණයෙන් අපි ජයග්‍රහණය කරපු වෙලාවේ අපට ලොකු ශක්තියක් වුණා, එතුමා අපේ පළාත් සභාව තුළ සිටීම. අනන්ත අප්‍රමාණ ප්‍රශ්න ගැටළු එන්න ඇති. ඒ පළාත් සභාව සියලු දෙනාගේම කැමැත්ත, ආශිර්වාදය මත තමයි එතුමා ඒ කටයුතු කර ගෙන ගියේ. මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ආරියරත්න ජයතිලක මැතිතුමා දේශපාලඥයකු හැටියට පළාත් සභාව නියෝජනය කළා. පාර්ලිමේන්තුව නියෝජනය කළා. අමාත්‍යවරයෙක් හැටියට කටයුතු කළා. විශාල සමාජ සේවාවක් ඉෂ්ට කරපු පුද්ගලයෙක්. මේ රටේ ඉහළම තනතුරක් හැටියට අපි සලකන විදුහල්පතිවරයෙක් හැටියට මේ රටේ දරුවන් දහස් ගණනකගේ අධ්‍යාපනය අතින් ඉහළට යන්නට ඇස් පාදපු පුද්ගලයෙකු හැටියටත් අපේ සභාපතිතුමාව අපි සිහිපත් කළ යුතු වෙනවා.

අද සුවිශේෂම දෙයක් තමයි තමන් බිහි කරන දරුවෝ. අද සමාජය දෙස බලන කොට මොන තරම් දරුවෝ - දෙමව්පියෝ දරුවන් හැටියට සමාජයට ඉදිරිපත් කළත් හොඳ දරුවෙකු සමාජයට බිහි කිරීම ඉතාමත් අමාරු කාර්යයක්. මේ දරුවන් හතර දෙනාම ඉතාමත්ම ගෞරවනීය චරිත. ඉතාමත්ම හොඳ දරුවන් හතර දෙනෙක් සමාජයට බිහි කළා. තාත්තා ගිය ගමන් මග නොගියත්, දේශපාලනයට සම්බන්ධ නොවුණත්, ඒ දරුවන් සියලුම දෙනා තාත්තාගේ ගෞරවය රකිමින් විශාල සේවාවක් මේ රට තුළත් විදේශ රටවලත් කර ගෙන යාම පිළිබඳවත් අපි සතුටු විය යුතුයි. ඒ නිසා හොඳ දරුවන් පිරිසක් බිහි කරපු ආදරණීය පියෙක්, දේශපාලඥයෙක්, ගුරුවරයෙක්, විදුහල්පතිවරයෙක් හැටියට එතුමා මේ රටට කරපු සේවාව පිළිබඳව බස්නාහිර පළාත් සභාවේදී මම මේ වෙලාවේ ඉතාමත් ගෞරවනීය ලෙස සිහිපත් කරමින් එතුමාට අජරාමර නිවන් සුව අත්වේවායි කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රථමයෙන් මම ගොඩක් ආරම්බර වෙනවා, අපේ ගරු ඇමතිවරු, ගරු මන්ත්‍රීවරු ප්‍රකාශ කරපු ඒ ශ්‍රේෂ්ට දේශපාලඥයා මේ සභාවේ හිටපු සභාපතිවරයකු වන ආරියරත්න ජයතිලක මැතිතුමා පිළිබඳව ශෝකය ප්‍රකාශ කිරීමේ යෝජනාවට කථා කරන්න අවස්ථාව ලැබීම ගැන. ඇත්ත වශයෙන්ම එතුමා කරපු සේවය, එතුමා විදුහල්පතිවරයකු හැටියට කළ සේවය, විවිධ අමාත්‍යධූර දරමින් කටයුතු කරපු සේවය පිළිබඳව එතුමාත් එක්ක කටයුතු කරපු අපේ ජ්‍යෙෂ්ට ඇමතිතුමන්ලා සහ ගරු මන්ත්‍රීතුමන්ලා ගොඩක් ප්‍රකාශ කරන්න යෙදුණා. මට එතුමා ගැන තිබෙන්නේ, මම හිතන්නේ මම අවුරුදු දහය දොළහේ වාගේ කාලයේ මතකයක්. ඒකට හේතුව තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමා දිවුලපිටිය ආසනයෙන් දේශපාලනය ආරම්භ කරලා එහි එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරයා හැටියට කටයුතු කළා. ඒ අතරතුර එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්, දිසා ඇමතිවරයෙක් සහ විවිධ තනතුරු දරන අවස්ථාවේ ඒ කාලයේ මහර ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරයා හැටියට හිටියේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී කමලවර්ණ ජයකොඩි මැතිතුමා. අන්න ඒ අවස්ථාවේ ඒ යුගයේ එතුමා පැමිණියා මහර ආසනයේ විවිධ වැඩ සටහන්වලට. කුඩා දරුවෙකු හැටියට මට ඒ අවස්ථාවලට සම්බන්ධ වෙන්න අවස්ථාව ලැබුණා. එතකොට දේශපාලනයට ඒමේ අදහසක් නොතිබුණත්, මම හිතන්නේ අද ආඩම්බර වෙනවා ඒ වාගේ චරිත හරි දැකලා අපට හැදෙන්න ගන්න දේවල් තිබීම පිළිබඳව. විශේෂයෙන් මා නියෝජනය කළ මහර ආසනයේ හිටපු මන්ත්‍රී මම ඉස්සෙල්ලා සඳහන් කරපු කමවර්ණ ජයකොඩි මැතිතුමාත් එක්ක ආරියරත්න ජයතිලක මැතිතුමා රැස්වීම් ගණනාවකට සම්බන්ධ වුණා. අපේ සුනිල් ජයමිණි සභා නායකතුමා කියපු ආකාරයට මට මතකයි, දෙපැත්ත කැපෙන හාස්‍ය වචන කියන්න හරි දක්ෂයි. මට ලොකු මතකයක් නැහැ. මට අවුරුදු දහයක් හෝ දොළහක් ඇති. නමුත් හාස්‍යජනක ආකාරයට දෙයක් පරිවර්තනය කර ගැනීමට එතුමාට දක්ෂ හැකියාවක් තිබුණා. අපි සියලු දෙනාටම අද වර්තමානයේ නියෝජනය කරන දේශපාලඥයන් හැටියට ආදර්ශයට ගත යුතු චරිතයක්. විශේෂයෙන් මේ අවස්ථාවේදී මහර ආසනයේ ජනතාව වෙනුවෙන් මම එතුමාට අපේ ශෝකය පළ කරනවා. මොකද, එතුමා වැලිපිල්ලෑව, ගනේමුල්ල, මල්වතුහිරිපිටිය මේ වාගේ ප්‍රදේශවල කමලවර්ණ ජයකොඩි මැතිතුමාත් එක්ක ගිහිල්ලා දැවැන්ත සේවයක් කරලා තිබෙනවා. මම අද උදෙත් මේ පිළිබඳව කරුණු ගන්න ඕනෑ නිසා අපේ හිටපු මන්ත්‍රී අජිත් සෙනෙවිරත්න මැතිතුමාගෙනුත්, එමෙන්ම ජයකොඩි මැතිනියටත් කථා කරලා යම් විස්තර ටිකක් ගත්තා. ඒ අවස්ථාවේදී කියවුණු කාරණා තමයි, එතුමා නිර්ව්‍යාජ ගැමියෙක්. එතුමා දේශපාලනය කියන එක ආරූඪ කර ගන්නේ නැතිව සියලු දෙනාත් එක්ක එකට බොහොම හොඳින් ඒ වැඩ රාජකාරි කර ගත් පුද්ගලයෙක්. ඒ පිළිබඳව අපි ආඩම්බර වෙනවා.

ඒ වාගේම මෙහි පැමිණ සිටින එතුමාගේ පවුලේ නියෝජිතයන්ට මම හිතන්නේ අපේ මන්ත්‍රී කණ්ඩායමෙනුත් අපේ සරත් ෆොන්සේකා මැතිතුමා ඇතුළු ඒ සියලු දෙනා වෙනුවෙනුත්, එක්සත් ජාතික පෙරමුණ වෙනුවෙනුත් විශේෂයෙන් මහර ආසනය - අපේ ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාත් ඉන්නවා. අපේ ආසනයට එතුමා කරපු සේවය වෙනුවෙනුත් එතුමාට ශෝකය පළ කරනවා. මම එතුමාට නිවන් සැප ලැබේවායි කියලා නොවෙයි ප්‍රාර්ථනා කරන්නේ. එතුමා මේ සේවය තවත් ඉදිරියට ගෙනියන්න, මේ ගම්පහ දිස්ත්‍රික්කයේ තවත් සේවය කරන්න එතුමා නැවත ඉපදිලා දේශපාලනයට පැමිණිය යුතුයි කියන මතයේ මම ඉන්නවා. එසේ කියමින් එතුමාගේ පරලොව ජීවිතය අපි ප්‍රාර්ථනා කරන විධියට - අපි මොනවා කිව්වත් ඒක කියන්න ඕනෑ. නිවන් සැප ලැබේවායි කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආරියරත්න ජයතිලක මැතිතුමා වෙනුවෙන් ගෙනෙන මේ ශෝක යෝජනාවේදී සියලුම මන්ත්‍රීවරු කිව්ව ආකාරයට එතුමා විදුහල්පතිවරයෙක්. නීතිඥවරයෙක්. ජ්‍යෙෂ්ට දේශපාලඥයකු වශයෙන් ඒ වාගේම දිවුලපිටිය ආසනය නියෝජනය කරමින්, 1977 දී ගරු ලක්ෂ්මන් ජයකොඩි මැතිතුමා වාගේ පරිපූර්ණ දේශපාලඥයෙක් පරාජය කරලා ආරියරත්න ජයතිලක මැතිතුමා බිහි වුණු ආකාරය අපි කවුරුත් දන්නවා. 1978 දිසා අමාත්‍ය ධූරය. නියෝජ්‍ය අමාත්‍ය ධූරය, රාජ්‍ය අමාත්‍යවරයකු වශයෙන් මෙන්ම බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක්, සභාවේ සභාපති වශයෙන් කටයුතු කළා. ඒ වාගේම හිටපු ජනාධිපති දිවංගත ආර්. ප්‍රේමදාස මැතිතුමා එක්ක දෝෂාභියෝගය ඉදිරිපත් කිරීමේදී ඉතා පුරෝගාමීව, අභීතව කටයුතු කරලා එතුමා එම පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරය පවා අහිමි කර ගත්තා.

කෙසේ වෙතත් 1993 දී පැවති පළාත් සභා මැතිවරණයෙන් විශිෂ්ට ආකාරයෙන් රාජාලියා ලකුණෙන් ඉදිරිපත් වෙලා විශිෂ්ට අන්දමින් ජයග්‍රහණය කළා. මට පෞද්ගලිකවම එතුමාව දැන ගන්නට ලැබුණේ, මගේ පියා වන ජී.එස්. පෙරේරා මැතිතුමා කැළණිය ආසනයේ සංවිධායක ධූරය දරන කොට එතුමා සමඟ ළඟින්ම ආශ්‍රය කළ නිසයි. එතුමා දිසා අමාත්‍ය ධූරය දරන කොට මගේ පියාගේ හැම කටයුත්තකදීම එතුමා තමයි අපේ ආසනයට ශක්තියක් වුණේ. අපේ ආසනයේ මන්ත්‍රීවරයෙක් නොමැති නිසා. කෙසේ වෙතත් ඒ වකවානුව තුළ අපි කවුරුත් දන්නවා චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය ප්‍රධාන අමාත්‍ය ධූරය දරන කොට එතුමා තමයි මේ සභාපති පුටුවේ හිටියේ. එහෙම නම් එතුමාගේ ශක්තිය තුළ ගම්පහ දිස්ත්‍රික්කයටත්, ඒ වාගේම කැලණිය, මහර ඇතුළු ඒ දිස්ත්‍රික්කයේ සියලුම ආසනවලට ශක්තියක් වුණු ආකාරය අපි දන්නවා. මට මතක් වෙනවා මගේ පියා සමඟ යම් යම් ව්‍යාපෘති ආරම්භ කරන්න, යම් යම් උත්සවවලට සහභාගී වුණු ආකාරය. අපි ඒ කාලයේ ඉතා තරුණ වියේ කටයුතු කළත් මට මතක් වෙනවා මගේ සහෝදරියගේ විවාහ උත්සවයේදී එතුමා තමයි අපේ පාර්ශවයෙන් අත්සන් කරන්න පැමිණියේ. එයට හේතු ගණනාවක් තිබුණා. මගේ පියා දේශපාලනය කිරීමත්, එතුමා සමඟ සම්බන්ධයත් නිසා තමයි සම්බන්ධ වුණේ. මට එක දෙයක් මතක් වෙනවා. ඒ විවාහ උත්සවය පැවැත්වුණේ කොළඹ ග්‍රෑන්ඩ්පාස් ශාන්ත ජෝශප් දේවස්ථානයේ. මම තමයි ලඟි ලඟියේ ඒ වැඩ කටයුතු කළේ. එතුමා අන්තිම වෙලාවේදී මේ කවුද කියලා අහලා, මේ මගේ පුතා කියන කොට එතුමා තමයි දේශපාලනයට එන්න ඕනෑ, යූ.එස් කියලා කිව්වා. මට ශක්තියක්. මම දකිනවා, එතුමා එදා දැක්කා මම යන ගමන. මම දකිනවා එදා එතුමා ඒ කරපු කර්තව්‍යය. කැලණියටත්, අපේ පවුලටත් ඉතාම ළඟින් ආශ්‍රය කරපු පුද්ගලයකු වශයෙන් එතුමා කළ සේවය නිසා තමයි මේ වාගේ විශාල මන්ත්‍රීවරු ප්‍රමාණයක් අද එතුමා වෙනුවෙන් කථා කළේ.

කෙසේ වෙතත් අද දිවුලපිටිය ආසනය ගත්තාම දිවුලපිටිය ආසනය නියෝජනය කරනවා සමන්මලී සකලසූරිය ගරු මන්ත්‍රීතුමිය. ඒ වාගේම චන්දන ජයකොඩි ගරු මන්ත්‍රීතුමා. අද ඒ දෙපළම මෙම ස්ථානයේ නොමැති වීම සම්බන්ධව අපි කනගාටුවට පත් වෙනවා. පක්ෂ භේදයෙන් තොරව ඒ ආසනය ගැන කථා කරනවා නම් ඒ දෙපළට තමයි ගොඩක් අයිතිය තිබෙන්නේ. කෙසේ වෙතත් ඉතා ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරු මොහු සම්බන්ධව අදහස් ප්‍රකාශ කළා. අපි තරුණ මන්ත්‍රීවරු වශයෙන් එතුමාගෙන් ඉගෙන ගන්න බොහෝ දේවල් තිබෙනවා. එතුමා කටයුතු කරපු ආකාරය අපේ පියා සඳහන් කරලා තිබෙනවා. එහෙම නම් ඒ අඩිතාලම තුළ මේ බස්නාහිර පළාත් සභාවේ ඉදිරි ගමනට එතුමා ශක්තියක් වුණු ආකාරය අපි දන්නවා. මම දීර්ඝ වශයෙන් අදහස් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. එතුමාට අපේ පක්ෂයේ, එක්සත් ජාතික පක්ෂයේ අපේ විපක්ෂ නායක මංජු ශ්‍රී අරංගල මැතිතුමා ඇතුළු එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමේ ශෝකය ප්‍රකාශ කරමින්, එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් ගරු මන්ත්‍රීවරු විශාල පිරිසක් ආරියරත්න ජයතිලක කියන චරිතය පිළිබඳව දීර්ඝ වශයෙන් ගුණ කථන කළා. එතුමා මේ සමාජයට, මේ රටට, දේශපාලන ක්ෂේත්‍රයට, ඒ වාගේම පළාත් සභාවට කරපු සේවාව පිළිබඳව මෙනෙහි කළා. මම හිතනවා, පවුලේ ඥාතීන් සියලු දෙනා විතරක් නොවෙයි. සභාවේ එවකට හිටපු මන්ත්‍රීතුමන්ලා, අද ඒ කථා අහගෙන ඉන්න නවක මන්ත්‍රීතුමන්ලා අපට ආඩම්බර වෙන්න පුළුවන් මෙවැනි චරිත තිබුණාද කියලා. ඒ නිසා ආරියරත්න ජයතිලක මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කිරීමේ යෝජනාව සම්බන්ධයෙන් අද දින කථා කරපු සියලුම මන්ත්‍රීතුමන්ලාට බොහොම ස්තුතිවන්ත වෙනවා. ඒ කථා ඇතුළත් නිල වාර්තාවේ පිටපතක් එතුමාගේ පවුලේ ඥාතීන්ගේ දැන ගැනීම සඳහා ලබා දෙන මෙන් මම සභා ලේකම්තුමාට දැනුම් දෙනවා.

මීළඟ ශෝක යෝජනාව හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ අභාවය වෙනුවෙන් වූ ශෝක යොජනාව. ඒ සඳහා ගරු සභානායකතුමාට අවස්ථාව ලබා දෙනවා.

## ශෝක ප්‍රකාශ යෝජනාව : II
## ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමා
## MOTION EXPRESSING CONDOLENCES : II
## HON. INDIKA GUNAWARDHANA MEMBER

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"බස්නාහිර පළාත් සභාවේ දෙවන පළාත් සභාවට පොදු ජන එක්සත් පෙරමුණ*

[ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා]

*නියෝජනය කරමින් කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ගරු පළාත් සභා මන්ත්‍රීවරයකු වශයෙන් තේරී පත් වී වසරකට අධික කාලයක් බස්නාහිර පළාත් සභාවට සහ පළාතේ මහජනතාවට ඉමහත් සේවාවක් ඉටු කළ හිටපු පළාත් සභා මන්ත්‍රී ඉන්දික ගුණවර්ධන මහතා නොබෝදා අභාවප්‍රාප්ත විය. බස්නාහිර පළාත් සභාව එතුමාගෙන් වූ සේවය අගය කරන අතර, එතුමාගේ අභාවය පිළිබඳව ස්වකීය සාතිශය සංවේගය මේ අවස්ථාවේදී පළ කර සිටී"* යන යෝජනාව මම මේ සභාවට ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ දේශපාලන ක්ෂේත්‍රය තුළ ප්‍රකට නාමයක් වූ ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමා අභාවප්‍රාප්ත වී ඇති මේ අවස්ථාවේ බස්නාහිර පළාත් සභාවේ සංවේගය පළ කිරීම අපේ යුතුකමක් වෙනවා. 1943 පෙබරවාරි 08 වැනිදා පිලිප් ගුණවර්ධන මැතිතුමාගේත්, කුසුමා ගුණවර්ධන මැතිනියගේත් පළමු දරුවා ලෙස අමර ඉන්දික ගුණවර්ධන මැතිතුමා ඉන්දියාවේදී උපත ලබනවා. ඉන්දියානු නිදහස් අරගලය සඳහා සහාය දෙන ලංකා සම සමාජ පක්ෂය නියෝජනය කරමින් පක්ෂයේ නායකයන් හැටියට පිලිප් ගුණවර්ධන මැතිතුමාත්, කුසුමා ගුණවර්ධන මැතිතුමියත් ඉන්දියාවට ගොස් ඒ අරගලයේ නිරතව සිටින අතර තමයි ඉන්දික ගුණවර්ධන මැතිතුමා ඉන්දියාවේදී උපත ලබන්නේ. ඉන්දික ගුණවර්ධන මැතිතුමාට තමුන්නාන්සේලා කවුරුත් දන්නවා. ප්‍රකට සහෝදරයින් කිහිපදෙනෙකු ඉන්නවා. ඒ තමයි ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා, දිනේෂ් ගුණවර්ධන මැතිතුමා. ඒ වාගේම ගීතාංජන ගුණවර්ධන මැතිතුමා. ඉන්දික ගුණවර්ධන මැතිතුමා කොල්ලුපිටිය මෙතෝදිස්ත විද්‍යාලයෙන් පාසල් ජීවිතය ආරම්භ කරලා, තර්ස්ටන් විද්‍යාලයට පැමිණිලා, පස් වන ශ්‍රේණියෙන් පසුව කොළඹ රාජකීය විද්‍යාලයට ඇතුළත් වෙනවා. රාජකීය විද්‍යාලයේ ඉගෙනුම ලබන කාල සීමාවේ එතුමාගේ කථිකත්වය පිළිබඳව මැනවින් පිළිඹිබු කරපු ශිෂ්‍යයකු හැටියට එතුමා පත් වෙලා රාජකීය විද්‍යාලයේ සාහිත්‍ය සංගමයේ ක්‍රියාකාරී සාමාජිකයකු බවට ඉන්දික ගුණවර්ධන මැතිතුමා පත් වෙනවා. රාජකීය විද්‍යාලයේ අධ්‍යාපනය නිම කිරීමෙන් පසු ඉන්දික ගුණවර්ධන මැතිතුමා ලයිෆ් සිග් විශ්ව විද්‍යාලයේ ජර්මනියේ කෘෂිකර්ම විද්‍යාව හැදෑරීම සඳහා ඇතුළත් වෙනවා. එම විද්‍යාලයේ කෘෂි විද්‍යාව පිළිබඳව ගෞරව උපාධියක් ලබා ගෙන ලංකාවට පැමිණෙන ඉන්දික ගුණවර්ධන මැතිතුමා ශ්‍රී ලංකා මහ බැංකුවේ පර්යේෂණ හා ග්‍රාමීය ණය අංශයේ නිලධාරියකු හැටියටත්, ඒ වාගේම රබර් පර්යේෂණ ආයතනයේ ප්‍රථම අර්ථශාස්ත්‍රඥයෙකු ලෙසත් තමන්ගේ රාජකාරී සේවය ආරම්භ කරනවා. ඉන් පසුව එතුමා, 1970 දී සමගි පෙරමුණ පිහිටුවීමත් සමග තමන් කරපු රැකියාවෙන් ඉවත් වෙලා පූර්ණ කාලීනව දේශපාලනයට පිවිසෙනවා. ඉන් පස්සේ එතුමා 1973 දී එතුමා ඉගෙන ගත් ලයිෆ් සිග් විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යාව හදාරපු වෛද්‍යවරියක් වූ පද්මිණී ගුණවර්ධන මෙනෙවිය සමඟ විවාහ වෙලා පුතුන් දෙදෙනෙකුගේ පියෙකු බවට පත් වෙනවා. 1977 මැතිවරණයේදී ඉන්දික ගුණවර්ධන මැතිතුමා කඩුවෙල ආසනයෙන් තරඟ කරනවා. එතුමා පරාජයට පත් වෙනවා. ඉන් පස්සේ එතුමා ඒ කාල සීමාවෙන් පස්සේ මන්ත්‍රීවරයෙකු නොවුණත් තමන්ගේ දේශපාලන කටයුතු මේ කොළඹ දිස්ත්‍රික්කය පුරා, රට පුරා කොමියුනිස්ට් පක්ෂය නියෝජනය කරමින් පවත්වාගෙන යනවා.

1985 වර්ෂයේදී එතුමාගේ ජීවිතයේ යම් කනගාටුදායක සිද්ධියකට එතුමා මුහුණ දෙනවා. එවකට පැවති රජය පෙරළන්න කුමන්ත්‍රණය කළාය කියලා ඉන්දික ගුණවර්ධන මැතිතුමාව 1985 දී රිමාන්ඩ් බන්ධනාගාරයට පත් කරනවා. ඉන් පස්සේ එතුමා 1993 දී අපේ දෙවැනි පළාත් සභාව ආරම්භ කරන මැතිවරණය පවත්වන කොට ඒ දෙවැනි පළාත් සභාවට ඉන්දික ගුණවර්ධන මැතිතුමා මම හිතනවා, පොදු ජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින් කොළඹ දිස්ත්‍රික්කයෙන් තරඟ වදිනවා. එදා දෙවැනි පළාත් සභාවට කොළඹ දිස්ත්‍රික්කයෙන් තරඟ කරන කොට මම හිතන්නේ ඉන්දික ගුණවර්ධන මැතිතුමා ඒ ලැයිස්තුවේ දෙවැනි ස්ථානයට පත් වෙලා බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් බවට පත් වෙනවා. එදා මේ කථා කරන මමත්, අපේ ගාමිණී තිලකසිරි ඇමතිතුමා, අපේ රංජිත් සෝමවංශ ඇමතිතුමා වැනි අය එක්ක මම හිතන්නේ අපේ පළාත් සභාවේ වැඩි කාලයක් හිටියේ ගාමිණී තිලකසිරි ඇමතිතුමාත්, මමත් එක්ක පමණයි. අවුරුද්දක පමණ කාලයක් එතුමා මේ සභාවේ හිටියා. 1993 දී මෙතුමා සභාවට පත් වෙලා චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියත් එක්ක මේ පළාත් සභාව මෙහෙයවමින් එතුමා 1994 දී මේ පළාත් සභාවෙන් ඉවත් වෙලා පොදු ජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින්ම පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වෙනවා, කොළඹ දිස්ත්‍රික්කයෙන්. පාර්ලිමේන්තු මැතිවරණයට එතුමා ඉදිරිපත් වුණාම මම හිතනවා, ඒක ජයග්‍රහණය කරලා එතුමා ඒ රජයේ කැබිනට්

අමාත්‍යවරයකු බවට පත් වෙනවා. ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යවරයා හැටියට. ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යවරයා හැටියට පත් වෙලා එතුමා මේ රටට විශාල සේවයක් කරනවා. ඉන් පස්සේ ටික කාලයක් යන කොට එතුමා ඒ අමාත්‍ය ධුරයෙන් ඉවත් වෙලා එතුමාට පැවරෙනවා, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ රජයේ නාගරික සංවර්ධන හා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය. එතුමා ඒ නාගරික සංවර්ධන හා නිවාස ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ මම හිතනවා, මේ පළාතට විශාල සේවයක් කළා. මේ පළාතේ ජනතාවට. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා දන්නවා. මම හිතනවා, කොට්ටාව රිමාන්ඩ් හෝම් එක, ඒ කාලයේ මෙතුමා ඇමතිවරයා හැටියට ඉන්න කාලයේ, ඒක ජනතා අයිතියට පවරන්න ඕනෑය කියලා නැවත රජයට ලබා දෙන්න ඉන්දික ගුණවර්ධන මැතිතුමා ඒ කාලයේ මුල් වෙලා කටයුතු කළා. එතුමා නාගරික සංවර්ධන අමාත්‍යවරයා හැටියට මධ්‍යම රජයේ හිටියේ. ඒ කාලයේ එතුමා ඒකට විශාල සහයෝගයක් ලබා දුන්න කෙනෙක්. මොකද, ඒ ඉඩම කොට්ටාව නගරය දියුණු කරන්න අවශ්‍යයි කියන මතයේ හිටියා. මම දන්නවා, ඉන්දික ඇමතිතුමා ඒ වෙලාවේ ඒකට විශාල සහයෝගයක් ලබා දුන්නා, ඒක ඉටු කර ගන්න. ඒ වාගේම ඉන්දික ගුණවර්ධන අමැතිතුමා කොමියුනිස්ට් පක්ෂය නියෝජනය කළත් ගමේ අනෙකුත් දේශපාලන පක්ෂ එක්කත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එක්කත් නිතරම බොහොම සමඟියෙන් කටයුතු කරපු නායකයෙක්.

ඒ වාගේම ඉන්දික ගුණවර්ධන ඇමතිතුමා අපි දන්නවා, දෙවැනි වර චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය මේ රටේ ජනාධිපති තරගයට ඉදිරිපත් වුණු වෙලාවේ, ඒ අරගලයේ විශාල බරක් කරට අරගෙන එතුමියගේ ජයග්‍රහණය සඳහා ඒ අවස්ථාවේ බොහෝ කැප කිරීමක් කළා. යළිත් දෙවැනි වරටත් ඒ මැතිතුමා පාර්ලිමේන්තුවට තේරී පත් වුණාට පස්සේ චන්ද්‍රිකා කුමාරතුංග රජයේ මට මතකයි, දෙවැනි වර එතුමා තොරතුරු තාක්ෂණ සහ උසස් අධ්‍යාපන ඇමතිවරයා හැටියට ඒ කැබිනට් මණ්ඩලයේ පත් වෙනවා. ඒ පරිවාස ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයට එතුමා පත් වෙන්නේ ඇමතිවරු 20 කට සීමා වෙන කොට. අද වාගේ ඇමතිවරු විශාල ගණනක් හිටියේ නැහැ. ඒ 20 ට සීමා වන කොටත් එදා ඒ පරිවාස ආණ්ඩුවේ එතුමා ඇමතිවරයෙක් හැටියට තේරී පත් වෙනවා. තොරතුරු තාක්ෂණ සහ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට. ඒ නිසා එතුමා මේ රටේ ජනතාව පිළිගත් පවුලක සාමාජිකයකු හැටියට දේශපාලනයට පිවිසිලා, තමන්ගේ නම කැත කර ගත්තේ නැහැ. දේශපාලනයෙන් යමක් හම්බ කර ගත් කෙනෙක් නොවෙයි එතුමා. දේශපාලනය නිසා තමන්ගේ තිබුණු යමක් නැති කර ගත් අය අතර කෙනෙක් තමයි ඉන්දික ගුණවර්ධන මැතිතුමාත්. එතුමා නිතරම වමේ දේශපාලනයට පන්නරය ලබා දෙමින්, වමේ දේශපාලනය මේ රටේ ඉස්සරහාට ගේන්න ඕනෑය කියන මතයේ සිටිමින් මුල ඉඳලාම තමන්ගේ මතය ජයග්‍රහණය කරන්න කටයුතු කළ කෙනෙක්. සමහර අවස්ථාවල අපි එතුමාගෙන් අහනවා තමුන්නාන්සේ වමේ ඉඳලා ඇයි තමුන්නාන්සේ මේ දක්ෂිණාංශිකයි කියන, මධ්‍යස්ථයි කියන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක එකතු වුණේ කියලා. එතුමා කියනවා, මේ වෙලාවේ සතුරා පරාජය කරන්න එසේ නොකර වෙන කරන්න දෙයක් නැහැ. ඒ නිසා මම මේ වෙලාවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එක්ක කටයුතු කරනවාය කියලා පෞද්ගලිකව මා එක්ක කියලා තිබෙනවා. ඒ නිසා එවැනි, වමේ දේශපාලන අදහස් තිබුණු, වැදගත් පවුලකින් ඇවිල්ලා දේශපාලනය බොහොම හොඳට කරලා, තමන්ගේ තිබුණු දේ නැති කර ගත්ත හොඳ අවංක දේශපාලන නායකයෙක්. අපි දන්නවා ඉන්දික ගුණවර්ධන මැතිතුමා. අවසාන කාලයේ යම් ප්‍රමාණයකට රෝගීව හිටියා. ඒ රෝගීව හිටියත් එතුමා තමන්ට පුළුවන් හැම අවස්ථාවකදීම - මම දන්නවා, අසනීප තත්ත්වයෙන් හිටියත් තමන්ගේ හිතවතෙකු මිය ගියොත් ඒ මළ ගෙදරට ගිහිල්ලා සම්බන්ධ වෙනවා. තමන්ට යන්න ඕනෑ උත්සවයක් තිබුණොත් ඒ උත්සවයට එතුමා යනවා.

ඒ වාගේම තමන් ප්‍රිය කරන නායකයකු ඒ පළාතට ආවොත් ඉන්දික ගුණවර්ධන මැතිතුමා තමන්ගේ අසනීප තත්ත්වය බලන්නේ නැහැ. එතැනට ගිහිල්ලා ඒ නායකයා එනකල් ඉඳලා ඒකට සහයෝගයක් ලබා දෙනවා. ඒ වාගේම තමන් උපන් බොරළුගොඩ ප්‍රදේශයේ නිරන්තරයෙන්ම දුප්පත් ජනතාවට ඕනෑ වෙලාවක ගිහිල්ලා කිව්වොත් ඉන්දික ඇමතිතුමාට, මට පොඩි කරදරයක් තිබෙනවාය කියලා. ඉන්දික ඇමතිතුමා කාරුණික වෙනවා, ඒ යන කෙනාට උදව්වක් කරන්න. ඒ බොරළුගොඩ සහ ඒ පළාතේ ජනතාව දන්නවා ඇමතිතුමාගේ ගතිය ඒ තිබෙන බව. ඕනෑ කෙනෙකුට තමන්ගේ තිබෙන දේ දීලා හරි එයා සතුටු කරන ගතියක් තිබුණා. ඒ නිසා දේශපාලනයේ හිටපු සැබෑ මහත්මයෙකු කියන එක මම මේ වෙලාවේ ගෞරවයෙන් මතක් කරන්න ඕනෑ.

[ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා]

ඒ නිසා ඉන්දික ගුණවර්ධන මැතිතුමා වමේ දේශපාලනයේත්, ඒ වාගේම මේ රටේ - කවුරුත් මාත් එක්ක අමනාප වෙන්න එපා. එක්සත් ජාතික පක්ෂ විරෝධී දේශපාලනයේත් පතාක නායකයකු හැටියට හිටියාය කියන එක මම මේ සභාවේ ගෞරවයෙන් මතක් කරමින් ඉන්දික ගුණවර්ධන මැතිතුමාට අපි ගරු කරනවා. මේ සභාවේ අවුරුද්දක පමණ කාලයක් එතුමා හිටියේ. ඒ අවුරුද්දක කාලය තුළ එතුමා සභාව තුළත් ඉතා දක්ෂ මන්ත්‍රීවරයකු හැටියට ඒ කටයුත්ත කළා. පාර්ලිමේන්තුව තුළත් ඒ කටයුත්ත කළා. ඒ නිසා එතුමාට අපේ ගරුත්වය යළිත් පුද කරමින්, ඉන්දික ගුණවර්ධන මැතිතුමාට බෞද්ධයකු හැටියට සසර අවසානයේ ශාන්ත අමා මහා නිර්වාණ සම්පත්තිය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් ඒ පවුලේ සියලු දෙනා වෙත මගේ සංවේගය යළිත් පුද කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දීර්ඝ කාලයක් දේශපාලන ජීවිත ගමන් මගේ හිටපු පවුලක ප්‍රධාන පළමුවැනිම වැඩිමහල් දරුවා හැටියට ඉන්දික ගුණවර්ධන මැතිතුමා විශේෂයෙන්ම අවිස්සාවේල්ල මැතිවරණ කොට්ඨාශය නියෝජනය කළත්, මැතිවරණ කොට්ඨාශ ගණනාවකම එතුමාගේ සේවය, එතුමාගේ හිතවතුන්, එතුමාගේ පක්ෂය ඉහළ තැනකට ගෙනෙන්නට වැඩ කරපු නායකයෙක් කියන එක මම මේ අවස්ථාවේදී පළමුවෙන්ම ප්‍රකාශ කළ යුතුයි. ඉන්දික ගුණවර්ධන මැතිතුමා මගේ හෝමාගම මැතිවරණ කොට්ඨාශයට අල්ලපු මැතිවරණ කොට්ඨාශයේ. අවිස්සාවේල්ල. එතුමා බස්නාහිර පළාත් සභාවට පත් වෙලා, 1993 දී - මම ආරියරත්න ජයතිලක මැතිතුමාගේ ශෝක ප්‍රකාශ යෝජනාවේදී සඳහන් කළා. ඉන්දික ගුණවර්ධන මැතිතුමාත් එදා පළාත් සභාවේ හිටියා. ඇත්තෙන්ම 1993 පළාත් සභාව නියෝජනය කරපු මන්ත්‍රීවරු දෙදෙනෙක් වෙනුවෙන් තමයි අද අපට කථා කරන්න සිද්ධ වුණේ. එදා ආරියරත්න ජයතිලක මැතිතුමා මූලාසනයේ ඉන්න කොටත්, එතුමා මේ බස්නාහිර පළාත් සභාව නියෝජනය කරමින් චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය ප්‍රධාන අමාත්‍යවරිය හැටියට ඉන්න කොටත් බස්නාහිර පළාත් සභාවේ වර්ෂයක කාලයක් හිටියත්, විශේෂයෙන්ම බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට ටික කලක් හිටියත්, එතුමාගේ දේශපාලන දර්ශනය බස්නාහිර පළාත් සභාව තුළ මුවහත් කරන්නට එතුමා යම්කිසි වැඩ කොටසක් ඉෂ්ට කළාය කියන එක මම සඳහන් කරන්න ඕනෑ. අපේ සභානායකතුමාට සිය කථාවේදී යම්කිසි අතපසුවීමක් වුණත්, මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ කාරණාවක් තිබෙනවා. හෝමාගම මැතිවරණ කොට්ඨාශය සහ කැස්බෑව මැතිවරණ කොට්ඨාශය පිළිබඳව. සම්පූර්ණයෙන්ම ජලය ලබා දීමට කටයුතු කළේ ඉන්දික ගුණවර්ධන මැතිතුමාය කියන එක මම මේ අවස්ථාවේදී සඳහන් කළ යුතුයි. එදා, විශේෂයෙන්ම ජල ප්‍රශ්නය උග්‍ර අතට පැමිණිලා තිබුණු වකවානුවක මේ මැතිවරණ කොට්ඨාශ දෙකේ ප්‍රධාන ජල කුළුණු ගණනාවක් පිහිටලා ජලය ලබා දීමට එතුමා කටයුතු කළාය කියන එක මම විශේෂයෙන්ම සඳහන් කළ යුතුමයි. හෝමාගම, ඒ වාගේම මත්තේගොඩ. විශාල ජල කුළුණු හදලා ඒ ප්‍රදේශයේ ජලය නැති ජනතාව වෙනුවෙන් පානීය ජලය ලබා දීමට ලොකු සේවාවක් ඉෂ්ට කරපු කෙනෙක් කියන එක මම පළමුවෙන්ම සඳහන් කරන්න ඕනෑ. මෙතුමාගේ පවුලේ සියලු දෙනාම දේශපාලඥයින්. ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා, දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, ගීතාංජන ගුණවර්ධන මැතිතුමා. මේ සිය පවුලම, දෙමව්පියන් ඇතුළු සිය පවුලම දේශපාලන වශයෙන් හරි හම්බ කර ගත් මිනිස්සු නොවෙයි. ඒක මම වර්තමානයේ විශේෂයෙන්ම සඳහන් කළ යුතුයි. දේශපාලන වශයෙන් මොන තරම් දේශපාලනයේ ඉහළ තැනක හිටියත් හරි හම්බ කර ගත් මිනිස්සු නොවෙයි. දේශපාලන වශයෙන් කොමිස් ගහපු මිනිස්සු නොවෙයි. ජනතා සේවයටම කැප වුණා ඇරෙන්න, එතුමන්ලාගේ අතින් යම්කිසි සේවාවක් ඉෂ්ට කරන්න තිබුණා නම් ඒක කළා.

හැබැයි, ඉන්දික ගුණවර්ධන මැතිතුමා යම් තීන්දුවක් ගත්තොත් ඒ තීන්දුව ලේසියෙන් වෙනස් කරන්නේ නැහැ. යමක් ප්‍රකාශ කළොත් ඒ කටයුත්ත අනිවාර්යයෙන්ම ඉෂ්ට කරනවා. යමක් ප්‍රකාශ කරන්නේ බොහොම කලාතුරකින්. අපි යම්කිසි දෙයක් කිව්වාම, බොහොම කල්පනාකාරීව ඉඳලා හරි ගාමිණී අපි ඒක කරලා දෙන්නම්. ලබන සුමානේ මම වැඩේ ලෑහැස්ති කරන්නම් කියලා කියනවා. ඒ වාගේ යම්කිසි දෙයක් කිව්වොත් කවදාවත් ඒක නොකර

හිටපු කෙනෙක් නොවෙයි. චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ රජයේ දෙවතාවක් අමාත්‍ය ධූර ගණනාවක්ම දරපු පුද්ගලයෙක්. ඒ නිසා ඒ අවුරුදු කිහිපය තුළ එතුමා දේශපාලනයේ කොයි තරම් කාල සීමාවක් කළත්, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ කාල වකවානුව තුළ පාර්ලිමේන්තුව තුළ විවිධ අමාත්‍යධූර දරමින් මේ කොළඹ දිස්ත්‍රික්කය තුළ විශාල වැඩ කොටසක් ඉෂ්ට කරපු ගරු අමාත්‍යවරයෙක්ය කියන එක මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනැ. දේශපාලන වශයෙන් අපි එදා බස්නාහිර පළාත් සභාවේ හිටියා. මම ඒකයි කිව්වේ, 1993 බස්නාහිර පළාත් සභාවේ පාර්ලිමේන්තුවට හා සමානම පුද්ගලයෝ ටිකක් හිටියේ. චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය මේ රටේ අගමැති වෙලා, ජනාධිපති වෙන කොට රත්නසිරි වික්‍රමනායක මැතිතුමන්ලා එදා අගමැති තනතුරට පත් වෙන කොට, ඒ වාගේ විවිධාකාර පක්ෂවල හිටපු ප්‍රධාන පෙළේ පිරිසක් තමයි 1993 පළාත් සභාව නියෝජනය කළේ. මෙතුමාට මේ පළාත් සභාව නියෝජනය කරන්න පුළුවන්කමක් ලැබුණේ එක අවුරුද්දක් පමණයි. ඒ නිසා ඒ කාලය තුළ බස්නාහිර පළාත් සභාව වෙත කරන ලද සේවාවන් ඇගයීම සඳහා තමයි අද එතුමාව සිහිපත් කරලා අපි යම්කිසි වචන ස්වල්පයක් කථා කරන්නේ.

මම කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියටත්, පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියටත් එතුමාගේ අවමංගල්‍ය උත්සවය වෙලාවේ අපි සියලු දෙනාම සහභාගී වුණා. විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනැ. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඒ අවමංගල්‍ය උත්සවයට සහභාගී වුණා. පක්ෂ පාට භේදයකින් තොරව දේශපාලඥයෝ විශාල පිරිසක් සහභාගී වෙලා ඒ අවමංගල්‍ය කටයුතු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඉතාමත්ම හොඳින් සිදු කිරීමට කටයුතු කළා. අපි සියලුම දෙනා සහභාගී වුණා. එතුමා මේ දේශපාලන ක්ෂේත්‍රය තුළ බස්නාහිර පළාත් සභාවේ ගත කරපු ඒ අවුරුද්දක් වැනි කෙටි කාලයක් තුළ අපි සියලු දෙනා සමඟ සාමූහිකව එකට වැඩ කිරීමෙන් එතුමා අතින් ඉෂ්ට වෙන්න තිබුණු සේවය එතුමා ඉෂ්ට කළා. අපි ඒ පිළිබඳව නැවත වතාවක් සිහිපත් කරමින් එතුමාට අජරාමර නිවන් සුව අත්වේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ වනවා ඇති.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Lalith Ellawala M.P.C took the Chair*

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දික ගුණවර්ධන හිටපු පළාත් සභා මන්ත්‍රීතුමා, ඒ වාගේම හිටපු අමාත්‍යතුමාගේ ශෝක යෝජනාව ඉදිරිපත්ව වුණු, එතුමා වෙනුවෙන් බස්නාහිර පළාත් සභාවේ ශෝකය ප්‍රකාශ කරන මේ වෙලාවේ එතුමා වෙනුවෙන් අදහස් ප්‍රකාශ කරන්න මේ අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දික ගුණවර්ධන අමාත්‍යතුමා පිළිබඳව අදහස් ප්‍රකාශ කරන වෙලාවේ අපි කියන්නට ඕනැ, ලංකාවේ දේශපාලනයේ මහජන මන්ත්‍රීවරු සහ දේශපාලඥයෝ කියලා කොටස් දෙකක් ඉන්නවා. ඉන්දික ගුණවර්ධන මැතිතුමා වැටෙන්නේ මහජන මන්ත්‍රීවරයා කියන භූමිකාවට නොවෙයි. එතුමා වැටෙන්නේ ලාංකීය දේශපාලනයේ අපට මුණ ගැහෙන දේශපාලඥයා කියන භූමිකාවට. එතුමා මත තිබුණු සමාජ වගකීම, එහෙම නැත්නම් එතුමා මත තිබුණු සමාජ කියවීම ඉතාම නිවැරදිව තේරුම් අරන් මේ සමාජ සංවර්ධනය වෙනුවෙන් මහා කාර්යභාරයක් ඉෂ්ට කරපු දැවැන්ත දේශපාලන යුග පුරුෂයෙකුගේ අභාවය තමයි ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ අභාවයත් එක්ක අපට සනිටුහන් කරන්න සිද්ධ වෙන්නේ. මම විශ්වාස කරනවා, අද වාගේ කාල වකවානුවක ඉන්දික ගුණවර්ධන දේශපාලන චරිතයේ වැදගත්කම මේ ලාංකීය දේශපාලන භූමියට වඩාත් අවශ්‍ය වන කාල වකවානුවක තමයි එතුමා දේශපාලනයෙන් සමු ගන්නේ. විශේෂයෙන්ම ජනවාර්ගික අර්බුදය පිළිබඳව කථා කරද්දී, මේ රටේ ජනවර්ගවලට අවශ්‍ය කරලා තිබෙන දේශපාලන නිදහස, සාමය, ඒ වාගේම ලාංකීය පුරවැසියෝ සියලු දෙනාට අවශ්‍ය කරන සාමය මේ රටට දිනා ගැනීම සඳහා වූ මහා කාර්යභාරයක් ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ දේශපාලන ඉතිහාසය තුළ එතුමා කරලා

[ගරු මහේෂ් අල්මේදා]

තිබෙනවා. ඒ වාගේම තමයි අදටත් ජනවාර්ගිකයන් ලබා තිබෙන දේශපාලන නිදහස නිවැරදිව තහවුරු වෙලා නැති කාලයක යුද්ධය අවසන් වෙලා තිබුණත්, මේ රටේ බොහෝ ජනවර්ගවලට දේශපාලනිකව නිදහස තහවුරු වෙලා නැති වෙලා තිබෙන කාල වකවානුවක එය තහවුරු කර ගන්න, වඩා වැදගත් දේශපාලඥයකු විධියට එතුමා මේ ලාංකීය භූමිය තුළ ඉන්නට ඕනෑ කාල වකවානුවක තමයි එතුමා සමු ගත්තේ කියන කාරණය අපි මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දික ගුණවර්ධන මැතිතුමා දේශපාලනය කරන්නේ රෝස මල් යහනාවක නොවෙයි. එතුමා දේශපාලනය කරන්නේ කටුක සිරමැදිරිවල. ඒ වාගේම සිත් මානසික පීඩා ගෙනෙත් දෙන සිර නිවාස අඩස්සිවල තමන්ගේ ජීවිතය ගත කරමින් තමයි ලාංකීය දේශපාලන භූමියේ එතුමා දේශපාලනය කරන්නේ. අපි සියලු දෙනා දන්නවා, ලංකාවේ දේශපාලනයේ පළමු විප්ලවවාදියා, පළමු මාක්ස්වාදියා, පළමු කොමියුනිස්ට්වාදියා වුණු පිලිප් ගුණවර්ධන මැතිතුමාගේ ජ්‍යෙෂ්ට පුත්‍ර රත්නය විධියට තමයි එතුමා මෙළොව එළිය දකින්නේ. ලාංකීය දේශපාලන භූමිය තුළ දේශපාලනය කරපු පවුල් පරම්පරාවල බොරළුගොඩ පරම්පරාවට ලැබෙන්නේ සුවිශේෂ ස්ථානයක්. මේ රටේ දේශපාලනයේ තමන්ගේ සමාජ වගකීම රටේ ජනතාව වෙනුවෙන් නිවැරදිව ශක්තිමත්ව ඉෂ්ට කරන දේශපාලන පරම්පරාවක තමයි එතුමා උපත ලබන්නේ. නමුත් එතුමාගේ උපත, එතුමාගේ ළමා කාලය ඔවුන්ගේ පවුල් පරම්පරාව තරම් ඉතාම සුන්දර එකක් බවට පත් වෙන්නේ නැහැ. අපි සියලු දෙනා දන්නවා. 1935 අවුරුද්දේ ලංකා සම සමාජ පක්ෂය බිහි වුණාට පස්සේ, විශේෂයෙන් සම සමාජ පක්ෂයේ නායකයෝ හේවාගම් කෝරළයේත්, තුන් කෝරළයේත් ගෙන යන දේශපාලන ව්‍යාපාරවලදී මේ රටේ අධිරාජ්‍යවාදීන්ට සම සමාජ නායකයෝ හිසරදයක් බවට පත් වෙනවා. ඒ නිසා සම සමාජ නායකයෝ අත්අඩංගුවට ගන්නවා, 1940 දී. එහිදී පිලිප් ගුණවර්ධන මැතිතුමා අත්අඩංගුවට පත් වෙනවා කුසුමා ගුණවර්ධන මැතිනියත් එක්ක. එතුමා 1942 දී බෝගම්බර සිර ගෙදරින් පැනලා යන්නේ, ඒ වන කොට ඉන්දියානු නිදහස් අරගලය ඉන්දියාවේ ක්‍රියාත්මක වෙමින් තිබුණු නිසා. ඉන්දියානු නිදහස් අරගලයට නායකත්වය දෙන්නත්, ලංකාවේ දේශපාලන සිරකරුවෝ විධියට තවදුරටත් ජීවත් වෙන්න බැරි නිසාත්. ඉන්දියාවේදී තමයි 1943 පෙබරවාරි මාසේ 08 වැනිදා ඉන්දියාවේ මාතුංගා කියන කඳුකරයේ ෆායි දොස්තර මහත්තයාගේ පෞද්ගලික රෝහලේ ඉන්දියාවට ගිහිල්ලා ජෝශප් ගුරුසාමි සහ මේබල් ගුරුසාමි විධියට නම් වෙනස් කර ගෙන හිටපු පිලිප් ගුණවර්ධන මැතිතුමාගේ සහ කුසුමා ගුණවර්ධන මැතිනියගේ ජ්‍යෙෂ්ට පුත්‍ර රත්නය විධියට මෙලොව එළිය දකින්නේ. හැබැයි, එතුමාට තමන්ගේ ජීවිතයේ ළමා කාලයේ නිදහස් දරුවෙක් විධියට දිවි ගෙවන්න වෙන්නේ මාස පහක් විතර කාලයක් තුළදී. 1943 ජූලි මස 22 වැනිදා අධිරාජ්‍යවාදීන් විසින් පිලිප් ගුණවර්ධන මැතිතුමාව ඉන්දියාවේදී භාරබාරයට ගන්නවා. අධිරාජ්‍යවාදීන් පිලිප් ගුණවර්ධන මැතිතුමා භාරබාරයට ගත්තාම හිරේ ළදරුවකු විධියට ඉන්දික ගුණවර්ධන මැතිතුමාට ජීවත් වෙන්න තමන්ගේ ළමා කාලයේ සිද්ධ වෙනවා. ඉන් අනතුරුව ලංකාවට ඇවිල්ලා නිදහස හම්බ වුණාට පස්සේ තමන්ගේ මෑණියන් එක්ක ලංකාවට ඇවිල්ලා ලංකාවේ නිදහස් පරිසරයක දරුවෙකු විධියට ජීවත් වෙන්න හම්බ වෙන්නේ. එතුමා කොල්ලුපිටිය මෙතෝදිස් විදුහලෙන් - සම සමාජ පක්ෂ කාර්යාලය ළඟ තිබෙන ඉස්කෝලේට. එතුමාගේ ළමා කාලයේ ඒ ඉස්කෝලයට යනවා. ඊට පස්සේ තර්ස්ටන් විද්‍යාලයට ඇවිල්ලා පහ වසර ශිෂ්‍යත්වය සමත් වෙලා කොළඹ රාජකීය විද්‍යාලයට එනවා. කොළඹ රාජකීය විද්‍යාලයේ ඉන්දික ගුණවර්ධන ඇමතිතුමාගේ දේශපාලනයේ ආරම්භය සනිටුහන් වෙනවාය කියලා කිව්වොත් නිවැරදියි. එතුමා රසකාමියෙක්. සාහිත්‍යකාමියෙක්. එතුමා වයලීන් වාදනයට, සිතාර් වාදනයට, සාහිත්‍ය සංගමයට, නාට්‍යවලට සියල්ලට රාජකීය විද්‍යාලය තුළ සම්බන්ධ වෙනවා. එතුමා රාජකීය විද්‍යාලය ඇතුළේ රෙද්දයි බැනියමයි ඇඳපු, රාජකීය විදුහලේ රෙද්දා විධියට තමයි ප්‍රසිද්ධ වෙන්නේ. එතුමා රෙද්දයි බැනියමයි ඇඳපු ශිෂ්‍ය නායකයකු විධියට රාජකීය විද්‍යාලයේ ඉස්සරහා එනවා.

1963 අවුරුද්දේ ලංකාවේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ගේ ශිෂ්‍යාධාර මුදල වැඩි කරන්නය කියලා දැවැන්ත පෙළපාලියේ ශිෂ්‍ය අරගලය කොළඹ නගරයේ සංවිධානය කරන්නේ ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ නායකත්වයෙන්. එතකොට එතුමාගේ පියා කර්මාන්ත ඇමතිවරයා විධියට, වරාය ඇමතිවරයා විධියට වරාය භාරව ඉන්න කාලයේ එතුමා නොදැනුවත්ව වරාය කම්කරුවන්ගේ ආරක්ෂාව මැද මේ පෙළපාලිය ක්‍රියාත්මක කරලා ශිෂ්‍ය අරගලවලට නායකත්වය දෙනවා. ඒ කාලය තුළම ඉන්දික

ඇමතිතුමාට පුළුවන් වෙනවා, රාජකීය විද්‍යාලයේ සමාජ සේවා සංවිධානයට සම්බන්ධ වෙලා සර්වෝදය ව්‍යාපාරයේ ආරම්භක නායකයෝත් එක්ක කුරුණෑගල කනලුව කියන ගමට ගිහිල්ලා, ඒ ගමේ සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාර සංවිධානය කරලා ලංකාවේ ගැමි මිනිස්සුන්ගේ සමාජ ආර්ථික තත්ත්වයන් නංවන්න පුළුවන් ශ්‍රමදාන ව්‍යාපාර ගොඩ නගමින් තමන්ගේ දේශපාලන ව්‍යාපාරය තවත් මුවහත් කර ගන්න.

එතුමා වැඩිදුර අධ්‍යාපනය හදාරන්න තමයි ජර්මනියට යන්නේ. එවකට ජර්මනිය සමාජවාදී රාජ්‍යයක්. අවුරුදු 600 ක් විතර පරණ, යුරෝපයේ තිබෙන විශිෂ්ටතම විශ්ව විද්‍යාලයක් වන ලයිප් සිග් විශ්ව විද්‍යාලයේ එතුමා කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක් හදාරනවා. අවුරුද්දක් ජර්මන් භාෂාව ඉගෙන ගෙන, අවුරුදු පහක් කෘෂි ආර්ථික විද්‍යාව ඉගෙන ගෙන කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ ගෞරවනීය උපාධිධාරියෙක් විධියට තමයි එතුමා ලංකාවට එන්නේ. එතුමා එතුමාගේ විශ්ව විද්‍යාල ජීවිතයේ එතුමාගේ නිබන්ධය ලියන්නේ රාජ්‍ය ගොවිපලවල ලාභය කියන නිබන්ධය. මාක්ස්වාදී විග්‍රහයන්, ලාභය පිළිබඳ මාක්ස්වාදී විග්‍රහයන් ඇතුළත් කරලා තමයි එතුමා මේ නිබන්ධය ලියන්නේ. ඒ වාගේම එතුමා ජර්මනියේ ලයිප් සිග් විශ්ව විද්‍යාලයේ ඉන්න කාලයේ, විශේෂයෙන්ම ආසියානු කලාපයේ, සමාජවාදී රටවල්වලින් ගිය ශිෂ්‍යයන්ගේ ශිෂ්‍ය සංවිධානයේ සභාපතිවරයා විධියට ඒ වාගේම ලෝක ශිෂ්‍ය සංවිධානයේ ආසියානු නියෝජිතයා විධියට ශිෂ්‍ය නායකයකු විධියට ලයිප් සිග් විශ්ව විද්‍යාලයේ තමන්ගේ කාර්යභාරය ඉෂ්ට කරනවා. ඒ නිසා ශිෂ්‍යයකු විධියට, උගතෙකු විධියට, ශිෂ්‍ය නායකයකු විධියට අත්දැකීම් රාශියක් කර ගෙන, මාක්ස්වාදී ඉගැන්වීම් පිළිබඳව, මාක්ස්වාදී කියවීම පිළිබඳව දැනුම් සම්භාරයක් එකතු කර ගෙන තමයි එතුමා ලංකාවට එන්නේ. එතුමා ලංකාවට ඇවිල්ලා ශ්‍රී ලංකා මහා බැංකුවේ පර්යේෂණ නිලධාරියෙකු විධියට, අගලවත්ත රබර් පර්යේෂණායතනයේ අර්ථශාස්ත්‍රඥයකු විධියට එතුමා රස්සාව කරනවා. 1970 වන කොට එතුමා තමන්ගේ රස්සාවෙන් අයින් වෙලා ඇවිල්ලා තමයි දේශපාලනය කරන්න පටන් ගන්නේ. ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය යටතේ. 1970 සමඟි පෙරමුණ රජය බිහි කරන කාලයේ රට පුරාම ගිහිල්ලා එතුමා දේශපාලන ව්‍යාපාරවලට සම්බන්ධ වෙනවා. එතුමා ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ වෘත්තීය සමිති ව්‍යාපාරයටත් සම්බන්ධ වෙනවා. රාජ්‍ය සංස්ථා සේවක සමිතියේ සභාපතිවරයා සහ ලේකම්වරයා විධියට ලාංකීය වෘත්තීයවේදීන්ගේ විශේෂයෙන්ම කම්කරුවාගේ කම්කරු අයිතිවාසිකම් වෙනුවෙන් විශාල සටන් ව්‍යාපාර රාශියක් මෙහෙයවනවා. විශේෂයෙන් අද වාගේ නොවෙයි. එවකට එතුමා කෝච්චියේ ගිහිල්ලා, බස් එකේ ගිහිල්ලා, වාලච්චියනට, පුත්තලමට, මුලතිව්වලට, අස්ගිරියට, සාලාවට, මොරටුවට, ඇඹිලිපිටියට, මින්නේරියට මේ හැම තැනටම බස් එකේ ගිහිල්ලා වෘත්තීය සටන් පෙරමුණු සංවිධානය කරලා, වෘත්තීය අරගලවලට නායකත්වය දීලා සටන් කරනවා.

එතුමා 1971 දී 71 කැරැල්ල මර්දනය කරන්න කරපු ඉතාම මර්දනකාරී පිළිවෙතට විරුද්ධව සටන් කරපු නායකයකු විධියට තමයි අපට ඔහුව හඳුන්වන්න පුළුවන්කම ලැබෙන්නේ. එතුමා ඉස්සෙල්ලාම තරඟ කරන්නේ 1977 දී. 1977 මැතිවරණයේදී කඩුවෙල ආසනයේ ස්වාධීන අපේක්ෂකයකු විධියට එතුමා තරඟ කරනවා. මට මතකයි මගේ ඉතාම පුංචි කාලයේ, 1977 එතුමාගේ සහෝදරයා අවිස්සාවේල්ල ආසනයට මහජන එක්සත් පෙරමුණෙන් තරඟ කරන කොට ඔහුගේ සහයෝගයට අවිස්සාවේල්ල ආසනයට ඇවිල්ලා මැතිවරණ ව්‍යාපාරය මෙහෙයවනවා. ඉතාම ක්‍රියාකාරී දේශපාලඥයකු විධියට ඔහු මතු වෙන්නේ, 1977 මහා මැතිවරණයට ස්වාධීන අපේක්ෂකයකු විධියට කඩුවෙලට තරඟ කරලා. 1991 පළාත් පාලන මැතිවරණයේදී කඩුවෙල ආසනයේ චන්ද්‍රා ගුණතිලක, ඒ වාගේම කිංස්ලි වික්‍රමරත්න වැනි නායකයෝ එක්ක ඒ පළාත් පාලන ආයතනය චමට දිනා දෙන්න එතුමාගේ නායකත්වය දෙනවා. එතුමාගේ ජයග්‍රාහී මැතිවරණය බවට පත් වෙන්නේ, 1993 පළාත් සභා මැතිවරණය. 1993 පළාත් සභා මැතිවරණයේදී කොළඹ දිස්ත්‍රික්කයට තරඟ කරලා, මනාප ඡන්ද 97,910 ක් අරගෙන කොළඹ දිස්ත්‍රික්කයේ දෙවැනියා වෙලා තමයි එතුමා මේ පළාත් සභාවට එන්නේ. මේ පළාත් සභාවට එන අවධිය වන කොටත් එතුමා කරදර හිරිහැර රාශියකට මුහුණ දීලා, ඒ සියල්ලේ අත්දැකීම් එක්ක තමයි එතුමා පළාත් සභාවට එන්නේ. 1985 නොවැම්බර් මාසේ 21 වැනිදා එතුමාගේ වැඩිමහල් පුත්‍ර රත්නය වුණු දියත් ගුණවර්ධනයන්ගේ උපන් දිනය තිබුණු දවසේ, එවකට ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ නිල හමුදාව විසින් එතුමාව නිවාස අඩස්සියට ගන්නවා. කොළඹ ලොන්ඩන් පෙදෙසේ, පෞද්ගලික ගෙදරක, පෞද්ගලික සිර මැදිරියක මාංචු ආලා, ඇස් බැඳලා අරගෙන ගිහිල්ලා ඉන්දික

[ගරු මහේෂ් අල්මේදා]

ගුණවර්ධන මැතිතුමාව නිවාස අඩස්සියේ තියනවා. එදා අප්‍රිකාවේ ඩෙස්මන් ටුටු බිෂොප්තුමා, ලංකාවේ ලක්ෂ්මන් වික්‍රමසිංහ බිෂොප්තුමා, විජය කුමාරතුංග මැතිතුමන්ලා, ඒ වාගේම එතුමාගේ සහෝදරයා දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඒ අය නීතිඥ කණ්ඩායම් එක්ක කරපු අරගල නිසා තමයි එතුමාට නිදහස දිනා ගන්න හම්බ වෙන්නේ. මේ සියලු කටුක අත්දැකීම් එක්ක තමයි එතුමා 1993 දී පළාත් සභාවට එන්නේ. එතුමා එකම එක අවුරුද්දයි මේ පළාත් සභාවේ ඉන්නේ. මේ පළාත් සභාවේ හිටපු බොහෝ දෙනෙකුට එතුමාත් එක්ක දේශපාලන අත්දැකීම් බෙදා හදා ගන්නට අවස්ථාව නොලැබෙන්නට ඇත්තේ එතුමා අවුරුද්දක් වාගේ ඉතාමත් පුංචි කාලයක් මේ පළාත් සභාවේ හිටියේ. 1994 දී එතුමා පාර්ලිමේන්තු මහා මැතිවරණයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විධියට පත් වෙලා පොදු ජන එක්සත් පෙරමුණු රජයේ ධීවර හා ජලජ සම්පත් අමාත්‍යවරයා විධියට පත් වෙනවා. 1993 පළාත් සභා මන්ත්‍රීවරයා විධියට එතුමා පත් වෙන මුල්ම අවස්ථාවේදී අපටත් වාසනාව ලැබෙනවා, එතුමාගේ පුද්ගලික ලේකම්වරයා විධියට, පළාත් සභා මන්ත්‍රීතුමාගේ පුද්ගලික ලේකම්වරයා විධියට වැඩ කරලා, එතුමාත් එක්ක මේ දේශපාලන අත්දැකීම් බෙදා හදා ගන්න.

1994 දී එතුමා ධීවර හා ජලජ සම්පත් අමාත්‍යවරයා වෙලා විශේෂයෙන් ලාංකීය මිරිදිය කර්මාන්තය සංවර්ධනය කරන්න, ඒ වාගේම ලංකාවේ ධීවර කර්මාන්තයේ තිබෙන පාරම්පරික පන්න ක්‍රම ආරක්ෂා කරන්න, ඒ වාගේම මත්ස්‍ය සම්පත විනාශ කරන, වැරදි පන්න ක්‍රම සියල්ල නීත්‍යානුකූලව තහනම් කරන්න එතුමා ධීවර අමාත්‍යවරයා විධියට කටයුතු කළා. අවුරුදු දෙකක් ධීවර අමාත්‍ය ධුරයේ කටයුතු කරද්දී තමයි එතුමාට නිවාස සහ නාගරික සංවර්ධන අමාත්‍ය ධුරය ලැබෙන්නේ. භෞතික නිර්මාණ සැලසුම් අධිකාරිය නිර්මාණය කරලා, මේ රටේ නගර ඉතාමත් විද්‍යානුකූලව සංවර්ධනය කිරීමේ කාර්යභාරයට එතුමා නායකත්වය දෙනවා. අපේ ගාමිණී තිලකසිරි අමාත්‍යතුමා කිව්වා, මම හිතන්නේ කොළඹ දිස්ත්‍රික්කයේ ජලය නොමැතිව හිටපු අතිමහත් ජනතාවකට පානීය ජලය ලබා දීමේ කටයුත්තට නායකත්වය දෙන්නේ ඉන්දික ගුණවර්ධන මැතිතුමා. එතුමා අමාත්‍යාංශය භාර ගන්න කොට ලංකාවේ ජල සම්බන්ධතා දෙලක්ෂ පනස් දාහයි තිබුණේ. එතුමා අමාත්‍ය ධුරය නැවත භාර දෙන කොට ජල සම්බන්ධතා පන් ලක්ෂයක් ඇති කරලා තමයි එතුමා අමාත්‍යාංශය ආපහු දුන්නේ. 1980 ජූලි වැඩ වර්ජනයට සම්බන්ධ වුණු සියලු දෙනාට නැවත රස්සාව දෙන්න, ඒ අයට වන්දි ගෙවන්න එතුමා කටයුතු කරනු ලැබුවා. ඒ වාගේම වසා දමන්න නියම වෙලා තිබුණු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වාගේ ආයතන බේරා ගන්න එතුමාට පුළුවන්කම ලැබුණා. එතුමා තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යවරයා විධියට, ඒ වාගේම තොරතුරු තාක්ෂණ අමාත්‍යවරයා විධියට කටයුතු කළා. අද තිබෙන තැපැල මේ රටේ පොදු මිනිස්සුන්ගේ අයිතියක් විධියට රැක ගන්න පුළුවන්කම ලැබුණේ ඉන්දික ගුණවර්ධන මැතිතුමා අමාත්‍ය ධුරය දරපු නිසා. එතුමා මේ තැපැල පුද්ගලිකරණය කරන්න ගත් සියලු උත්සාහයන් නතර කරලා දාලා, එය මේ රටේ ජනතාවගේ අයිතියක් බවට තහවුරු කරන්න කටයුතු කළා. ඒ නිසා ඉන්දික ගුණවර්ධන මැතිතුමා ලාංකීය දේශපාලනයේ අමරණීය භූමිකාවක් ඉෂ්ට කරපු කෙනෙක්. ඒ වාගේම ලාංකීය දේශපාලන ක්ෂේත්‍රය තුළ ජනතා වගකීම තේරුම් අරගෙන, ජනතාවට සේවය කරපු කෙනෙක්. ඒ වාගේම ලාංකීය දේශපාලන ඉතිහාසය ගවේෂණය කරන ඕනෑම කෙනෙකුට ගවේෂණය කරන්න ඕනෑ දේශපාලන ඉතිහාසයක්, දේශපාලන චරිතයක් විධියට තමයි අපට ඉන්දික ඇමතිතුමාව හඳුන්වන්නට පුළුවන්කම ලැබෙන්නේ.

විශේෂයෙන්ම ජනවාර්ගික අර්බුදය ක්‍රියාත්මක වුණු හැම වෙලාවකම ජනවර්ගවල සාමය වෙනුවෙන් සටන් කරපු නායකයකු විධියට එතුමා ලංකාවේ දෙමළ ජනතාවගේ ආදරයට පත් වෙලා හිටපු නායකයෙක් කියලත් අපි කියන්නට ඕනෑ. රාජකීය විද්‍යාලයේ ඇතුළේ සිංහල සාහිත්‍ය සංගමයේ එතුමා සභාපති වන කොට දෙමළ ශිෂ්‍යයෝ සියලු දෙනාගේ ඡන්දය එදා ඉන්දික ගුණවර්ධන මැතිතුමාට ලැබුණා. දෙමළ ශිෂ්‍යයින්ගේ ආදරය, රාජකීය විද්‍යාලය ඇතුළේදී එතුමාට දිනා ගන්න පුළුවන්කම ලැබුණා. ඒ නිසා එතුමා වමේ පන්නරය ලබපු, වාම දේශපාලනය තේරුම් අරන් කටයුතු කරපු, වමේ සිද්ධාන්ත මත පිහිටලා, වාම දේශපාලනය මත පිහිටලා, වාම දේශපාලන විසඳුම් ලාංකීය දේශපාලන තලයට ගේන්න උත්සාහ කරපු ඉතාම විශිෂ්ට මානව හිතවාදියෙක් විධියට තමයි අපට සඳහන් කරන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ නිසා ඉන්දික ගුණවර්ධන මැතිතුමා වාගේ දේශපාලඥයෝ ලාංකීය දේශපාලන තලයට නැති වන එක ලාංකීය දේශපාලන තලයේ ගුණාත්මක බව පිරිහෙනවා වාගේම මේ සමාජයේ මිනිස්සුන්ට අද වුවමනා කරන

බොහෝ අයිතිවාසිකම් දිනා ගන්න තිබෙන අවස්ථාවක් නැති වී යාමක් විධියටත් අපි දකිනවා. ඒ නිසා ලංකාවේ පන්ති අරගලය නිවැරදිව විග්‍රහ කර ගෙන, ධනපති පන්තිය විසින් පාගා ගෙන සිටින පීඩිත පන්තියට යම් විමුක්තියක් උදා කරලා දෙන්න වෙහෙසෙන දේශපාලඥයෝ ලංකාවේ හිටියා නම්, එහි අවසාන පුරුක් විධියට තමයි ඉන්දික ගුණවර්ධන මැතිතුමා සඳහන් කරන්න පුළුවන් වෙන්නේ. ඔවුන්ගේ අභාවය මේ රටේ දුක් විඳින මිනිස්සුන්ගේ දැවැන්ත ශෝකාන්තයක් බවට පත් වුණාය කියන කාරණය මතක් කරන ගමන් එවැනි දේශපාලඥයෝ ලාංකීය දේශපාලන තලයට වැඩි වැඩියෙන් වුවමනා කරන කාලයක ඔහුගේ අභාවය මුළු සමස්ත ජනතාවම ලබපු දැවැන්ත පාඩුවක් බව ප්‍රකාශ කරන ගමන් එතුමාට අජරාමර නිවන් සුව අත්වේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

# රීති අංක 30 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 30

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, *"සභාවේ කටයුතු අවසන් වන තෙක් සභාවේ කාලය දීර්ඝ කරන ලෙස"* ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

අපේ හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කිරීමේ යෝජනාව සම්බන්ධයෙන් අද දින මෙම පළාත් සභාවේදී ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් ඇතුළත් නිල වාර්තාවේ පිටපත් පවුලේ ඥාතීන්ට ලබා දෙන ලෙස මේ අවස්ථාවේදී සභා ලේකම්තුමාට දැනුම් දෙනවා. ඇත්තටම අපේ පළාත් සභාව නියෝජනය කරපු පැරණි මන්ත්‍රීවරුන්ගේ අදහස් අපි එතුමන්ලා එක්ක ජනතා නියෝජිතයන් වශයෙන් හිටියේ නැති වුණත්, අපි අහලා තිබෙන විධියට, ඒ වාගේම මේ මන්ත්‍රීවරුන් කරපු ප්‍රකාශත් එක්ක බැලුවාම ඇත්තටම අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් තේරුම් ගියේ අදට පැහැදිලිවම, අද කාලයට අවශ්‍ය වන චරිත තමයි අප අතරින් මේ වෙන් වෙලා ගිහිල්ලා තිබෙන්නේ. මමත් ප්‍රාර්ථනා කරනවා මෙන්න මේ වාගේ චරිතයන් තව තවත් මේ රටට බිහි වේවායි කියලා. මම හදවතින්ම ප්‍රාර්ථනා කරනවා මේ දේශපාලනය නිවැරදි වීම සඳහා. එසේ ප්‍රකාශ කරමින් ඒ ශෝක යෝජනා සඳහා අදහස් දැක්වූ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට අපේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. ඒ වාගේම අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මේ වෙලාවේ මේ වෙනුවෙන් හිටපු සියලු මන්ත්‍රීවරුන්ට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඇත්තටම ඥාතීනුත් ඇවිල්ලා ඉන්නවා. ඥාතීනුත් හිතයි මේ මන්ත්‍රීවරු ටිකට මේ වෙලාවේ ඉන්න බැහැ නේ කියන එක. ගොඩක් වෙලාවට පැරණි දේශපාලඥයෝ පැහැදිලිවම අපි දන්නා පරිදි උදව් කරන කොට හිනාවක්වත් බලාගෙන නොවෙයි උදව් කරන්නේ. ඒ නිසා ඒ පවුලේ අයත් ඒ ගැන පසුතැවෙන එකක් නැහැ. ඒ පිළිබඳවත් මතක් කරනවා. අපි ගරු මන්ත්‍රීවරුන්ට මතක් කරනවා, මේ වාගේ අවස්ථාවල ඉන්නවා නම් හොඳයි කියන එක. මේ නිල වාර්තාවේ පිටපත් ඒ පවුලේ ඥාතීන්ට ලබා දෙන ලෙස ලේකම්තුමාට දන්වා සිටිනවා.

# රීති අංක 30 යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රශ්න
QUESTIONS PRESENTED UNDER RULE NO : 30

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අ. 2016 අප්‍රේල් මස 03 වැනිදා සිට 07 වැනිදා දක්වා කාලය තුළ පිළියන්දල අධ්‍යාපන කලාපයේ ක්‍රීඩා තරඟ පැවැත්වීම සඳහා පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලයීය ක්‍රීඩා පිටිය යොදා ගැනීමට අදාළ නිලධාරීන් පාසලේ පරිපාලනයෙන් ඉල්ලුම් කර තිබේද?

ආ. ඉල්ලුම් කළ දිනය කවදාද?

ඇ. ඒ සඳහා අනුමැතිය ලැබී තිබේද?

ඈ. ලැබී නොමැති නම් එයට හේතු කවරේද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අ. ඔව්.

[ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා]

ආ. 2016 පෙබරවාරි 15

ඇ. ලිඛිතව ලැබී නොමැති අතර - මම දැන් කඩිනමින් විමසුවා. වාචිකව ලැබී තිබෙනවා.

ඈ. අදාළ නැත.

තව මොනවා හරි තිබෙනවා නම් අහන්න පුළුවන්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ කියන්නේ මෙහෙමයි. මේ ප්‍රශ්නය මම නිකම් ඇහුවා නොවෙයි. මේකේ එහෙම ප්‍රශ්නයක් තිබෙනවා. ඒ අදාළ නිලධාරීන් මේක ඉල්ලුවාට මේක ලිඛිතව දීලා නැහැ. ලිඛිතව නොදෙන්න හේතුවක් තිබෙනවා නම්, ගරු අධ්‍යාපන ඇමතිතුමා හැටියට ඔබතුමාගේ වගකීමක් තිබෙනවා අහලා ඇයි ඒ ලිඛිතව දුන්නේ නැත්තේ කියලා මේ සභාවට ඉදිරිපත් කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම ගරු මන්ත්‍රීතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා මේ ප්‍රශ්නය යොමු කිරීම ගැන. දැන් මම කලබලේ මේ ප්‍රශ්නය මගේ නිලධාරීන් ඉක්මනින් යොමු කරලා විමසලා බැලුවා. බැලුවාම මේ ක්‍රීඩා පිටිය ඉල්ලලා තිබෙනවා, කලාප ක්‍රීඩා තරඟාවලිය සඳහා. මගේ දැනීම අනුව. ඉල්ලුම් කරලා තිබෙන දිනය 2016 පෙබරවාරි 15. දැනට ලිඛිතව ඉල්ලලා නැති නිසාවෙන් අපි කලාපයට දැනුම් දුන්නා වහාම ලිඛිතව අප වෙත යොමු කරන්නය කියලා. ඒ අනුව අපි අවශ්‍ය කටයුතු ඉතාම හොඳින් ඉෂ්ට කරලා දෙනවා. ඔබතුමාගේ ඉල්ලීමත් අපි බොහොම අවංකව භාර ගන්නවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මම විශ්වාස කරනවා, ඔබතුමා එහෙම නම් අප්‍රේල් 03 සිට 07 දක්වා ඒ ක්‍රීඩා පිටියේ ක්‍රීඩා තරගය පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු කරයි කියලා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමාටත් ආරාධනා කරනවා, එතැනට එන්නය කියලා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මට ආරාධනා නැතත් කමක් නැහැ. වැඩේ කළොත්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

දෙවැනි ප්‍රශ්නය සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාගේ. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඇසීමට.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සඳහා කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය ඊළඟ රැස්වීමට ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*Question ordered to stand down.*

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මහ ඇමතිතුමා නිසාවෙන් වැදගත්ම අවස්ථාවක් ගිලිහී ගියා. මෙපමණ කැමරා ලැහැස්ති කර ගෙන -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නැහැ. ඔබතුමාට අදාළ නැති කරුණක් මතු කිරීම ගැන මගේ අප්‍රසාදය පළ කරනවා. ඔබතුමාට නොවෙයි ප්‍රශ්නය යොමු කළේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට ලැබුණු අවස්ථාව ගරු මහ ඇමතිතුමා නැති කරලා දැම්මා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නැහැ. මගේ ප්‍රශ්නය යොමු කළේ ඔබතුමාට නොවෙයි. මහ ඇමතිතුමා කිව්වාද, මෙතැනට ඇවිල්ලා ඕක කියන්න කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

කිඳෙල්පිටිය මන්ත්‍රීතුමා දන්නවා මම ඕකට මැදිහත් වුණා කියලා. හැබැයි, අපේ ගරු ඇමතිතුමා කියනවා වාගේ ඕනෑ නම් අපට මොනවා හරි කියන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම මෙපමණ කල් හිතාගෙන හිටියේ - දැන් පෙනෙනවා ඔබතුමන්ලා දෙදෙනා අතර අධ්‍යාපනය අරෙහේ මෙහේ සම්බන්ධයෙන් පොඩි මතභේදයක් තිබෙනවාය කියන එක බොරුවක්. ඒවා ඉවරයි. මම හිතන්නේ -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අපි ඉතාම හොඳින්. මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. අපි දැන් එතුමාගේ ප්‍රශ්නයට උත්තර දෙනවා නේ? උත්තර මහ ඇමතිතුමා දුන්නාම එතුමාගේ කථාවයි ඒ මුහුණු ටිකයි සිරසේ දානවා. මහ ඇමතිතුමාව දාන්නේ නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම හිතුවේ නැහැ මෙපමණ ප්‍රශ්නයක් තිබෙනවාය කියලා. ඔබතුමාව මම ගිය සුමානේ ටීවී එකේ දාලා දෙන්න හැදුවා. මරික්කාර් මන්ත්‍රීතුමාට හයේ ඔබතුමා ආවේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දැන් කැබිනට් මණ්ඩලය ඔක්කොම හරි. ප්‍රශ්නයක් නැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම වගකීමක් දරන ඇමතිවරයෙක්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මටත් පේනවා. අපටත් හොඳයි ඒක. එහෙම නම් කමක් නැහැ. දැන්වත් අධ්‍යාපනයේ ප්‍රශ්න ටික විසඳෙයි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම විහිළු කළාට වගකීමෙන් තොර වෙන්නේ නැහැ. මම කැමැති නැහැ, එහෙම තැන් තැන්වල වාඩි වෙන්න.

# කල් තැබීම
## ADJOURNMENT

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

දැන් මම මෙම සභාව කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 01.38 ට, 2016 මාර්තු මස 08 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

*Accordingly, the Provincial Council was adjourned at 01.38 p.m till 09.30 a.m, on 08.03.2016*